# HSBC ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා පොදු නීතිරීති සහ කොන්දේසි

Should you require a translated copy of this document in Sinhala or Tamil languages, please visit www.hsbc.lk or request it from any one of our branches.

මෙම ලේඛනයේ ඉංග්‍රිසි හෝ දමිළ භාෂා පරිවර්තනයක පිටපතක් ඔබට අවශ්‍ය වේ නම්, කරුණාකර අපගේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk වෙත පිවිසෙන්න, නැතිනම් අපගේ ඕනෑම ශාඛාවකින් ඉල්ලා සිටින්න.

இந்த ஆவணத்தின் ஆங்கில மற்றும் சிங்கள மொழிபெயர்ப்பு தேவைப்படின் தயவுசெய்து www.hsbc.lk என்ற எமது இணையத்தளத்தை நாடவும் அல்லது எமது கிளை ஒன்றில் கேட்டுப் பெறவும.

## ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම

සැලකිය යුතුයි! ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්, ශ්‍රී ලංකා ශාඛාව විසින් නිකුත් කරන ලද ක්‍රෙඩිට් කාඩ්පත ඔබ විසින් භාවිත කිරීමට පෙරාතුව, කරුණාකර ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වූ මෙම ගිවිසුම සම්පූර්ණයෙන්ම කියවන්න. ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පතට සම්බන්ධකර ඇති වෙනත් යම් HSBC ගිණුම් ඔබ සතුව පවතී නම්, කරුණාකර එහි ඇති අදාළ නීතිරීති සහ කොන්දේසි ද අදාළ කරගන්න.

ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පවතින අවසරලත් වාණිජ බැංකුවකි.

ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් (මින් මතුවට 'HSBC' බැංකුව' 'අප' 'අපගේ' යනුවෙන් හැඳින්වෙන අතර, සන්දර්භයෙන් ඉඩ සැලසෙන හෝ අවශ්‍ය වනවිට එම යෙදුමෙන් එහි අනුප්‍රාප්තිකයන් සහ ලැබුම්කරුවන් ද ඇතුළත් වේ) බැංකුකරණ, ආයෝජන, මූල්‍ය හා වෙනත් ගනුදෙනු සහ විවිධාකාර ස්වාභාවයේ ගනුදෙනු සිදුකිරීමේ කාර්යය සඳහා සහ, HSBC වෙතින් සහ/හෝ HSBC සමූහයෙහි සාමාජිකයින් වෙතින් සේවාවන්, සැලසුම්, තොරතුරු, භාණ්ඩ, ප්‍රතිලාභ සහ වරප්‍රසාද ලබාගැනීමට HSBC වෙත උපදෙස් ලබාදීමට හා සන්නිවේදනය කිරීමට කාඩ්පත් හිමියා/හිමියන්ට (මින් මතුවට 'කාඩ්පත් හිමියා/හිමියන්', 'ඔබ', 'ඔබගේ', 'ඔබේ' යනුවෙන් හැඳින්වෙනු ඇති අතර, එම යෙදුමෙන් සන්දර්භයෙන් ඉඩ සැලසෙන හෝ අවශ්‍ය වනවිට ඔහුගේ උරුමකරුවන් /උරුමකාරියන්, අද්මිනිස්ත්‍රාසිකරුවන්, පොල්මංකරුවන් සහ නීත්‍යානුකූල නියෝජිතයන් ද අදහස් වන අතර, ඇතුළත් වේ) හැකිවනු පිණිස මෙම නීතිරීති හා කොන්දේසි වලට යටත් ව කලින් කලට බැංකු සේවාවන්, පහසුකම් සහ තොරතුරු සපයනු ඇත.

මෙම නීතිරීති (මින් මතුවට දක්වා ඇත) මගින් කාඩ්පත් හිමියා/හිමියන් විසින් භාවිත කරනු ලබන හෝ අප වෙතින් ඉල්ලා සිටින හෝ අප විසින් කාඩ්පත් හිමියා/හිමියන් ට සපයනු ලබන හෝ බැංකු සේවාවන්, පහසුකම් සහ තොරතුරු වලට අදාළව කාඩ්පත් හිමියා/හිමියන්ගේ වගකීම් සහ බැඳීම් පැහැදිලි කෙරේ.

ඉහත කී 'HSBC' සහ 'කාඩ්පත් හිමියා/හිමියන්' මින් මතුවට සමහර අවස්ථාවන් හි දී ඒකාබද්ධ ලෙස මෙම ගිවිසුමෙහි 'පාර්ශ්වකරුවන්' (මින් මතු අර්ථ දක්වා ඇති) ලෙස ද තනි තනි වශයෙන් මෙම ගිවිසුමෙහි 'පාර්ශ්වය' ලෙස ද හැඳින්වෙනු ඇත.

කාඩ්පත (මින් මතු අර්ථ දක්වා ඇති), බැංකුවේ දේපලක් වන අතර, බැංකුව විසින් ඉල්ලා සිටින විට කාඩ්පත් හිමියා/හිමියන් විසින් වහාම එය බැංකුව වෙත ආපසු ලබාදෙනු ඇත.

කාඩ්පත සහ කාඩ්පත භාවිත කිරීමට කාඩ්පත් හිමියා/හිමියන් හට ඇති අයිතිය ඕනෑම අවස්ථාවක දී පූර්ව දැනුම්දීමකින් යුතුව බැංකුව විසින් ආපසු ලබාගනු ඇති අතර, මෙම ගිවිසුමෙහි අන්තර්ගත විධිවිධානයන්ට යටත් ව, ඕනෑම කාඩ්පත් ගනුදෙනුවක් සම්බන්ධයෙන් ඉල්ලා සිටින අවසරය ප්‍රතික්ෂේප කිරීම ද සිදුකළ හැකිය.



PUBLIC

## 1. අර්ථනිරූපණ

මෙම නීතිරීති හා කොන්දේසිවල තද පැහැති ලොකු අකුරෙන් දක්වා ඇති යෙදුම් සඳහා, සන්දර්භය විසින් වෙනත් ආකාරයකින් අවශ්‍ය නොකෙරෙන්නේ නම්, පහත දැක්වෙන අර්ථ පවතිනු ඇතː

**'ගිවිසුම'** යන්නෙන් අදහස් වන්නේ, මෙම ගිවිසුමෙහි කොටසක් බවට පත්වනු ඇති කලින් කලට පළ කෙරෙන සේවාවන් (මින් මතු අර්ථ දක්වා ඇති) සැපයීම සඳහා වන යම් අතිරේක නීතිරීති සහ කොන්දේසි ද ඇතුළත්ව, කලින් කලට මෙම ගිවිසුමේ නීතිරීති වලට අනුකූලව සංශෝධනය කෙරෙන මෙම නීතිරීති ය.

මෙම නියමයන් ඇතුළත්, **කාඩ්පත/කාඩ්පත්**, යන වචනය බැංකුව විසින් නිකුත් කරන ලද පහත සඳහන් ක්‍රෙඩිට් කාඩ්පත් හෝ ඒවායෙහි යම් එකතුවක් සම්බන්ධයෙන් අදාළ වන්නේය. එම කාඩ්පත් වනුයේː Visa Gold, Visa Platinum, Visa Platinum Cashback, Visa Signature, HSBC Visa Advance සහ Visa Premier MasterCard හෝ බැංකුව විසින් කලින් කලට හඳුන්වා දෙනු ඇති වෙනත් ඕනෑම වර්ගයක ක්‍රෙඩිට් කාඩ්පත් වේ. මෙම කාඩ්පත් භාවිත කිරීම මඟින් පහත සඳහන් නීතිරීති ඔබ විසින් පිළිගනු ලබන අතර, ඒවා මඟින් බැඳී සිටීම ද සිදුවන්නේය.

**'බලධාරීන්'** යන්නෙන් HSBC සමූහයේ යම් කොටසක් මත අධිකරණ බලය පවතින යම් අධිකරණ, පරිපාලන, හෝ නියාමන ආයතනයක්, යම් රාජ්‍ය හෝ පොදු හෝ රජයේ නියෝජිත ආයතනයක් උපකාරී ආයතනයක් හෝ අධිකාරියක්, යම් බදු අධිකාරියක්, සුරැකුම් හෝ වස්තු හුවමාරු, අධිකරණ, මහ බැංකු හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් හෝ එහි නියෝජිතයෙකු අදහස් වේ.

**'බැංකු දිනය'/'සාමාන්‍ය බැංකු වේලාවන්' සහ 'වැඩකරන දින/පැය'** යන්නෙන් අදහස් වන්නේ අප විසින් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් බැංකුකරණ/වැඩකරන දින සහ සාමාන්‍ය බැංකුකරණ/වැඩකරන පැය වේ.

**'අනුකූලතා බැඳීම'** යන්නෙන් (a) අදාළ යම් දේශීය හෝ විදේශීය නීතියක්, රෙගුලාසියක්, ආඥා පනතක්, රීතියක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක්, ස්වේච්ඡා ආචාරධර්ම පද්ධතියක්, නියමයක්, අනුමැති රෙජීමයක්, අධිකරණ තීන්දුවක්, HSBC සමූහයේ යම් සාමාජිකයෙකු හා යම් අධිකාරියක් අතර ඇති ගිවිසුමක්, හෝ HSBC හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකුට අදාළ වන බලධාරීන් අතර පවතින යම් ගිවිසුමක් හෝ සම්මුතියක් ('**නීති**'), හෝ ජාත්‍යන්තර මඟපෙන්වුමක් හා අභ්‍යන්තර ප්‍රතිපත්ති හෝ කාර්යපටිපාටි, (b) අධිකාරීන්

වෙතින් ලැබෙන යම් (වලංගු) ඉල්ලීමක් හෝ වාර්තා කිරීමේ, නියාමන වෙළඳ වාර්තා කිරීමේ, හෙළිදරව් කිරීමේ හෝ නීති යටතේ පවතින වෙනත් යම් බැඳීමක් සහ (c) අපගේ කාඩ්පත් හිමියන්ගේ අනන්‍යතාව තහවුරු කරගැනීම සඳහා HSBC වෙත නියම කෙරෙන නීති වලට අනුකූලව ක්‍රියා කිරීමට HSBC සමූහයේ යම් සාමාජිකයෙකුගේ බැඳීමකි.

**'රහස්‍ය තොරතුරු'** යන්නෙන් හෙළිදරව් කරන අවස්ථාවේ දී රහස්‍ය ලෙස කාඩ්පත් හිමියෙකු විසින් නියම කර ඇති හෝ සාධාරණ පුද්ගලයෙකු විසින් රහස්‍ය, පොදු නොවන හෝ ස්වාභාවයෙන් හිමිකාරිත්වයක් සහිත ලෙසට සලකනු ඇති යම් තොරතුරක් අදහස් වේ.

**'සම්බන්ධිත තැනැත්තෙකු'** යන්නෙන් කාඩ්පත් හිමියෙකු විසින් හෝ වෙනුවෙන් යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් HSBC සමූහයේ සාමාජිකයෙකු වෙත තොරතුරු (පෞද්ගලික දත්ත හෝ බදු තොරතුරු ඇතුළුව) සපයන්නේ ද නැතහොත් සේවාවන්ගේ ප්‍රතිපාදන හා සම්බන්ධයෙන් වෙනත් යම් ආකාරයකින් HSBC සමූහයේ සාමාජිකයෙකු වෙත තොරතුරු ලැබෙන්නේ ද ඒ තැනැත්තා හෝ ආයතනය අදහස් වේ.  කාඩ්පත් හිමියා සම්බන්ධයෙන් **සම්බන්ධිත තැනැත්තා** යන්නට යම් කාඩ්පත් හිමියකුගේ) ඇපකරුවෙකු, සමාගමක අධ්‍යක්ෂවරයෙකු හෝ නිලධාරියෙකු, හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෙකු හෝ සාමාජිකයෙකු, යම් 'ප්‍රාමාණාත්මක හිමිකරුවෙකු', 'පාලක පුද්ගලයෙකු' හෝ අර්ථලාභී හිමිකරුවෙකු, භාරයක යම් භාරකරුවෙකු, දායකයෙකු හෝ ආරක්ෂකයෙකු, යම් නියම කළ ගිණුමක ගිණුම් හිමියෙකු, යම් නියම කළ ගෙවීමක ගෙවීම් ලබන්නෙකු, කාඩ්පත් හිමියා නියෝජනය කරන්නෙකු, නියෝජිතයෙකු හෝ නාමිකයෙකු හෝ, HSBC සමූහය සමග පවතින සිය බැංකු සබඳතාවකට අදාළ වන කාඩ්පත් හිමියකු හා සම්බන්ධයක් පවතින වෙනත් යම් පුද්ගලයෙකු හෝ ආයතනයක් ඇතුළත් විය හැකි නමුත්, ඊට සීමා නොවේ.

**'පාලක පුද්ගලයන්'** (සාමාන්‍යයෙන්) යන්නෙන් යම් ආයතනයක් මත පාලනය පවත්වාගෙන යන තනි පුද්ගලයන් (භාරයක් සම්බන්ධයෙන් නම් මෙම තැනැත්තන් වන්නේ දායකයා, භාරකරුවන්, ආරක්ෂකයා, අර්ථලාභීන් හෝ අර්ථලාභී කාණ්ඩය සහ භාරය මත අවසාන සඵල පාලනය ක්‍රියාත්මක කරන වෙනත් යම් පුද්ගලයෙකු ඇතුළත් වන අතර, භාරයක් හැර වෙනත් යම් නෛතික ආයතනයක් සම්බන්ධයෙන් ඊට සමාන තනතුරු හෝ පාලනය දරන පුද්ගලයන්) අදහස් වේ.

**'කාඩ්පත් හිමියාගේ තොරතුරු'** යන්නෙන් පුද්ගලික දත්ත, රහස්‍ය තොරතුරු සහ/හෝ කාඩ්පත් හිමියාගේ හෝ සම්බන්ධිත තැනැත්තෙකුගේ බදු තොරතුරු (ඊට අදාළ ප්‍රකාශන, අතහැරීම් හා කැමැත්ත පළකිරීම් ද ඇතුළත්ව) අදහස් වේ.

**'මූල්‍ය අපරාධ'** යන්නෙන් මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම, අල්ලස්, දූෂණ, බදු මගහැරීම්, වංචා, ආර්ථික හෝ වෙළඳ සම්බාධක මගහැරීම් සහ/හෝ මෙම කාරණාවලට අදාළව ඇති යම් නීති හෝ රෙගුලාසි කඩකිරීම් හෝ මගහැරීමට හෝ කඩකිරීමට උත්සාහ කිරීම් අදහස් වේ.

**'HSBC' "බැංකුව", "අප", "අපි", "අපගේ"** යන්නෙන් හොංකොං එස්ඒආර් හි නීති යටතේ නිසි ලෙස සංස්ථාපනය කරන ලද බැංකු සංස්ථාවක් වන, හොංකොං හි ක්වීන්ස් පාර සෙන්ට්‍රල් හි අංක 01 දරන ස්ථානයේ සිය ලියාපදිංචි ලිපිනය ඇති සහ ඉහත කී ජනරජයෙහි කොළඹ 02, යූනියන් පෙදෙස, අංක 163 දරන ස්ථානයේ සිය ශාඛා කාර්යාලයෙහි හෝ ශ්‍රී ලංකා ජනරජයේ වෙනත් ස්ථානයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන, **ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ්** අදහස් වේ.

**'HSBC සමූහය'** යන්නෙන් අදහස් වන්නේ HSBC හෝල්ඩිංස් පීඑල්සී සහ/හෝ එහි යම් සාමාජික ආයතනයක්, උප සමාගමක් සම්බන්ධිත ආයතනයක් සහ ඒවායෙහි යම් ශාඛාවක් හා කාර්යාලයක් වන අතර, **'HSBC සමූහයේ යම් සාමාජිකයෙකු'** යන්න ද එම අදහස ම දරනු ඇත.

**'උපදෙස'** යන්නෙන් අදහස් වන්නේ කාඩ්පත් හිමියා/හිමියන් වෙතින් ලිඛිතව හෝ බැංකුවට පිළිගත හැකි ආරක්ෂිත ඩිජිටල් සහ/හෝ ඉලෙක්ට්‍රොනික නාලිකා හරහා HSBC වෙත නිසි පරිදි ලැබෙන නිසි බලයලත් ඉල්ලීමක් හෝ වෙනත් උපදෙසක් ය.

**'ආයතනය'** යන්නෙන් අදහස් වන්නේ අදාළ පරිදි සාමූහිකව හෝ තනිව මෙම ගිවිසුමේ අරමුණු සඳහා ආයතනයක් ලෙස සැලකිය යුතු බවට කාඩ්පත් හිමියා/හිමියන් විසින් HSBC වෙත දැනුම් දී ඇති ඕනෑම තෙවන පාර්ශ්වයක මූල්‍ය ආයතනයකි.

**'තොරතුරු'** යන්නෙන් අදහස් වන්නේ අප විසින් හෝ යම් තොරතුරු සපයන්නෙකු විසින් හෝ කාඩ්පත් හිමියන් වෙත සපයන ලද සහ ලැබෙන්නට සලස්වන ලද මූල්‍ය, වෙළෙඳපොළ හෝ වෙනත් තොරතුරු සහ දත්ත ය.

**'හානිය'** යන්නෙන් කවර ආකාරයකින් හෝ ගණනය කෙරෙන හෝ සිදුවන යම් අයැදීමක්, අයකිරීමක්, පිරිවැයක් (නීතිමය හෝ වෙනත් වෘත්තීමය ගාස්තු ද ඇතුළත් ව නමුත්, ඊට සීමා නොවී) හානියක්, ණයක්, වියදමක්, බදු මුදලක්, වගකීමක්, බැඳීමක්, චෝදනාවක්, නඩුවක්, නඩුකරයක්, ඉල්ලීමක්, නඩු නිමිත්තක්, නඩු කටයුත්තක් හෝ නඩු තීන්දුවක්, එය සෘජු හෝ වක්‍ර, ආනුෂංගික, දණ්ඩනීය හෝ අවස්ථානුකූල වුවද, අදහස් වේ.

**'මුරපදය'** යන්නෙන් අදහස් වන්නේ බැංකුව විසින් කාඩ්පත් හිමියන් වෙත නිකුත් කර ඇති ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පතක් (ATM), ඩෙබිට් කාඩ්පතක් සහ ක්‍රෙඩිට් කාඩ්පතක් ද ඇතුළත් ව ඊට සීමා නොවී, උපයෝගී කරගනිමින්, උපදෙස්වලට ප්‍රවේශවීමට හෝ ක්‍රියාත්මක කරවීම සඳහා හෝ දුරකථන බැංකුකරණය, PIB හරහා ගනුදෙනු සිදුකිරීමට සැකසූ රහසිගත වචනයක්, යෙදුමක්, අක්ෂර හා ඉලක්කම්වලින් සමන්විත අංකයක් වේ.

**'පෞද්ගලික දත්ත'** යන්නෙන් යම් තැනැත්තෙකුට (සහ දත්ත පෞද්ගලිකත්ව නීති වාණිජ ආයතනවලට ද අදාළ වන රටවල වාණිජ ආයතනවලට) අදාළ වන එම තැනැත්තා හඳුනාගැනීමට හැකිවන ආකාරයේ, සංවේදී පෞද්ගලික දත්ත, නම(නම්), නේවාසික ලිපිනය(ලිපින), ඇමතුම් තොරතුරු, වයස, උපන් දිනය, උපන් ස්ථානය, ජාතිකත්වය, පුරවැසි භාවය පෞද්ගලික හා වෛවාහික තත්ත්වය ද ඇතුළත්ව, ඊට සීමා නොවී, ඕනෑම දත්තයක් අදහස් වේ.

**'පෞද්ගලික අන්තර්ජාල බැංකුකරණය' (PIB)** යන්නෙන් අදහස් වන්නේ, HSBC හි කාඩ්පත් හිමියන්ට උපදෙස් වෙත ප්‍රවේශවීමට හෝ ක්‍රියාත්මක කරවීමට හෝ ගනුදෙනු සිදුකිරීමට HSBC හි නිල පොදු වෙබ්අඩවිය හරහා ලබාගත හැකි ජාල මාර්ගයකි.

**'සේවාවන්'** යන්නෙන්, (අ) කාඩ්පත් හිමියාගේ බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වසා දැමීම, (ආ) ණය පහසුකම් හා වෙනත් බැංකු සැලසුම් හා සේවාවන් කාඩ්පත් හිමියාට සැපයීම (උදාහරණ ලෙස, වස්තුභාර ගනුදෙනු, ආයෝජන උපදෙස්, අතරමැදි සේවා, නියෝජිත සේවා, භාරකාරත්ව, නිෂ්කාශන හෝ තාක්ෂණය ලබාගැනීමේ සේවාවන් ද ඇතුළත් ව), අයදුම්පත් සැකසුම, අතිරේක ණය තක්සේරු හා සැලසුම් සඳහා යෝග්‍යතා තක්සේරු, සහ (ඇ) මූල්‍ය සේවා හෝ ඊට සම්බන්ධ සැලසුම් කාඩ්පත් හිමියා වෙත අලෙවිකරණය හෝ ප්‍රවර්ධනය, අලෙවි සමීක්ෂණ, රක්ෂණය, විගණනය හා පරිපාලන අරමුණු ද ඇතුළත්ව කාඩ්පත් හිමියා සමග HSBC හි සමස්ත සම්බන්ධතාව පවත්වාගෙන යාම, ඊට සීමා නොවී, අදහස් වේ.

**'ප්‍රකාශනය'** යන්නෙන් අදහස් වන්නේ HSBC විසින් කාඩ්පත් හිමියෙකුට, දෙන ලද යම් කාලසීමාවක් තුළ ගිණුම හරහා සිදුකරන ලද ගනුදෙනු පිළිබඳව සහ එම ගිණුමේ ශේෂය සඳහන් කරමින් යවනු ලබන වාර ප්‍රකාශනයකි. HSBC බැංකුව විසින් ඇතුළත් කිරීම සුදුසු යැයි සලකන වෙනත් තොරතුරු ද එහි ඇතුළත් විය හැකිය.

**'ප්‍රාමාණික හිමිකරුවන්'** යන්නෙන් අදහස් වන්නේ යම් ආයතනයක ලාභයෙන් 10%ක ට වඩා හිමිකම් දරන හෝ ඍජුව හෝ වක්‍ර ව 10%ක ට වඩා අයිතිය ලබන තැනැත්තෙකු වේ.

**'බදු අධිකාරීන්'** යන්නෙන් අදහස් වන්නේ දේශීය හෝ විදේශීය බදු, ආදායම්, ෆිස්කල් හෝ මුදල් අධිකාරීන් ය.

**'බදු තොරතුරු'** යන්නෙන් කාඩ්පත් හිමියෙකුගේ (එම කාඩ්පත් හිමියා පුද්ගලයෙකු හෝ ලාභ නොලබන හෝ වෙනත් වාණිජ ආයතනයක් වන ව්‍යාපාරයක් වුවද, ඒ බව නොසලකා) සහ සාධාරණව ක්‍රියාකිරීමේ දී යම් බදු අධිකාරියක් වෙත ඇති යම් HSBC සමූහ සාමාජිකයෙකුගේ බැඳීම්වලට අනුකූලව ක්‍රියාකිරීම අවශ්‍ය යැයි HSBC විසින් සලකනු ලබන යම් හිමිකරුවෙකු, 'පාලක පුද්ගලයෙකු' 'ප්‍රාමාණික හිමිකරුවෙකු' හෝ කාඩ්පත් හිමියෙකුගේ අර්ථලාභී හිමිකරුවෙකු ගේ බදු තත්ත්වයට ඍජුව හෝ වක්‍රව අදාළ වන යම් ලේඛනයක් හෝ තොරතුරක් (ඊට අදාළ ප්‍රකාශන, අතහැරීම් හා කැමැත්ත පළකිරීම් ද ඇතුළත්ව) අදහස් වේ. **'බදු තොරතුර'** යන්නට බදු නේවාසිකත්වය සහ/හෝ ආයතනයේ ස්ථානය (අදාළ පරිදි), බදු වාසය, බදු හඳුනාගැනීමේ අංකය, බදු සහතික කිරීමේ ආකෘතිපත්‍ර, {නම (නම්), නේවාසික ලිපිනය (ලිපින), වයස, උපන් දිනය, උපන් ස්ථානය, ජාතිකත්වය හා පුරවැසි භාවය ද ඇතුළත් ව} ආදී පෞද්ගලික දත්ත පිළිබඳ තොරතුරු ද ඇතුළත් වන නමුත් ඊට සීමා නොවේ.

**'බදු සහතික කිරීමේ ආකෘතිපත්‍ර'** යන්නෙන් ගිණුම් හිමියෙකුගේ හෝ ආයතනයක සම්බන්ධිත පුද්ගලයෙකුගේ බදු තත්ත්වය තහවුරු කිරීම සඳහා බදු අධිකාරියක් හෝ HSBC විසින් කලින් කලට නිකුත් කරන හෝ නියම කරන ඕනෑම ආකෘති පත්‍රයක් හෝ ලේඛනයක් අදහස් වේ.

**'නීතිරීති'** යන්නෙන් අදහස් වන්නේ මෙම ගිවිසුම පාලනය වන නීතිරීති සහ කොන්දේසි, යම් මුක්තිප්‍රකාශ, අන්තර්ජාල පෞද්ගලිකත්වය පිළිබඳ ප්‍රකාශනය/ප්‍රකාශන, මගපෙන්වුම් වන අතර, එයට, කලින් කලට සංශෝධනය කෙරෙන පරිදි අප විසින් කාඩ්පත් හිමියන් වෙත දැනුම්දෙන යම් අතිරේක නීතිරීති ද ඇතුළත් වන අතර, ඊට සීමා නොවේ.

**'ගනුදෙනුව/ගනුදෙනු'** යන්නෙන් අදහස් වන්නේ කාඩ්පත් හිමියකු විසින් ලිඛිතව හෝ කාඩ්පතක්/කාඩ්පත් මඟින් කාඩ්පතක්/කාඩ්පත් සම්බන්ධයෙන් (මුදල් අත්තිකාරම්, අලෙවි ආයතනයන් හි දී සිදුකරන ගෙවීම්, මුදල්/චෙක්පත් තැන්පතු ආදිය උදාහරණ වේ) අවසරලත් ක්‍රියාවක් සිදුකිරීමට HSBC වෙත ලබාදෙන අවසරලත් ඕනෑම උපදෙසකි.

පහත සඳහන් නීතිරීති සහ කොන්දේසි මත බැංකුව විසින් කාඩ්පත/කාඩ්පත් නිකුත් කරනු ලැබේ:

**අර්ථදැක්වීම**

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම්, හෝ වෙනත් ආකාරයකින් විශේෂයෙන් සඳහන් කර ඇත්නම් මිසඃ

(a) පහසුව සඳහා පමණක්, ශීර්ෂ පාඨයන් ඇතුළත්කර ඇති අතර, කාඩ්පත් හිමියන් සඳහා වන මෙම ගිවිසුමේ ව්‍යුහයට ඉන් බලපෑමක් නොවන්නේ ය;

(b) "ඇතුළත්ව" යන වචනය සහ ඊට සමාන වචනවලින් කිසිදු සීමාකිරීමක් අදහස් නොවේ;

(c) කාඩ්පත් හිමියා යන යෙදුමෙන් යම් අතිරේක කාඩ්පත් හිමියන් අදහස් වන සහ ඇතුළත් වන අතර, කාඩ්පත යන යෙදුමෙන් යම් අතිරේක කාඩ්පත් ද අදහස්වීම සහ ඇතුළත්වීම සිදුවේ;

(d) ඒකවචනය පමණක් හැඟවෙන වචනවලින් බහුවචනය ද බහුවචනය පමණක් හැඟවෙන වචන සඳහා ඒකවචන ද පුරුෂලිංග හැඟවෙන වචනවලින් ස්ත්‍රීලිංග වචන ද ස්ත්‍රීලිංග වචනවලින් පුරුෂලිංග වචන ද ඇතුළත් වන්නේ ය;

(e) මෙම ගිවිසුමේ අර්ථනිරූපණයක් සහිත එක හා සමාන වචන හෝ පද සඳහා එම අර්ථනිරූපණයට අදාළ අර්ථයන් තිබිය යුතුය;

(f) මෙම ගිවිසුමේ වගන්ති හෝ වෙනත් හැඳින්වීම් පිළිබඳව සඳහන් කිරීමේ දී; මෙම කාඩ්පත සක්‍රිය කරන අවස්ථාවේ දී මෙම කාඩ්පත් ගිවිසුමේ සඳහන් සහ අන්තර්ගත සියලු නීතිරීති සහ කොන්දේසි සඳහා කාඩ්පත් හිමියා මෙයින් එකඟ වන බවට සලකනු ලබන බවට පාර්ශ්ව දෙක විසින් ම සහ පාර්ශ්ව දෙක අතර මෙයින් ගිවිසා ගනු ලැබේ.

## 2. කාඩ්පත භාරදීම සහ භාවිතය මෙන්ම පුද්ගල හඳුනාගැනීමේ අංකය

2.1 කාඩ්පත ලැබුණු වහාම කාඩ්පත් හිමියා විසින් කාඩ්පතේ පිටුපසෙහි අත්සන් කළ යුතු අතර, කාඩ්පත භාවිත කිරීම සඳහා වෙනත් කිසිදු තැනැත්තකුට අවසර ලබා නොදිය යුතු මෙන්ම කාඩ්පත නිතරම ආරක්ෂා කරමින් කාඩ්පත් හිමියාගේ පුද්ගලික පාලනය යටතේ තබාගත යුතුය.

2.2 කාඩ්පත් හිමියාට සහ අතිරේක කාඩ්පත් හිමියා (කාඩ්පත් හිමියන්) වෙත සියලු කාඩ්පත් කුරියර් සේවය මඟින් යවනු ලැබිය යුතුය. කාඩ්පත් හිමියාට සහ අතිරේක කාඩ්පත් හිමියාට කාඩ්පත/කාඩ්පත් ලැබීමේ දී, ඔහු/ඇය විසින් වහාම කාඩ්පත ලැබීම පිළිබඳව දැනුම් දිය යුතු අතර, ඔහුගේ/ඇයගේ අනන්‍යතාවය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. කාඩ්පත් හිමියා විසින් ස්වකීය අභිමතය පරිදි ඔහු/ඇය වෙනුවෙන් කාඩ්පත/කාඩ්පත් භාරගැනීමට හෝ ලබාගැනීමට යම් තුන්වන පාර්ශ්වයකට ලිඛිතව බලය දිය හැකි අතර, කාඩ්පත් හිමියා හෝ ඔහු/ඇය විසින් තමා වෙනුවෙන් බලය පැවරූ තැනැත්තා විසින් කාඩ්පත භාරගන්නා අවස්ථාවේ දී කාඩ්පත සම්බන්ධයෙන් උපචිත වූ සියලු ගාස්තු සඳහා වගකිව යුතුය.

බැංකුවේ/එහි නියෝජිතයාගේ අදහස අනුව කාඩ්පත් හිමියාගේ නියෝජිතයා බවට පෙනී යන යම් තුන්වන පාර්ශ්වයකට බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි කාඩ්පත භාරදීම සහ ලබාදීම කරනු ලැබිය හැකිය. ඉහත සඳහන් ආකාරයට එසේ යම් නියෝජිතයකුට කාඩ්පත භාරදෙනු ලබන අවස්ථාවේ සිට සිදුවන සියලු ගාස්තු සඳහා කාඩ්පත් හිමියා වගකියනු ලැබිය යුතුය.

2.3 කාඩ්පත් හිමියාගේ ඉල්ලීමට අනුව:

(a) කාඩ්පතෙහි පුද්ගල හඳුනාගැනීමේ අංකය ("PIN") සාමාන්‍ය තැපෑලෙන් කාඩ්පත් හිමියා වෙත යවනු ලැබේ. එම PIN අංකය තැපැල් කරනු ලැබීමෙන් පසුව පැය හැත්තෑ-දෙකක කාලයක් ඇතුළත එය කාඩ්පත් හිමියාට ලැබී, භාරගෙන ඇති බවට සලකනු ලැබේ. PIN අංකය ලැබුණු පසුව, එය කාඩ්පත් හිමියාගේ දේපළක් වන අතර, PIN අංකය ආරක්ෂිතව ඇති බවට සහ කිසිම ආකාරයකින් හෝ මාර්ගයකින් එය වෙන අයෙකු අතට පත් නොවන බවට සහතිකවීම සඳහා කාඩ්පත් හිමියා විසින් සියලු පියවර ගනු ලැබිය යුතුය; හෝ

(b) කාඩ්පතෙහි පුද්ගල හඳුනාගැනීමේ අංකය ("PIN") බැංකුව සතුව පවතින ලියාපදිංචි ජංගම දුරකථන අංකය වෙත කෙටි පණිවුඩයක් (SMS) හරහා කාඩ්පත් හිමියා වෙත යවනු ලැබේ. එම PIN අංකය එසේ යැවීමෙන් පසුව, එය කාඩ්පත් හිමියාට ලැබී ඇති බවට සලකනු ලැබේ. PIN අංකය යනු, කාඩ්පත් හිමියාගේ දේපළක් වන අතර, PIN අංකය ආරක්ෂිතව ඇති බවට සහ කිසිම ආකාරයකින් හෝ මාර්ගයකින් එය වෙන අයෙකු අතට පත් නොවන බවට සහතිකවීම සඳහා කාඩ්පත් හිමියා විසින් සියලු පියවර ගනු ලැබිය යුතුය.

2.4 ලිපිනය වෙනස්කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් ලිඛිතව ඉල්ලීමක් කිරීමෙන් පසුව, බැංකුව විසින් එම අලුත් ලිපිනය කාඩ්පත්, ප්‍රකාශන, PIN සහ කාඩ්පත් භාරදීම සම්බන්ධයෙන් වන වෙනත් යම් ලිපි ලේඛන භාරදීමේ ලිපිනය වශයෙන් භාවිත කරනු ඇත.

2.5 කාඩ්පත සහ PIN අංකය භාවිතයෙන් කරනු ලබන සියලු ගනුදෙනු සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වගකියනු ලැබිය යුතුය. කාඩ්පත් හිමියා වංචා සහගත ලෙස ක්‍රියාකිරීම හෝ කාඩ්පත හෝ PIN අංකය ආරක්ෂා නොකරමින් නොසැලකිල්ලෙන් ක්‍රියාකිරීම සහ කාඩ්පත හෝ PIN අංකය නැතිවීම, සොරකම් කිරීම හෝ හෙළිදරවුවීම පිළිබඳව වහාම බැංකුවට දැනුම් නොදීම හේතුවෙන් සීමාවකින් තොරව කාඩ්පතට සිදුවන හරවීම් හේතුවෙන් සිදුවන සියලු මුදල් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා සම්පූර්ණයෙන් වගකීමට බැඳී සිටිය යුතුය. කලින් කල බැංකුව විසින් කරනු ලබන යම් සන්නිවේදන මඟින් බැංකුව විසින් නිර්දේශ කරනු ලබන ආකාරයට කාඩ්පත හෝ PIN අංකය ආරක්ෂා කිරීම සඳහා වූ පියවර අනුගමනය කිරීමට කාඩ්පත් හිමියා අපොහොසත්වීම ඉහත කී කාර්ය සඳහා කාඩ්පත් හිමියාගේ පාර්ශ්වයෙන් සිදුවන බරපතල අතපසු කිරීමක් ලෙස සලකනු ලැබේ.

2.6 ආරක්ෂිත පියවරක් වශයෙන්, කාඩ්පත අනුමත කළ දින සිට මුල් මාස හය (06) ඇතුළත කාඩ්පත් හිමියා විසින් කාඩ්පත සක්‍රීය කිරීම අවශ්‍ය කෙරෙයි*.

(*කාඩ්පත අනුමත කළ දිනය, අදාළ ප්ලාස්ටික් කාඩ්පත ගෙනැවිත් භාරදෙන කවරයෙහි දක්වා ඇත.)

2.7 ඉහත 2.6 වගන්තියෙහි දක්වා ඇති කාලසීමාව තුළ දී සක්‍රීය නොකරන ලද කාඩ්පත් අවහිර කෙරෙනු ඇති අතර, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් නිකුත් කෙරෙන වඩාත්ම මෑත-කාලීන සතුටුදායක වාර්තාවට යටත්ව නැවත සක්‍රීය කෙරෙනු ඇත.

2.8 කාඩ්පත භාවිත කිරීම හේතුවෙන් උපචිත වන ("කාඩ්පත් ගනුදෙනු") භාණ්ඩ, සේවා පිළිබඳව සියලු මිල දී ගැනීම්වල වටිනාකම් සහ සියලු මුදල් අත්තිකාරම් මෙන්ම වෙනත් සියලු ගාස්තු සහ අයකිරීම් බැර කරනු ලැබිය යුතු වූ කාඩ්පත සම්බන්ධ (මෙහි මින් මතු ඇතැම් අවස්ථාවල දී "කාඩ්පත් ගිණුම" යනුවෙන් සඳහන් කරනු ලබන) ගිණුමක් බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබේ. ඉල්ලා සිටින ලද හෝ ඉල්ලා නොසිටින ලද වුවද, යම් විකිණීමක් හෝ මුදල් අත්තිකාරමක් සඳහා අත්සන් කිරීමට කාඩ්පත් හිමියා අපොහොසත්වීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් බැංකුවට කාඩ්පත් හිමියා ඇති බැඳීමෙන් කාඩ්පත් හිමියා මුදාහැරීමක් සිදු නොවේ.

2.9 PIN අංකය මඟින් යම් ගනුදෙනුවක් සිදුකිරීමට (උදා: ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය / දුරකථන බැංකුකරණය /අන්තර්ජාල බැංකුකරණය වැනි) යම් ආකාරයකින්) අවසර ලබාදෙන යම් අවස්ථාවක දී, බැංකුවෙහි පද්ධතියේ සඳහන්වන තොරතුරු, කාඩ්පත් හිමියා විසින් එම ගනුදෙනුව සඳහා අවසර ලබා දී ඇති බවට තීරණාත්මක සාක්ෂියක් වන බවට කාඩ්පත් හිමියා මෙයින් අවබෝධ කරගෙන එකඟවනු ලැබේ.

2.10 කාඩ්පත් හිමියා හෝ තුන්වන පාර්ශ්වයක් විසින් ගනුදෙනුව සිදුකර ඇති බවට විශ්වාස කිරීමට බැංකුව වෙත හේතු ඇති අවස්ථාවක දී, යම් හබකර සිටින ගනුදෙනුවක්/ගනුදෙනු සම්බන්ධයෙන් වූ වටිනාකම කාඩ්පත් හිමියාගෙන් අයකර ගැනීමේ අයිතිය බැංකුව විසින් රඳවා ගනු ලැබේ.

2.11 කාඩ්පත් හිමියන් සඳහා වන මෙම ගිවිසුම අවසන් කළ ද එය නොතකා, කාඩ්පත සම්බන්ධයෙන් බැංකුව විසින් ප්‍රදානය කරනු ලබන සියලු ණය පහසුකම් සහ ඒ යටතේ වූ සියලු සම්බන්ධිත ගාස්තු සඳහා කාඩ්පත් හිමියා වගකියනු ලැබිය යුතුය.

2.12 බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත ණයවර සීමාවක් ලබා දෙනු ඇති අතර, කාඩ්පත් හිමියා එය දැඩිව නිරීක්ෂණය කරමින් එකී ණයවර සීමාවට විෂය වන පරිදි කාඩ්පත භාවිත කිරීමට බැඳී සිටිය යුතු වේ. කාඩ්පත් හිමියා වෙත පූර්ව දැනුම්දීමකින් යුතුව කලින් කලට ණයවර සීමාව ඉහළ දැමීම බැංකුව විසින් කළ

හැකි වන අතර, යම් විරෝධතාවක් වේ නම්, එවැනි දැනුම් දීමක් ලැබී දින 7ක් ඇතුළත කාඩ්පත් හිමියා එය ඉදිරිපත් කළ යුතු වේ. එසේ නොමැති නම්, කාඩ්පතෙහි සීමාව ඉහළ දැමීම සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා එකඟ වී ඇති බවට සැලකීමට බැංකුව අයිතිය රඳවා ගනියි. කාඩ්පත් හිමියා වෙත ලබා දී ඇති ණයවර සීමාව සමාලෝචනය කර බැලීම සඳහා ඕනෑම අවස්ථාවක ඔහු/ඇය විසින් ඉල්ලා සිටිය හැකිය. කාඩ්පත් හිමියා වෙත පූර්ව දැනුම් දීමකින් යුතුව දැනට තිබෙන කාඩ්පතෙහි ශ්‍රේණිය ඉහළ දැමීම බැංකුව විසින් ද කළ හැකි වන අතර, යම් විරෝධතාවක් වේ නම්, එවැනි දැනුම් දීමක් ලැබී දින 7ක් ඇතුළත කාඩ්පත් හිමියා එය ඉදිරිපත් කළ යුතු වේ. එසේ නොමැති නම්, නව ක්‍රෙඩිට් කාඩ්පත සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා එකඟ වී ඇති බවට සැලකීමට බැංකුව අයිතිය රඳවා ගනියි.

2.13 බැංකුව විසින් සිය පරම අභිමතය පරිදි, කාඩ්පත් හිමියා වෙත දැනුම් දීමකින් යුතුව (නමුත් එසේ කිරීමට බැඳී නොමැත), කලින් කලට ණයවර සීමාව ඉහළ දැමීම (හෝ පහළ දැමීම) හෝ දැනට තිබෙන කාඩ්පතෙහි ශ්‍රේණිය ඉහළ දැමීම (හෝ පහළ දැමීම) හෝ ණයවර සීමාවට අතිරික්ත වන පරිදි ගනුදෙනු සිදු කිරීමට අවසර ලබාදීමට කටයුතු කළ හැකි අතර, මෙම ගිවිසුමෙහි නීතිරීති වලට අනුව වන ඕනෑම ආශ්‍රිත ගනුදෙනුවක් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා බැඳී සිටිනු ඇත.

2.14 කාඩ්පත කිසිදු නීතිවිරෝධී කාර්යයක් සඳහා භාවිත නොකළ යුතුය.

2.15 කාඩ්පත් ගිණුම සඳහා අයවිය යුතුව හිඟ මුදල් ඇත්නම් හෝ ගනුදෙනු ආශ්‍රිතව සැක සහිත ක්‍රියාකාරකම් සිදුවී ඇති බවට සොයාගනු ලැබුවහොත්, යම් හෝ සියලු කාඩ්පත් ගනුදෙනු නවතා දැමීම සඳහා බැංකුව අයිතිය රඳවා ගනී.

## 3. බිල්ගතකිරීම සහ ගෙවීම

3.1 බැංකුව වෙත ගෙවිය යුතු බවට නිශ්චිතව දක්වනු ලබන ගෙවීම් කළ යුතු දිනයේ දී හෝ එම දිනයට පෙරාතුව වූ දිනය වන ("ගෙවීම් ලැබිය යුතු දිනය") වර්තමාන ප්‍රකාශන කාලසීමාව සම්බන්ධයෙන් ප්‍රකාශනය සිදුකරන දිනයේ දී කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් ගෙවිය යුතු මුලු මුදල ("ගෙවීම අවසන් කිරීමේ ශේෂය") සහ කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතු අවම මුදල පිළිබඳ විස්තර සහිතව ප්‍රකාශනයක් ("ප්‍රකාශනය") ප්‍රකාශන කාලසීමාවේ අවසාන දිනය වන ප්‍රකාශනය උත්පාදනය වන දිනයේ දී එනම්, සෑම බිල්පත්කිරීමේ කාලසීමාවක් අවසානයේ දී ම ("ප්‍රකාශන කාලසීමාව") කාඩ්පත් හිමියාට සාමාන්‍යයෙන් යවනු ලැබිය යුතුය.

3.2 (i) ගෙවීමට නියමිත අවම ගෙවීම වන්නේ,

a) ඒ ඒ මුදල් වාරික සැලසුම් සහ වැය වාරික සැලසුම් වල මාසික වාරික මුදල 100%ක්, තිබේ නම්; ඒ සමග;

b) ඔබේ කාඩ්පත් ගිණුමට අයකරන ලද යම් පොලියක්, ප්‍රමාද ගාස්තුවක්, සහ සීමාව ඉක්මවීමේ ගාස්තු තිබේ නම්; ඒ සමග;

c) කාඩ්පත් සඳහා වන වාර්ෂික ගාස්තුවෙන් 1/12ක්, තිබේ නම්; ඒ සමග;

d) ගෙවීමට නියමිතව ඉතිරිව පවතින ඔබේ හිඟ ශේෂයෙන් 1% (එනම්, ඉහතින් දැක්වූ කරුණු තුන යටතේ දක්වා ඇති මුදල් ප්‍රමාණයන් ගෙවීමට නියමිතව පවතින ඔබේ සමස්ත ශේෂයෙන් අඩු කළ විට ලැබෙන මුදල) තිබේ නම්; ඒ සමග;

e) ඔබේ ගිණුම ණයවර සීමාව ඉක්මවා ඇත්නම්, ඔබේ ණයවර සීමාව ඉක්මවා ඇති අතිරික්ත මුදල හෝ රු.500/- යන අගයයන් දෙකින් ඉහළ අගය. කෙසේ වෙතත්, ගෙවීමට නියමිතව පවතින ඔබේ සමස්ත ශේෂය රු.500/- අඩු නම්, ඔබ විසින් ගෙවිය යුතු අවම මුදල වන්නේ ගෙවීමට සියමිතව පවතින ඔබේ සමස්ත කාඩ්පත් ශේෂයයි.

(iii) ගෙවිය යුතු ව පසුගිය හිඟ මුදල් පවතින අවස්ථාවන් හි දී, ප්‍රකාශනයේ දැක්වෙන අවම ගෙවිය යුතු මුදල මඟින් ප්‍රකාශනයේ වත්මන් හිඟ මුදල + පසුගිය හිඟ මුදල + හිඟ ව පවත්නා කිසියම් හිඟ මුදලක් ද දැක්වෙනු ඇත.

(iv) ගෙවීම් කළ යුතු නියමිත දිනවල දී ගිවිසුම්ගත ගෙවිය යුතු අවම මුදල නොගෙවා සිටීම කාඩ්පත භාවිතය ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු වන්නේය.

3.3 කාඩ්පත් ගිණුමට කාඩ්පත් හිමියා විසින් කරනු ලබන ගෙවීම් බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපිළිවෙකට කාඩ්පත් හිමියාගේ වගකීම් ගෙවා නිමකිරීම සඳහා අදාළ කරගනු ලැබේ.

3.4 (i) ගෙවීම් කළ යුතු දිනයේ දී වූ කාඩ්පත් ගිණුම සඳහා වන කාඩ්පත් හිමියාගේ ප්‍රකාශනයේ සඳහන් ගෙවා අවසන් කළ යුතු සම්පූර්ණ ශේෂය හෝ ඉන් යම් ප්‍රතිශතයක් හෝ අවම ගෙවිය යුතු මුදල සඳහා ගෙවීම් කටයුතු කරන ලෙස බැංකුවට දැනුම්දෙමින් කාඩ්පත් හිමියා විසින් තමාගේ ජංගම හෝ ඉතුරුම් ගිණුමට ("පියවීමේ ගිණුම") ඍජු ස්ථාවර නියෝගයක් ("ස්ථාවර නියෝග") නිකුත් කරනු ලැබිය හැකිය.

(ii) එවැනි යම් ස්ථාවර නියෝග පිළිබඳ වූ යම් සංශෝධන සහ අවලංගු කිරීම් ඊළඟ ගෙවීම් කළ යුතු දිනයට සති දෙකකටවත් පෙරාතුව ලිඛිතව බැංකුව වෙත හෝ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය හා සම්බන්ධවීම මගින් හෝ ලැබිය යුතු බවට කාඩ්පත් හිමියා එකඟ වේ.

(iii) බැංකුව සමග යම් ගිණුමක් ගෙවා අවසන් කිරීම පිළිබඳව ලබා දුන් ස්ථාවර නියෝග සඳහා පහත දැක්වෙන අතිරේක නීතිරීති සහ කොන්දේසි අදාළ වන්නේය:

(a) බැංකුවට ඉදිරිපත් කළ එවැනි යම් ස්ථාවර උපදෙසක් හෝ බැංකුව සමග ඇතිකරගත් වෙනත් යම් වැඩපිළිවලක් සඳහා ප්‍රමුඛත්වය ලබාදීම තීරණය කිරීමේ අයිතිය බැංකුව සතු බව කාඩ්පත් හිමියා පිළිගෙන සිටියි.

(b) ගෙවීම් නියමිත දිනයට යටත් පිරිසෙයින් දින දෙකකටවත් පෙරාතුව ස්ථාවර නියෝග ඉටුකිරීමේ කාර්ය සඳහා ණය පියවීමට අදාළ ගිණුම සඳහා ප්‍රමාණවත් අරමුදල් සපයනු ලබන බවට කාඩ්පත් හිමියා එකඟ වී ගිවිසා ගනු ලැබේ. එම අවසන් කිරීමේ ශේෂය මත බැංකුව විසින් කලින් කළ තීරණය කරනු ලබන අනුපාතයක් යටතේ වූ මූල්‍ය ගාස්තු ද සමග ('මූල්‍ය ගාස්තුව') එම අවසන් කිරීමේ ශේෂය සඳහා වූ සමස්ත මුදල ගෙවන ලෙස බැංකුව විසින් ඉල්ලා සිටීමේ දී එම මුදල ආපසු ගෙවීම සඳහා කාඩ්පත් හිමියා බැඳී සිටියි.

(c) ගෙවීම් කළ යුතු දිනයේ දී ණය පියවීමේ ගිණුමෙහි ප්‍රමාණවත් නොවන ශේෂයක් පවතී නම් එවිට, එම අවස්ථාවේ එකී ණය පියවීමට අදාළ ගිණුමේ පවතින මුදල් මත පදනම් ව අය කරගැනීමේ ප්‍රමුඛත්වය ඉන් පසුව තීරණය කිරීම සඳහා බැංකුව විසින් අයිතිය තබාගනු ලැබේ. මූල්‍ය ගාස්තු ද ඇතුළුව ඒ මත උපචිතවන සියලු ගාස්තු ගෙවීමේ වගකීමට කාඩ්පත් හිමියා යටත් වේ. උපදෙස් දෙන ලද මුළු මුදල අයකරගැනීම සඳහා නම් කළ ණය පියවීමේ ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් නොමැති අවස්ථාවක දී, එම නම් කළ ණය පියවීමේ ගිණුමෙහි ඇති ඕනෑම මුදල් ප්‍රමාණයක් අය කරගැනීමට බැංකුවට අයිතිය ඇත. ගෙවීම් කළ යුතු දිනයට පෙරාතුව කාඩ්පත් ගිණුමට ගෙවීමක් සිදුකර ඇති අවස්ථාවක දී, පිළිවෙලින් වූ ණය පියවීමේ ගිණුමෙහි පවත්නා ශේෂය හරකරනු ලැබේ. කුමන හෝ හේතුවක් මත කාඩ්පත් හිමියා විසින් ණය පියවීමේ ගිණුම වසා දමන අවස්ථාවක දී, කාඩ්පත් හිමියාගේ ණය පියවීමේ ගිණුම වශයෙන් එම ගිණුම බැංකුව විසින් ද ඉවත් කරනු ඇත.

3.5 කාඩ්පත් හිමියා විසින් තමාගේ බිල්පත් ගෙවීම සඳහා, බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk සහ ප්‍රකාශනවල පසුපිටෙහි තොරතුරු ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති බැංකුවේ තෙවන පාර්ශ්ව ජාලයේ කවුන්ටරවල දී කරන ලද ගෙවීම් නොලැබීම සම්බන්ධයෙන් ක්‍රෙඩිට් කාඩ්පත් හිමියාගේ ගිණුම බැරකිරීමේ දී සිදුවන ප්‍රමාදයන් සඳහා හෝ බැංකුව වගකියනු නොලැබේ. බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හි ගාස්තු ලේඛනයෙහි දක්වා ඇති ආකාරයට, බැංකුව විසින් කලින් කල ස්වකීය අභිමතය පරිදි

තීරණය කරනු ලබන යම් අනුපාතයක් හෝ අනුපාත මත එකී ප්‍රමාදවී කරන ලද ගෙවීම් සඳහා ගාස්තුවක් අයකරනු ලැබේ.

බැංකුවේ ඉහත කී තුන්වන පාර්ශ්ව ජාල හරහා කරනු ලබන සියලු ගෙවීම්, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතිකයක් යටතේ කාඩ්පත් ගිණුමට බැරකරනු ලැබිය යුතු පාලන ගාස්තුවකට යටත් වන අතර, බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හි ගාස්තු ලේඛනයෙහි දක්වා ඇති ආකාරයට, බැංකුව විසින් කලින් කල ස්වකීය අභිමතය පරිදි තීරණය කරනු ලබන යම් අනුපාතයක් මත එම ගාස්තුව අයකරනු ලැබේ.

3.6 විදේශ ව්‍යවහාර මුදලින් සිදුවන යම් හරකර සිටිනු ලබන කාඩ්පත් ගෙවීමක් හේතුවෙන් සිදුවන ආපසු ගෙවීම් හෝ ප්‍රතිශෝධන ද ඇතුළුව, යම් ගනුදෙනුවක් අහෝසිවීම, ප්‍රතිශෝධනයවීම හෝ ප්‍රතිපූරණය සිදුවිය හැකි යම් හුවමාරුවීමේ දී සිදුවන පාඩු සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතුය.

3.7 මෙම ගිවිසුමෙහි ඇති අනෙකුත් ප්‍රතිපාදන වලට අගති විරහිතව, කාඩ්පත් හිමියා එක් මාසයකට වැඩි කාලයක් ශ්‍රී ලංකාවේ නොසිටින්නේ නම්, ඔහුගේ/ඇයගේ බැහැර වීමට පෙරාතුව කාඩ්පත් ගිණුම පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් (PFCA) පියවීම සඳහා පැහැදිලි හා විශේෂිත උපදෙස් ලබා දිය යුතු වන අතර, විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක සුරක්ෂිතයක් වශයෙන් මුදල් රඳවා තබා ගැනීම සඳහා සහ එකී ගිණුමෙහින් පවතින මුදලින් 90%ක් දක්වා ණයවර සීමාව ගැළපීම සඳහා බැංකුවට බලය පැවරිය යුතු වේ.

3.8 කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් නිකුත් කරන ලද සෑම ප්‍රකාශනයක් ම කාඩ්පත් හිමියා විසින් පිරික්සිය යුතු අතර, යම් වරදක් වෙතොත් ඒ පිළිබඳව ප්‍රකාශන දිනයේ සිට දින විස්සක් (20)ක් ඇතුළත ලිඛිතව බැංකුව වෙත දැනුම් දිය යුතු වේ. එකී කාල සීමාවෙන් පසු, ප්‍රකාශනය සහ එහි ඇතුළත් කිරීම් (දැනුම් දෙන ලද කිසියම් වරදක් හැර) නිවැරදි බවට බැංකුව සහ කාඩ්පත් හිමියා අවසානාත්මකව සලකනු ලබයි. කාඩ්පත් හිමියා විසින් අන් ආකාරයකින් ඉල්ලුම් කර නොමැති නම්, කාඩ්පත් හිමියා විසින් ලිඛිතව බැංකුව වෙත සපයා ඇති මෑත කාලීන ලිපිනය වෙත සියලු ප්‍රකාශන සාමාන්‍ය තැපැල් මගින් එවනු ලබන අතර, පැය හැත්තෑ දෙක (72)ක කාලයක් ඇතුළත එය කාඩ්පත් හිමියාට ලැබී භාරගෙන ඇති බවට සලකනු ලැබේ. කාඩ්පත් හිමියා විසින් විශේෂිතව දක්වනු ලබන විද්‍යුත් තැපැල් ලිපිනයකට විද්‍යුත් තැපැල් හරහා මාසික ප්‍රකාශන එවන ලෙසට කාඩ්පත් හිමියාට ඉල්ලුම් කර සිටිය හැකි අතර, ඒ අනුව එකී විද්‍යුත් තැපැල් ලිපිනයට මාසික ප්‍රකාශන යැවීම පිළිබඳව බැංකුව විසින් සලකා බලනු ඇත. කෙසේ වෙතත්, අතරමග නතරවීම්, දූෂ්‍යවීම්, අස්ථානගතවීම්, විනාශවීම්, ප්‍රමාදවී ලැබීම් හෝ අසම්පූර්ණවීම් හෝ වයිරස අඩංගුවීම් ආදිය එම තොරතුරුවලට සිදුවිය හැකි බැවින් විද්‍යුත් සම්ප්‍රේෂණ ආරක්ෂිත හෝ දෝෂ රහිත බවට

සහතික විය නොහැකි බවත්, එබැවින් විද්‍යුත් සම්ප්‍රේෂණයේ දී විද්‍යුත් ලිපියෙහි අන්තර්ගතයට සිදුවිය හැකි දෝෂ හෝ අත්හැරීම් කිසිවක් සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාර නොගන්නා බවත් කාඩ්පත් හිමියා මෙමගින් ප්‍රකාශිතවම තේරුම්ගෙන, එකඟව පිළිගනියි.

3.9 ප්‍රකාශනයක් නොලැබීම ගෙවීම් නොකිරීම සඳහා වලංගු හේතුවක් ලෙස සලකනු නොලැබිය යුතුය. ප්‍රකාශනය උත්පාදනය කරන දින සිට දින දාහතර (14)ක් ඇතුළත ප්‍රකාශනය ලැබී නොමැති හෝ අලුත් කාඩ්පත් සම්බන්ධයෙන් වනවිට කාඩ්පත අනුමතවීමේ දින සිට දින දාහතර (14)ක් ඇතුළත ප්‍රකාශනය ලැබී නොමැති නම්, ඒ පිළිබඳව කාඩ්පත් හිමියා විසින් බැංකුවට දැනුම්දිය යුතුය.

## 4. ගාස්තු සහ අයකිරීම් (කාඩ්පත් වර්ගය අනුව ඇතැම් ගාස්තු, අයකිරීමෙන් නිදහස් කරනු ලැබිය හැකිය. කරුණාකර අදාළ සැලසුම්වල විස්තර බලන්න).

4.1 බැංකුව විසින් නිකුත් කරන ලද වර්තමාන ගාස්තු ලේඛනයට අනුව ගාස්තු සහ අයකිරීම් ගෙවීම සඳහා කාඩ්පත් හිමියා එකඟ වෙයි.

4.2 කාඩ්පත සඳහා ගෙවිය යුතු වාර්ෂික ගාස්තුව දායක මුදලක් වශයෙන් වාර්ෂිකව අයකරනු ලැබේ. කාඩ්පත් හිමියා බැංකුව සමඟ තමාගේ කාඩ්පත අලුත් කරගැනීම සඳහා අපේක්ෂා නොකරයි නම්, කාඩ්පත අවසන්වීමේ දිනට මාස දෙකකට පෙරාතුව ඔහු/ඇය විසින් කාඩ්පත අලුත්කර නොගැනීමට ඇති ස්වකීය අපේක්ෂාව බැංකුව වෙත දැනුම්දිය යුතුය. එවැනි දැනුම්දීමක් නොමැති අවස්ථාවක දී, බැංකුව විසින් කාඩ්පත් ගිණුමෙන් හරකර ඇති වාර්ෂික ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

4.3 කාඩ්පත් නිකුත් කරනු ලබන අවස්ථාවේ දී එක්වරක් පමණක් ගෙවිය යුතු ගාස්තුවක් වශයෙන් බැංකුව විසින් තීරණය කරනු ලබන සම්බන්ධවීමේ ගාස්තුවක් අයකරනු ලැබේ.

4.4 ගෙවීම් නියමිත දිනයේ දී කාඩ්පත් හිමියා විසින් සමස්ත අවසන් ශේෂය ගෙවීම සිදු නොකරයි නම්, ප්‍රකාශනයේ වන සමස්ත අවසන් ශේෂය මත, ගෙවා නිමකිරීමේ සමස්ත ශේෂය ගෙවා නිම කරන තෙක්, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණයක් අනුව ගනුදෙනුව සිදුවන සැබෑ දින සිට එම එක් එක් කාඩ්පත් ගනුදෙනුව සම්බන්ධයෙන් දිනපතා ගණනය කරනු ලබන මූල්‍ය ගාස්තුවක් අයකරනු ලබන අතර, බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හි ගාස්තු ලේඛනයෙහි දක්වා ඇති ආකාරයට, බැංකුව විසින් තීරණය කරනු ලබන යම් අනුපාතයක් මත එම ගාස්තුව අයකරනු ලැබේ. පසුව යෙදෙන ප්‍රකාශන දිනයේ දී කාඩ්පත් ගිණුමෙන් මූල්‍ය ගාස්තුව හර කරනු ලැබේ.

4.5 ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවලින් ("ATM") හෝ බැංකු ශාඛාවලින් හෝ මුදල් ගෙවීම් කරන වෙළඳුන් හෝ නියෝජිතයන්ගෙන් කාඩ්පත් හිමියා විසින් ලබාගන්නා අත්තිකාරම් ATM, බැංකු, වෙළෙඳ, නියෝජිත, ප්‍රාදේශීය හෝ රටෙහි සීමාවන්ට සහ සම්බාධකවලට මෙන්ම මහ බැංකු සහ විනිමය පාලන නියෝග වලට යටත් විය යුතුය. කාඩ්පත් හිමියාගේ ප්‍රකාශනයේ සඳහන් මුදල් අත්තිකාරම් සීමාව වශයෙන් හඳුන්වනු ලබන ස්ථිර ණය සීමාව තුළ යම් නිශ්චිතව දක්වා ඇති සීමාවක් දක්වා පමණක් කාඩ්පත් හිමියාට මුදල් අත්තිකාරම් ලබාගත හැකිය. මුදල් අත්තිකාරම් සීමාව කාඩ්පත් හිමියාගේ ගිණුම පවත්වාගෙන යන ආකාරය මත පදනම් ව තීරණය කරනු ලැබිය යුතු අතර, එය මාසිකව ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු මෙන්ම අලුත් මුදල් අත්තිකාරම් සීමාව ප්‍රකාශනයේ සඳහන් කරනු ලැබිය යුතුය. තාවකාලික සීමා වැඩිකිරීම් සහ/හෝ මුදල් තැන්පතු හෝ කාඩ්පත් ගිණුම් සඳහා මාරුකිරීම් මගින් කිසිම ආකාරයකින් කාඩ්පත් හිමියාගේ මුදල් අත්තිකාරම් සීමාව වැඩි නොකළ යුතුය. මෙම පහසුකම කාඩ්පත් හිමියාට පූර්ව දැනුම්දීමකින් තොරව බැංකුව විසින් වෙනස් කිරීම හෝ ආපසු ලබාගැනීම කළ හැකිය. මුදල් අත්තිකාරම් සඳහා ද මිලදී ගැනීම් ගනුදෙනු සඳහා වූ සමාන මූල්‍ය ගාස්තුවක් අය කරනු ඇත.

4.6 මූල්‍ය ගාස්තු ගෙවීමට අමතරව, ගෙවීම් නියමිත දිනයේ දී, ගෙවීම් සිදුකිරීමට දී ඇති අදාළ නිශ්චිත වේලාවන් අවසන්වීමට පෙරාතුව කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතු අවම මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් එවිට ප්‍රමාද ගාස්තුවක් අයකරනු ලැබිය යුතුය.

4.7 ප්‍රකාශන කාලසීමාවේ දී යම් අවස්ථාවක දී, කාඩ්පත මත පවරා දී ඇති ණය සීමාව ඉක්මවන ලද නම්, එවිට සීමා ඉක්මවීමේ ගාස්තුවක් අයකරනු ලැබේ. ඉහත කාර්ය සඳහා පවරා දී ඇති ණය සීමාව ඉක්මවා ඇද්ද යන්න ගණනය කිරීමේ දී බැංකුවේ ගාස්තු ද සැලකිල්ලට ගනු ලැබිය යුතුය.

4.8 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉන්ධන පිරවුම්හල්වලින් සපයනු ලබන පෙට්‍රල්, ඩීසල්, ගෑස් සහ වෙනත් සියලු සැපයුම් මිල දී ගැනීම් සහ සීමාසහිත ලංකා විදුලිබල ආයතනය (LECO) සහ ලංකා විදුලිබල මණ්ඩලය (CEB) වෙත කෙරෙන සියලු ගෙවීම් සම්බන්ධයෙන් වෙළෙඳ මහතා හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් අනුව කාඩ්පත් ගිණුමෙන් හරවිය යුතු මෙහෙයුම් ගාස්තුවකට යටත් වන්නේය. කාඩ්පත් ගිණුමට හර කරනු ලබන මුදල විකුණුම් පත්‍රිකාවේ සටහන්, අවසර දී ඇති මුදලින් වෙනස්විය හැකිය.

4.9 ශ්‍රී ලංකා රුපියල්වලින් හැර වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් සිදු කරන ලද සියලු කාඩ්පත් ගනුදෙනු, ගනුදෙනුව පෙන්නුම් කරන දිනයේ දී පවතින අමෙරිකානු එක්සත් ජනපද ඩොලරය (USD) - ශ්‍රී ලංකා රුපියල් ව්‍යවහාර මුදල් (LKR) පිළිබඳ HSBC හි විකුණුම් අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් පසු කාඩ්පත් ගිණුමට හර කරනු ඇත. ගනුදෙනු වටිනාකමින් 3.5% ක ප්‍රතිශතයක් බැංකුව විසින් අය කරගනු ඇත.

4.10 කාඩ්පත පිළිබඳ සහ එය භාවිත කිරීමට අදාළ මූල්‍ය ගාස්තු, වෙනත් ගාස්තු සහ, අයකිරීම්, බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හි ගාස්තු ලේඛනයෙහි දක්වා ඇති අතර, එහි පිටපත් ඉල්ලා සිටීම මගින් බැංකුවේ ඕනෑම ශාඛාවක දී ලබාගත හැක. ගාස්තු පිළිබඳ යම් වෙනස්කම්/එකතු කිරීම්, සඳහන් කිරීමක් මගින් හෝ කාඩ්පත් ප්‍රකාශනය සමඟ බහාලමින් හෝ කාඩ්පත් හිමියා වෙත සන්නිවේදනය කරනු ලැබේ.

## 5. අතිරේක කාඩ්පත්

5.1 කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා(හිමියන්) විසින් ලිඛිතව සිදුකරනු ලබන ඉල්ලීමක් අනුව, පහත 5.2 වගන්තියට යටත් ව, බැංකුව සිය අභිමතය පරිදි අතිරේක කාඩ්පත(කාඩ්පත්) නිකුත් කරනු ඇත. කාඩ්පත භාවිතය සහ අතිරේක කාඩ්පත(කාඩ්පත්) භාවිතය සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා(හිමියන්) යන දෙපාර්ශ්වය ම එක් ව හා වෙන් වෙන් ව වගකීමට බැඳී සිටියි.

කිසියම් සැකයක් වේ නම්, එය දුරු කරගැනීම පිණිස, කාඩ්පත භාවිතය සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) එක් ව හා වෙන් වෙන් ව වගකීමට බැඳී සිටීමට අමතරව, කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා විසින් සිදුකරන ලද සියලු ගනුදෙනු පිළිබඳ පූර්ණ වගකීම සම්බන්ධයෙන් මූලික කාඩ්පත් හිමියා බැඳී සිටියි.

5.2 ඉහත 5.1 වගන්තියෙහි කුමක් සඳහන් වුවද, කාඩ්පත් හිමියාගෙන් සෘජුව යැපෙන්නකු /යැපෙන්නන් වන, වයස අවුරුදු 16 සිට 18 අතර වයසෙහි බාලවයස්කරුවකු (කරුවන්) වෙත බැංකුව විසින් අතිරේක කාඩ්පතක් (කාඩ්පත්) නිකුත් කිරීමක් කාඩ්පත් හිමියකුට අවශ්‍ය වුවහොත්, එවැනි බාලවයස්කරුවකු (කරුවන්) වෙත අධ්‍යාපනය පහසුකරවීමේ අරමුණ උදෙසා පමණක් එවැනි අතිරේක කාඩ්පතක් (කාඩ්පත්) නිකුත් කරන ලෙසට කාඩ්පත් හිමියා විසින් ලිඛිත ඉල්ලීමක් බැකුව වෙත නිකුත් කළ යුතුය. එවැනි අතිරේක කාඩ්පතක් (කාඩ්පත්) බැංකුව විසින් නිකුත් කිරීම බැංකුවේ පරම අභිමතය මත සිදු කරනු ඇත.

ඉහත කී පරිදි, බාලවයස්කරුවන් වෙත අතිරේක ක්‍රෙඩිට් කාඩ්පතක් (කාඩ්පත්) නිකුත් කරන ලබන අවස්ථාවන් හි දී, කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) විසින් ඇති කරනු ලබන සියලු වගකීම්වල අවසාන වගකීම කාඩ්පත් හිමියා විසින් දරනු ඇත.

5.3 මූලික සහ අතිරේක කාඩ්පත් හිමියන් සඳහා වූ වාර්ෂික ගාස්තු මූලික කාඩ්පත ආරම්භ කිරීමේ වාර්ෂික දිනයේ දී අයකරනු ලැබිය යුතුය. වෙනම පවත්නා අතිරේක කාඩ්පත් සම්බන්ධයෙන් වනවිට (අතිරේක කාඩ්පත් එහි මූලික කාඩ්පත නිකුත් කළ දිනයට වෙනස් දිනයක නිකුත්කර ඇති විට), වාර්ෂික ගාස්තුව සමානුපාතික මුදලක් වශයෙන් අයකරනු ලැබිය යුතුය.



PUBLIC

## 6. ATM යන්ත්‍ර/දුරකථන බැංකුකරණ/PIB සහ HSBC CC සංඥා, කෙටි පණිවුඩ සංඥා (SMS Alert) භාවිතය

6.1 විද්‍යුත් ක්‍රමය මඟින් ATM යන්ත්‍ර මඟින්, අලෙවි ස්ථාන (POS) මඟින් හෝ වෙනත් ආකාරයකින් බැංකු ගනුදෙනු සිදුකිරීම සඳහා භාවිත කළ හැකිවන පරිදි ATM, දුරකථන බැංකුකරණ/PIB පහසුකම් කාඩ්පතෙහි අන්තර්ගතකර ඇති අවස්ථාවක දී, එම පහසුකම් භාවිත කිරීම කාඩ්පත් හිමියන්ගේ ATM යන්ත්‍ර / දුරකථන බැංකුකරණ/ PIB ප්‍රවේශය පිළිබඳ ඇති නීතිරීති සහ කොන්දේසි ඒකාබද්ධ ව ඇත්තා වූ ද ඉල්ලීමක් කිරීමේ දී කියවීම සඳහා බැංකු ශාඛාවේ පිටපත් තබා ඇත්තා වූ ද බැංකුවේ ATM කාඩ්පත්, දුරකථන බැංකුකරණ සහ PIB පහසුකම් පිළිබඳ නීතිරීති සහ කොන්දේසිවලට යටත් විය යුතුය.

6.2 කාඩ්පත් හිමියන් විසින් ATM යන්ත්‍රවල දී/ දුරකථන බැංකුකරණ/ PIB මඟින් කරනු ලබන ගනුදෙනු සම්බන්ධයෙන් ඇතිවන ආරවුල් බැංකුව විසින් විභාගකරනු ලැබිය යුතු අතර, බැංකුව සෑහීමට පත්වන පරිදි අන්‍යාකාරයකින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඉහත කී ක්‍රම මඟින් සිදු කරන ලද ගනුදෙනු පිළිබඳ වගකීම කාඩ්පත් හිමියා සතු වේ. මෙහි අන්තර්ගත කරුණුවලට පටහැනිව කුමක් සඳහන් වුවද, ATM ගනුදෙනු සඳහා PIN අංකය ඉදිරිපත්කල යුතු බැවින් නැති වූ කාඩ්පතක් පිළිබඳ වාර්තාකර තිබීම මෙම වගකීම අත්හිටුවීමට හෝ අහෝසි කිරීමට හේතු නොවිය යුතුය. PIN අංකය ආරක්ෂා කිරීමට, රැකගැනීමට සහ කාඩ්පතෙන් PIN අංකය වෙන්කර තැබීමට කාඩ්පත් හිමියන්ට විශේෂයෙන් ම උපදෙස් දී ඇති අතර එසේ කිරීමට අපොහොසත්වීම ඒ සම්බන්ධයෙන් ඇතිවන ඕනෑම වගකීමක් භාරගැනීමක් ලෙස සලකනු ලැබේ.

6.3 හරස් විදේශ ව්‍යවහාර මුදලින් ගනුදෙනු සිදුකිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති විදේශ විනිමය පනතෙහි විධිවිධාන සහ/හෝ විදේශ විනිමය පාලනය කෙරෙන වෙනත් ඕනෑම නීතියක් සහ/හෝ විදේශ විනිමය සම්බන්ධයෙන් කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් ඕනෑම සහ සියලුම රෙගුලාසි/උපදෙස් මඟින් කාඩ්පත් හිමියා/හිමියන් පාලනය වනු ඇත.

### 6.4 දුරකථන බැංකුකරණය

6.4.1 බැංකුව විසින් සපයන දුරකථන බැංකුකරණ සේවාවට පහත දෑ ඇතුළත් වේ:

i. කාඩ්පත් හිමියාගේ යම් ගිණුම් අතර මුදල් පැවරීම.

ii. කලින් නිශ්චය කළ හා එකඟ වී ඇති හුවමාරු සීමාවක් තුළ කාඩ්පත් හිමියාගේ ඕනෑම ගිණුමකින් කාඩ්පත් හිමියා විසින් දුරකථන බැංකුකරණ සේවාව යටතේ මුදල් ලැබීමේ කාර්යය සඳහා ලිඛිතව නම් කර ඇති වෙනත් ඕනෑම ගිණුමක් අතර මුදල් පැවරීම ("කැප වූ පැවරුම්ලාභී ගිණුමක්").

iii. ගිණුම් ශේෂ, පෙර සිදුකළ ගනුදෙනු (කාඩ්පත් හිමියාගේ ගිණුම සම්බන්ධව), විනිමය අනුපාතික හා තැන්පතු අනුපාතික පිළිබඳ විමසීම.

iv. ප්‍රකාශන සඳහා (තෝරාගත් ගිණුම් වර්ග සඳහා), චෙක්පොත් හා කාඩ්පත් හිමියාගේ ගිණුම සම්බන්ධව චෙක්පත් ගෙවීම් නැවතීම සඳහා ඉල්ලීම්; සහ

v. බැංකුව විසින් කලින් කලට හඳුන්වා දෙන වෙනත් යම් ආකාරයක බැංකුකරණ හෝ ආයෝජන සේවාවන්.

6.4.2 කාඩ්පත් හිමියා විසින් දුරකථන මගින් ලබාදෙන කාඩ්පත් හිමියාගේ උපදෙස් මත ක්‍රියාකිරීමට බැංකුවට අවසර ලබාදෙන නමුත් එසේ ක්‍රියා කිරීමට බැංකුව බැඳී නැති අතර, අනවසර පුද්ගලයන් වෙතින් ලැබෙන බවට බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි විශ්වාස කරන දුරකථන උපදෙස් කිසිවක් මත ක්‍රියා නොකිරීමට බැංකුවට අවසර ඇති බවට කාඩ්පත් හිමියා එකඟ වේ.

6.4.3 බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත සපයා ඇති දුරකථන බැංකුකරණ රහස්‍ය අංකය (PIN) සියලුම අවස්ථාවන් හි දී ඉතා රහසිගත ආකාරයෙන් තබාගැනීමට කාඩ්පත් හිමියා භාරගෙන සිටින අතර, එම රහස්‍ය අංකය නැතිවූ විට හෝ අනවසර පාර්ශ්වයකට එම රහස්‍ය අංකය හෙළිදරව් වී ඇති බවට දැනගත් විට වහාම බැංකුව වෙත වාර්තා කළ යුතු ය.

6.4.4 උපකරණවල යම් අවක්‍රියාකාරීත්වයක් හෝ ඇණහිටීමක් ද ඇතුළත්ව, සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් බැංකුවේ පාලනයෙන් බාහිර යම් හේතුවක් නිසා යම් දුරකථන උපදෙසක් ඉටුකිරීමට අසමත්වීමක් සම්බන්ධයෙන් බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත වගකිව යුතු නොවන අතර, උපදෙස් ඉටුකිරීම මගින් පැනනගින හෝ ඒ සම්බන්ධයෙන් ඇතිවන සෘජු, වක්‍ර හෝ ආනුෂංගික අලාභයන් සඳහා කිසිදු තත්ත්වයක් යටතේ බැංකුව කාඩ්පත් හිමියා වෙත වගකීමට බැඳී නැති අතර, සියලුම අවස්ථාවල දී හානිපූරණය කිරීමට ද, සෘජුව හෝ වක්‍ර ලෙස බැංකුව දුරකථන උපදෙස් භාරගැනීම තුළින් සහ ඒ මත ක්‍රියාකිරීමෙන් හෝ ක්‍රියාකිරීමට අසමත්වීම හා සම්බන්ධයෙන් පැනනගිනු ඇති සියලුම නඩු, නීතිමය කටයුතු, අයැදීම්, අලාභ, හානි, පිරිවැය හා වියදම් යනාදියෙන් බැංකුව ආරක්ෂා කර තැබිය යුතු ය. දුරකථන බැංකුකරණ සේවාව අවසන් කිරීම නොතකා මෙම හානිපූරණය අඛණ්ඩව පවතිනු ඇත.

6.4.5 මෙහි සඳහන් වන නීතිරීති හා කොන්දේසි යටතේ දුරකථන උපදෙස් ලබාදීමට කාඩ්පත් හිමියාට ඇති අයිතිය සියලුම අවස්ථාවල දී බැංකුවේ අභිමතයට යටත් වන අතර, බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දී පූර්ව දැනුම්දීමකින් තොරව එම අයිතිය අවලංගු කළ හැකිය.

6.4.6 දුරකථන හෝ වෙනත් උපදෙස් ලබාදීම සඳහා කාඩ්පත් හිමියාගේ ගිණුමෙහි සහ/හෝ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් (හෝ කලින් සැලසුම් කරගත් ණයවර පහසුකම්) පවතින බවට කාඩ්පත් හිමියා සහතික විය යුතු අතර, බැංකුවෙහි අසමත්වීමකින් පැනනගින යම් ආනුෂංගයක් සඳහා බැංකුව වගකීමට බැඳී නොමැති අතර, කෙසේ වුවද

සැමවිටම බැංකුව විසින් සිය තනි අභිමතය මත එවැනි ප්‍රමාණවත් නොවීමක් නොතකා උපදෙස් ඉටුකිරීමට තීරණය කළහොත් බැංකුව විසින් පූර්ව අනුමැති ඉල්ලුම්පතක් හෝ කාඩ්පත් හිමියාට දැනුම්දීමක් නොකර එසේ සිදුකරනු ඇති අතර, එමගින් ඇතිවන අයිරාව, අත්තිකාරම හෝ ණයවරය සම්බන්ධයෙන් සහ ඊට අදාළ ගාස්තු සඳහා කාඩ්පත් හිමියා වගකිවයුතු වනු ඇත. අයිරාව, අත්තිකාරම හෝ ණයවරය බැංකුව විසින් සිය පූර්ණ අභිමතය මත තීරණය කරනු ලබන පොලී අනුපාතවලට යටත් වනු ඇති අතර, එවැනි ගිණුම්වලට අදාළ වන බැංකුවේ සාමාන්‍ය නීතිරීති මගින් පාලනය වනු ඇත.

6.4.7 කාඩ්පත් හිමියා විසින් ලබාදුන් දුරකථන උපදෙස් මත බැංකුව විසින් සිදුකරන ලද ගනුදෙනුව සම්බන්ධ තොරතුරු කැප වූ භුවමාරුලාභී ගිණුමෙහි හිමිකරුවා / හිමිකරුවන් වෙත කාඩ්පත් හිමියා විසින් දැනුම් දිය යුතුය. එවැනි උපදෙස් ලබාදීම සම්බන්ධයෙන් බැංකුව, කාඩ්පත් හිමියා වෙත කිසිදු වගකීමකට බැඳී නොමැත.

6.4.8 කලින් කලට සිය තනි අභිමතය යටතේ පරිදි සුදුසු යැයි සලකන ආකාරයෙන් සේවා ගාස්තුවක් සහ/හෝ වෙනත් අයකිරීම් පැනවීමට බැංකුවට අයිතිය පවතින අතර, එවැනි ගාස්තු සහ අයකිරීම් පිළිබඳව සඳහන් කිරීමක් මගින් හෝ කාඩ්පත් ප්‍රකාශනය සමග බහාලමින් හෝ, විද්‍යුත් තැපැල් මගින් හෝ බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හි දැක්වීමෙන් ද ඇතුළුව, නමුත් ඊට සීමා නොවී, කාඩ්පත් හිමියා වෙත සන්නිවේදනය කරනු ලැබේ.

6.4.9 කලින් කලට සිය තනි අභිමතය යටතේ සුදුසු යැයි සිතන ආකාරයෙන් ට දුරකථන බැංකුකරණ සේවාවෙහි විෂයපථය හෝ මෙහි ඇති වෙනත් යම් නීතිරීති හා කොන්දේසිවලට එකතුකිරීම්, මකාදැමීම්, හෝ වෙනස් කිරීම් සිදුකිරීමට බැංකුව අයිතිය රඳවා ගනියි.

6.4.10 මෙම සේවාවට ප්‍රවේශවීම සඳහා බැංකුව විසින් සපයා ඇති දුරකථන බැංකුකරණ රහස්‍ය අංකය (PIN) හා පෞද්ගලික බැංකුකරණ අංකය (PBN) භාවිත කිරීම හෝ බැංකුව විසින් නිකුත් කර ඇති ඔබගේ කාඩ්පත් අංකය භාවිත කිරීම මෙම නීතිරීති හා කොන්දේසි කාඩ්පත් හිමියා විසින් පිළිගැනීමක් ලෙස අර්ථ නිරූපණය කෙරෙනු ඇත.

6.4.11 බැංකුවෙහි දුරකථන බැංකුකරණ සේවාව හරහා හරස් විදේශ ව්‍යවහාර මුදලින් ගනුදෙනු කිරීමට අවසර නොමැත.

### 6.5 HSBC CC

බැංකුවෙහි සත්‍යාපනය කිරීමට යටත්ව, කාඩ්පත් හිමියා හට ලිඛිතව හෝ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය හරහා හෝ "HSBC CC" (මෙම වගන්තියේ දී "සේවාව") යනුවෙන් හැඳින්වෙන HSBC සංඥා සේවාව (HSBC Alert Service) සඳහා ලියාපදිංචි විය හැකි අතර, (මෙම වගන්තියේ 6.5 හි "නීතිරීති") යනුවෙන් දක්වා ඇති පහත නීතිරීති සහ කොන්දේසි, එම සේවාවට ලියාපදිංචි වන කාඩ්පත් හිමියන් හට අදාළ වනු ඇත.



PUBLIC

6.5.1 සේවාව මඟින් කාඩ්පත් හිමියා විසින් ඉල්ලීම සිදුකරන අවස්ථාවේ දී කාඩ්පත් හිමියාට ලබාගත හැකි ණය සීමාව, පෙර වැඩකරන දිනයේ අවසානය වනවිට කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පතෙහි හිඟ ශේෂය, බැංකුව වෙත ලැබිය යුතු අවම ගෙවීම, බැංකුව වෙත ගෙවීම සිදුකළ යුතු වන දිනය කාඩ්පත් හිමියාට සපයනු ඇත. බැංකුව වෙත ලියාපදිංචි කර ඇති ජංගම දුරකථන අංකයට යැවෙන කෙටි පණිවුඩ සේවාව ("SMS") සැපයෙනු ඇත. සේවාව දැනට ලබා දී ඇත්තේ බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන [www.hsbc.lk](http://www.hsbc.lk) ("ආයතනය/ආයතන") හි ප්‍රකාශයට පත්කර ඇති ජංගම දුරකථන සේවා සැපයුම්කරුවන්ගේ සේවාවන් භාවිත කරන කාඩ්පත් හිමියන් වෙත පමණකි.

6.5.2 සේවාව භාවිත කරන අතරතුර කාඩ්පත් හිමියා බැංකුවේ මෙම නීතිරීති, උපදෙස් සහ/හෝ කාර්යපටිපාටි වලට අනුකූලවනු සහ එමගින් බැඳී සිටිනු ඇත. එම උපදෙස් සහ/හෝ කාර්යපටිපාටි වලට අනුකූල නොවීමෙන් පැන නඟින, කාඩ්පත් හිමියාට සිදුවන යම් හානියක්, පාඩුවක් හා වියදමක් සඳහා බැංකුවට එරෙහිව කාඩ්පත් හිමියාට කිසිදු අයැදීමක්, පියවරක් හෝ ප්‍රතිකර්මයක් නොපවතිනු ඇත.

6.5.3 තෙවන පාර්ශ්වයක් විසින් පණිවුඩ නැරඹීම හෝ කාඩ්පත් හිමියා හැර වෙනත් යම් තැනැත්තෙකු විසින් සේවාව භාවිත කිරීම, බැංකුවේ හෝ ඉහත සඳහන් සමාගම්වල පරිගණක පද්ධතිය, බැංකුවට අයත් වන හෝ නොවන පර්යන්ත සම්බන්ධතා මාර්ග, දත්ත සැකසුම් පද්ධති හෝ සම්ප්‍රේෂණ මාර්ග බිඳවැටීම හෝ අවක්‍රියාකාරීත්වය හෝ බැංකුවේ පාලනයෙන් බැහැර ඕනෑම තත්ත්වයක් ද ඇතුළත්ව ඊට සීමා නොවී, ඕනෑම හේතුවක් මත සේවාව සම්බන්ධයෙන් හෝ එමඟින් පැන නගින, කාඩ්පත් හිමියාට සෘජුව හෝ වක්‍ර මාර්ගයෙන් දරන්නට හෝ විඳින්නට සිදුවන යම් හානියක් හෝ පාඩුවක් සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුව වගකීමට හෝ වගවීමට ලක් නොකරනු ඇත.

6.5.4 ඕනෑම අවස්ථාවක දී සිය තනි සහ පූර්ණ අභිමතය මත පූර්ව දැනුම්දීමකින් තොරව සහ ඒ සඳහා කිසිදු හේතුවක් දැක්වීමකින් තොරව සහ කාඩ්පත් හිමියා විසින් පූර්වයෙන් මෙම නීතිරීති කඩකිරීමක් සඳහා නඩු පැවරීමේ සිය අයිතීන් කිසිවකට අගති විරහිතව, සේවාව ට යම් වෙනස්කමක් සිදු කිරීමට, සේවාව නැවැත්වීමට සහ/හෝ අවසන් කිරීමට සහ සේවාව වෙනස් කිරීමට බැංකුව සහ/හෝ සමාගම්වලට අයිතිය පවතියි.

6.5.5 HSBC වෙත ලියා එවීම මඟින් හෝ බැංකුව විසින් සත්‍යාපනය කිරීමට යටත් ව, බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය හරහා, සේවාව භාවිත කිරීම අවසන් කිරීම සඳහා හෝ, ජංගම දුරකථන අංකය, කාඩ්පත් අංකය වැනි කාඩ්පත් හිමියාගේ තොරතුරු වෙනස් කිරීම සඳහා හෝ කාඩ්පත් හිමියාට ඉල්ලා සිටිය හැක. සමාගම්වලට අවශ්‍ය වන කාල සීමාවට යටත්ව, කාඩ්පත් හිමියා විසින් ඉල්ලා සිටින සංශෝධන සිදුකිරීම සඳහා බැංකුව විසින් වැඩකරන දින හත (07)ක් දක්වා කාලයක් ගත හැකිය.



PUBLIC

6.5.6 සේවාව භාවිත කිරීම මඟින් හෝ ඒ සම්බන්ධයෙන් ඕනෑම ආකාරයකින් පැන නගින කලින් කලට බැංකුවට දරන්නට සිදුවන හෝ විඳින්නට සිදුවන සියලුම ආකාරයේ සියලු පාඩු, අයැදීම්, නඩුකර, නඩුකටයුතු, අයැදීම් සහ ඉල්ලීම්, සම්බන්ධ පාඩු, පිරිවැය, හානි හා වියදම් සඳහා බැංකුව හානිපූරණය කිරීමට සහ බැංකුව හානිපූරණය කර තැබීමට, කාඩ්පත් හිමියා මෙමඟින් අවලංගු කළ නොහැකි ලෙස එකඟ වී භාරගෙන සිටියි.

6.5.7 සේවාව හරහා පෙන්වන කාඩ්පත් හිමියාගේ කාඩ්පතෙහි ශේෂය පූර්ව වැඩ කරන දිනයේ අවසානය තෙක් වනු ඇත.

## 6.6 කෙටි පණිවුඩ සංඥා (SMS Alerts) පහසුකම

"කෙටි පණිවුඩ සංඥා" යනු (SMS), කාඩ්පත් හිමියා විසින් බැංකුවෙහි ලියාපදිංචි කර ඇති ජංගම දුරකථන අංකය වෙත SMS මඟින් එවනු ලබන විශේෂයෙන් සකසනු ලැබූ පණිවුඩ වේ.

කාඩ්පතින් ගෙවීම් සිදුකිරීමට අනුමත කරන ලද ගනුදෙනුව පිළිබඳ සංඥාවක් කාඩ්පත් හිමියන් වෙත සැපයීම මෙම සේවාව මඟින් සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකාව තුළ වන සන්නිවේදන යටිතල ව්‍යුහයන්, සබැඳුම් සහ සේවාවන් මත SMS සංඥා පහසුකම යැපෙන බැව් කාඩ්පත් හිමියා පිළිගනියි. බැංකුව විසින් එවන ලද SMS සංඥාවල කාලානුරූප බව, සන්නිවේදන කර්මාන්තයට බලපාන කරුණු මත රඳා පවතින බව කාඩ්පත් හිමියා පිළිගනියි. කාඩ්පත් හිමියා වෙත SMS සංඥා බෙදා-නොහැරීම හෝ ප්‍රමාද වී බෙදා හැරීම, සම්ප්‍රේෂණයේ දී සිදුවන වැරදි, හානි, විකෘතිවීම් සහ සම්ප්‍රේෂණය කෙරෙන වැරදි සහගත සංඥා සම්බන්ධයෙන් බැංකුව හෝ එහි සේවා සැපයුම්කරුවන් හෝ වග කියනු නොලබයි.

කාඩ්පත් හිමියා විදේශ සංචාරයක නිරතවන අවස්ථාවක දී SMS සංඥා ලැබීමට නම්, roaming යාවත්කාලීන කිරීමට සහ/හෝ ජාත්‍යන්තර ජංගම දුරකථන අංකය ලබාදීමට හෝ කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත දැනුම් දිය යුතු වේ. නියාමන අවශ්‍යතාවන් හා සීමාකිරීම් හේතුවෙන් ඇතැම් රටවල දී SMS සංඥා පහසුකම ලබාදිය නොහැකි වනු ඇත.

ඕනෑම අවස්ථාවක දී සිය තනි සහ පූර්ණ අභිමතය මත පූර්ව දැනුම්දීමකින් තොරව සහ ඒ සඳහා කිසිදු හේතුවක් දැක්වීමකින් තොරව සහ කාඩ්පත් හිමියා විසින් පූර්වයෙන් මෙම නීතිරීති කඩකිරීමක් සඳහා නඩු පැවරීමේ සිය අයිතීන් කිසිවකට අගති විරහිතව, SMS සංඥා පහසුකමට යම් වෙනස්කමක් සිදු කිරීමට, SMS සංඥා පහසුකම නැවැත්වීමට සහ/හෝ

අවසන් කිරීමට සහ SMS සංඥා පහසුකම වෙනස් කිරීමට බැංකුව සහ/හෝ සමාගම්වලට අයිතිය පවතියි.

HSBC වෙත ලියා එවීම මගින් හෝ බැංකුව විසින් සත්‍යාපනය කිරීමට යටත් ව, බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය හරහා, සේවාව භාවිත කිරීම අවසන් කිරීම සඳහා හෝ, ජංගම දුරකථන අංකය, SMS සංඥා පර්යන්තය වැනි කාඩ්පත් හිමියාගේ තොරතුරු වෙනස් කිරීම සඳහා හෝ කාඩ්පත් හිමියාට ඉල්ලා සිටිය හැක. කාඩ්පත් හිමියා විසින් ඉල්ලා සිටින සංශෝධන/ය සිදුකිරීම සඳහා බැංකුව විසින් වැඩකරන දින තුන (03)ක් දක්වා කාලයක් ගත හැකිය.

## 7. අවසන්කිරීම

7.1 කාඩ්පත් හිමියා (මූලික/අතිරේක) විසින් ඕනෑම අවස්ථාවක දී බැංකුව වෙත ලිඛිත දැනුම්දීමක් සමග කාඩ්පත සහ අතිරේක කාඩ්පත (කාඩ්පත්) ආපසු භාරදීමෙන් පසුව මෙම ගිවිසුම අවසන් කරනු ලැබිය හැකිය.

7.2 බැංකුව වෙත කාඩ්පත් හිමියාගෙන් අවසානයට වාර්තා වී ඇති ලිපිනයට වැඩකරන දින තිහ (30)ක ලිඛිත දැනුම්දීමකින් යුතුව, මෙම ගිවිසුම අවසන් කිරීම සහ/හෝ අවලංගු කිරීම හෝ කාඩ්පත අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ බැංකුව විසින් සිදුකළ හැකි අතර, අනපේක්ෂිත තත්ත්වයන් යටතේ දී කාඩ්පත සම්බන්ධයෙන් වන එවැනි අවසන් කිරීම් / අලුත් නොකිරීම් පිළිබඳව වෙනත් සන්නිවේදන මාර්ගයන් ඔස්සේ කාඩ්පත් හිමියා වෙත දැනුම්දීමට බැංකුව කටයුතු කරනු ඇත. එකී අවසන් කිරීම සිදුකරනු නොලැබුවේ නම් හෝ සිදු කරනු ලබන තෙක් හෝ බැංකුව විසින් කලින් කලට කාඩ්පත් හිමියාට අලුත් කාඩ්පතක් ('අලුත් කරන ලද කාඩ්පත') සපයනු ලැබිය හැකිය.

7.3 විදේශ විනිමය පාලනය වන නීතිරීති සහ/හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද රෙගුලාසි/නියෝගවල සඳහන් අවසන් කිරීමේ විධිවිධානවලට යටත් ව සහ ඉහත 7.2 වගන්තියෙහි විධිවිධානයන් එතකුදු වුවත්, පහත අවස්ථාවන් හි දී, මෙම ගිවිසුම අවසන් කිරීමට සහ අවලංගු කිරීමට සහ/හෝ වහාම ක්‍රියාත්මක වන පරිදි කාඩ්පත අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ බැංකුවට හිමිකම පවතී;

(i) කාඩ්පත් හිමියා විසින් මෙම ගිවිසුමෙහි නීතිරීති සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්වීම සහ/හෝ කඩ කිරීම;

(ii) කාඩ්පත් හිමියා විසින් සිදුකරන පැහැර හැරීමකදී හෝ බැංකුව සමඟ එළැඹ ඇති කිසියම් ගිවිසුමක්, පිළියෙල කිරීමක් හෝ බැඳීමක් (නිශ්චිත නොවන හෝ අන්‍යාකාර) යටතේ සිදුකරන පැහැර හැරීමක්;

(iii) ගිණුම් හිමියා (ගිණුම් හිමියන්) යම් බංකොලොත් හෝ බුන්වත්භාවය පිළිබඳ නඩුවක හෝ ඊට සමාන නඩු කටයුතුවල විෂය වස්තුව වී තිබීම;

(iv) කාඩ්පත් හිමියාගේ මරණය සිදුවීම;

(v) බැංකුව සමඟ වන කිසියම් ගිණුම් සබඳතාවක් අවසන් කිරීම.

7.4 කාඩ්පත් ගිණුමෙන් අයවිය යුතු එහෙත් තවමත් කාඩ්පත් ගිණුමෙන් අයකරගෙන නොමැති හිඟ මුදල් ද සමග කාඩ්පත් ගිණුමේ හිඟව පවත්නා ගෙවිය යුතු සමස්ථ අතිරික්ත මුදල මෙම ගිවිසුම අවසන් කිරීමේ දී හෝ කාඩ්පත් හිමියාගේ වස්තුභංගත්වයක දී හෝ කාඩ්පත් හිමියා මියයෑමේ දී වහාම ලැබිය යුතු සහ අයවිය යුතු වන්නේය. කාඩ්පත් ගිණුමේ හිඟ මුදල් ගෙවා නිම කිරීම සඳහා කාඩ්පත් හිමියා සහ/හෝ ඔහුගේ බූදලය වගකීමට බැඳිය යුතු අතර, එම අයවිය යුතු හිඟ මුදල් ආපසු අයකර ගැනීමේ දී බැංකුව විසින් දරන ලද සියලු පිරිවැය, ගාස්තු, (නීති ගාස්තු ද ඇතුළුව), සහ වියදම් සඳහා බැංකුව හානිපූරණයකර නිදහස්ව තැබිය යුතුය. එවැනි ගෙවීමක් කල් පසුවීම හේතුවෙන් පවත්නා අනුපාතය අනුව මූල්‍ය ගාස්තු සහ වෙනත් ගාස්තු සහ අයකිරීම් අඛණ්ඩව අයකරවා ගැනීම සඳහා ක්‍රියාකිරීමට බැංකුවට හිමිකමක් ඇත්තේය.

7.5 එක් පාර්ශ්වයක් විසින් මෙම ගිවිසුම අවසන් කළ ද එය නොසලකා, කාඩ්පත භාවිත කිරීම මගින් උපචිත වන තවදුරටත් වූ සියලු ගාස්තු සඳහා කාඩ්පත් හිමියා අඛණ්ඩ ව වගකීමට බැඳී සිටිය යුතුය.

7.6 කාඩ්පත (කාඩ්පත්) මාස 24ක ට වැඩි කාලයක් "අක්‍රීයව" පවතියි නම් හෝ ශුන්‍ය ශේෂයකින් යුතු වේ නම් හෝ, බැංකුව විසින් සිය පරම අභිමතය පරිදි, කාඩ්පත් හිමියා වෙත දැනුම් දීමකින් යුතුව (නමුත් එසේ කිරීමට බැඳී නොමැත) කාඩ්පත (කාඩ්පත්) අවලංගු කිරීම සිදු කළ හැකිය.

## 8. කාඩ්පත නැතිවීම

8.1 කාඩ්පත නැතිවීම හෝ සොරකම්කිරීම සිදු වී ඇති බවට අනාවරණය වූ පසු, වහාම එකී නැතිවීම/සොරකම් කිරීම පිළිබඳව දුරකථනය මගින් බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානයට සහ පොලීසියට (හෝ, විදේශයන් හි දී නම්, Visa හෝ MasterCard සාමාජිකයකු වෙත) වාර්තා කරනු ලැබිය යුතුය. නමුත්, එවැනි යම් අවස්ථාවක දී, දුරකථන හෝ ටෙලෙක්ස් පණිවුඩ මගින් කරන ලද එම පණිවුඩයෙන් පසුව කාඩ්පත් හිමියා විසින් හෝ ඔහු විසින් යථා පරිදි බලය දුන් ඇටෝර්නි බලකරු විසින් අත්සන්කර වහාම ලිඛිතව තහවුරු කරනු ලැබිය යුතුය. කාඩ්පත නැතිවීම හෝ සොරකම් කිරීම ඉහත කී ආකාරයට අවස්ථාවෝචිත පරිදි බැංකුව

වෙත හෝ Visa හෝ MasterCard සාමාජිකයකු වෙත දැනුම් දී පසුව එම සොරකම් කිරීම හෝ නැතිවීම ලිඛිතව තහවුරු කිරීම කරනු ලබන තෙක් කාඩ්පත අනවසරයෙන් භාවිත කිරීම හේතුවෙන් කාඩ්පත් ගිණුමට බැරවී ඇති සියලු මුදල් සහ කාඩ්පත් ගිණුමට සිදුවෙමින් පවත්නා කාඩ්පත් ගනුදෙනු සඳහා තවදුරටත් බැරවීමට ඇති සියලු මුදල් සඳහා කාඩ්පත් හිමියා වගකියනු ලැබිය යුතුය. නැතිවූ හෝ සොරකම් කරන ලද කාඩ්පත (කාඩ්පත්), කාඩ්පත් හිමියාට ආපසු ලැබී ඇති අවස්ථාවක දී කාඩ්පත් හිමියා විසින් වහාම බැංකුව වෙත එම ලැබුණු කාඩ්පත (කාඩ්පත්) ආපසු භාරදිය යුතුය.

8.2 කාඩ්පත නැතිවීම, සොරකම් කිරීම හෝ සාවද්‍ය ලෙස භාවිතය සිදුවී ඇති අවස්ථාවක දී කාඩ්පත් හිමියා විසින් තමාගේ සන්තකයේ පවතින කාඩ්පත පිළිබඳ සියලු විස්තර බැංකුව වෙත ලබාදිය යුතු අතර, එම නැතිවී ඇති කාඩ්පත සොයා ගැනීම සඳහා සහායවීම පිණිස බැංකුව විසින් ගනු ලැබිය යුතු බවට සලකනු ලබන සියලු පියවර බැංකුව විසින් ගනු ලැබිය යුතුය.

8.3 කාඩ්පත නැතිවීම හෝ සොරකම් කිරීම හේතුවෙන් කාඩ්පත් හිමියාට ප්‍රතියෝජනය කාඩ්පතක් නිකුත් කිරීම සඳහා බැංකුව කිසිදු බැඳීමකට යටත් නොවන්නේය. බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හි ප්‍රකාශයට පත්කර ඇති ආකාරයට, බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි අනුපාතිකයක් මත ඕනෑම ප්‍රතියෝජන කාඩ්පතක්, කාඩ්පත් ගිණුමට බැරවිය යුතු මෙහෙයුම් ගාස්තුවකට යටත්විය යුතු අතර, මුල් කාඩ්පත හා සම්බන්ධයෙන් වූ සමාන නීතිරීති සහ කොන්දේසිවලට යටත්ව, බැංකුව විසින් තීරණය කිරීමේ දී එම ප්‍රතියෝජන කාඩ්පත නිකුත් කරනු ලැබේ.

8.4 Premier කාඩ්පත් හිමියන් (බැංකුවේ Premier කාඩ්පත් හිමියන් සහ Premier ක්‍රෙඩිට් කාඩ්පතක් දරන) MasterCard International හරහා විශේෂ හදිසි කාඩ්පත් ප්‍රතියෝජන සේවාවන් සහ හදිසි මුදල් සේවාවන් සඳහා හිමිකම් ලබන්නේය. මෙම සේවාවන් භාවිත කිරීම සම්බන්ධයෙන් කාඩ්පත් හිමියන් MasterCard විසින් අයකරනු ලබන යම් ගාස්තු සඳහා යටත් වන්නේය.

## 9. Rewards සහ Cashback

### 9.1 Rewards ලකුණු උපයා ගැනීම

"Rewards ලකුණු" යනු Rewards ලකුණු වැඩසටහනේ ප්‍රධාන මිනුම් ඒකකයයි.

(a) බැංකුව විසින් ශ්‍රී ලංකාවේ දී, බැංකු අනන්‍යතා අංක "BIN" 4720 76 , 4679 13 සමග නිකුත් කරන ලද HSBC Rewards ක්‍රෙඩිට් කාඩ්පත් සහ BIN 517964 සමග නිකුත් කරන ලද Premier Master ක්‍රෙඩිට් කාඩ්පත් මෙම Rewards ලකුණු වැඩසටහන සඳහා සහභාගීවීමට සුදුසුකම් ලබයි.

(b) 2019 අගෝස්තු 24 දින සිට බලපැවැත්වෙන පරිදි, ක්‍රෙඩිට් කාඩ්පත් මගින් දේශීය සහ විදේශීය වශයෙන් සිදුකරන වැය කිරීම් මත, පහතින් දක්වා ඇති වෙළඳ කාණ්ඩයන් යටතේ Rewards ලකුණු ගුණාකාරයන් (Rewards points multipliers) උපයා ගැනීමට HSBC Rewards ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් හට හැකි වනු ඇත.

| වැය කිරීමේ කාණ්ඩය | Rewards ලකුණු |
|---|---|
| රෙදි-පිළි | 5 X |
| ආහාර-පාන | 5 X |
| විද්‍යුත් වාණිජ (E Commerce) | 5 X |
| රක්ෂණාවරණ | 2 X |
| වෛද්‍යමය | 2 X |
| ප්‍රවාහන | 5 X |
| අධ්‍යාපනික | 2 X |
| වෙනත් | 1 X |

(c) VISA Worldwide Pte Limited (VISA) /Master Card Incorporated (MasterCard) සහ HSBC විසින් සිය නිල පොදු වෙබ්අඩවියෙන් ප්‍රකාශයට පත් කරනු ලබන මගපෙන්වුම් මත පදනම්ව, පූර්ව වශයෙන් දක්වන ලද වෙළෙඳ කාණ්ඩ කේත ("MCC") වෙත Rewards ලකුණු ගුණාකාරයන් අදාළ කෙරෙනු ඇත. පහතින් දක්වා ඇති MCC යටතට නොවැටෙන කිසිදු ගනුදෙනුවක් සඳහා Rewards ලකුණු ගුණාකාරයන් පිරිනමනු නොලබයි.

(d) සුදුසුකම් ලබන ආහාර-පාන ගනුදෙනු යනුවෙන් අදහස් වන්නේ, හෝටල් වෙතින් ගනු ලබන ආහාර-පාන හැර අනෙකුත් සියලු ආහාර සහ පාන අලෙවිසැල් වන අතර, <u>වෙළෙඳ කාණ්ඩ කේතයන් භාවිතයෙන් බැංකුව විසින් පූර්ව වශයෙන් දක්වා නොමැති වෙනත් සියලු ගනුදෙනු එයින් බැහැර වේ.</u>

(e) කාඩ්පත් හිමියා (මයිලේජ් රිවෝඩ්ස් - mileage rewards ලකුණු සඳහා ලියාපදිංචි වුවත් නැතත්) 2022 නොවැම්බර් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, ක්‍රෙඩිට් කාඩ්පත පිළිගනු ලබන දේශීය හෝ විදේශීය ස්ථානයක දී මිලදී ගැනීම් සඳහා සිය කාඩ්පත භාවිතයෙන් වැය කරනු ලබන සෑම රු. 200/-ක් සඳහා ම 1 ලකුණක් උපයා ගනු ඇත.

(f) කැසිනෝ, විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම්, ශේෂ පැවරීම්, මුදල් වාරික සැලසුම යටතේ කෙරෙන මුදල් ආපසුගැනීම්, වාර්ෂික ගාස්තු සහ වෙනත් ගාස්තු, මූල්‍ය අයකිරීම් සහ වෙනත් අයකිරීම්, දක්වා නොමැති හෝ අවලංගු කළ ගනුදෙනු ද ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී, මුදල් අත්තිකාරම්, අර්ධ මුදල් ගනුදෙනු (quasi cash transaction) සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා විසින් Rewards ලකුණු උපයනු නොලබයි.

(g) Rewards වැඩසටහන වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතු වන අතර, වෙනසක් සිදුකිරීමෙන් පසුව, ඒ පිළිබඳව විද්‍යුත් තැපැල් හෝ ප්‍රකාශන පණිවුඩ මගින් හෝ ප්‍රකාශන මත අලවන ලද පණිවුඩ මගින් (ස්ටිකර් මගින්) හෝ SMS සේවා මගින් හෝ ප්‍රකාශන ලිපි කවරය මත හෝ මුද්‍රිත දැන්වීමක් හෝ බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හරහා පණිවුඩයක් මගින් හෝ කාඩ්පත් හිමියන් වෙත දැනුම්දෙනු ලැබේ.

(h) මූලික සහ අතිරේක කාඩ්පත් සම්බන්ධයෙන් HSBC Reward ලකුණු උපචිත වන අතර, පවත්නා සමස්ත ලකුණු ප්‍රමාණය භාවිත කිරීමට මූලික සහ අතිරේක කාඩ්පත් හිමියන් විසින් සුදුසුකම් ලබයි.

(i) 0% වාරික සැලසුම යනුවෙන් ද හඳුන්වනු ලබන කාඩ්පත් හිමියා සඳහා වන වාරික සැලසුම හරහා සිදුකරන ලද ඕනෑම ගනුදෙනුවක් සඳහා සමස්ත ගනුදෙනු වටිනාකම උදෙසා, ගනුදෙනුව සිදුකළ අවස්ථාවේ දී Rewards ලකුණු පිරිනමනු ඇත.

9.2 Rewards ලකුණු නිදහස්කර ගැනීම

(a) පහත සඳහන් ඕනෑම ක්‍රමයක් මගින් කාඩ්පත් හිමියන් විසින් උපයාගෙන ඇති Rewards ලකුණු නිදහස්කර ගැනීම කළ හැකිය :-

- හවුල්කාර ආයතනවල දී Rewards ලකුණු නිදහස් කරගැනීම මගින්,
- ඩයලොග් ස්ටාර් පොයින්ට්ස් බවට පරිවර්තනය කිරීම මගින්,
- අදාළ නිරන්තර වාරිකා/ගුවන් සැතපුම් (Frequent Flyer/Air Miles) වැඩසටහන සහ HSBC සමග පූර්ව ලියාපදිංචියට යටත් ව, හවුල්කාර ගුවන් සමාගම්වල නිරන්තර වාරිකා/ගුවන් සැතපුම් (Frequent Flyer/Air Miles) බවට පරිවර්තනය කිරීම මගින්. Mileage Rewards පිළිබඳ කොටස බලන්න.

(b) HSBC Premier කාඩ්පත් හිමියන් (අංක 517964න් ආරම්භ වන කාඩ්පත් අංක දරන) Mileage Rewards සඳහා නොමිලේ ලියාපදිංචි විය හැකිය. අනෙකුත් කාඩ්පත් සම්බන්ධයෙන්, කාඩ්පත් හිමියා වෙතින් ශ්‍රී ලංකා රුපියල් 1,000/- වූ වාර්ෂික ගාස්තුවක් අයකරනු ලැබේ.

(c) Rewards ලකුණු හවුල්කාර ආයතනවල දී Rewards ලකුණු නිදහස්කර ගැනීම සඳහා ස්වයංක්‍රීයව ඉඩ ලබාදෙන 'මාර්ගගත' ('online') EDC/විකුණුම් ස්ථාන (POS) යන්ත්‍රවල දී මූලික වශයෙන් ක්‍රෙඩිට් කාඩ්පත ඇතුළත් කිරීමෙන් සිදු කළ හැකිය. නිදහස් කරගනු ලබන ඒකකවල මූල්‍ය වටිනාකම එම Rewards ලකුණු හවුල්කාර ආයතනවල දී මිලදී ගනු ලබන අයිතමවල මිල ගණනින් අඩු කරනු ලැබේ.

(d) යම් දෙන ලද කාලයක් ඇතුළත කාඩ්පත් හිමියා විසින් HSBC Premier සඳහා ලකුණු 1334ක් සහ සුදුසුකම් ලත් අනෙකුත් සියලුම කාඩ්පත් සඳහා ලකුණු 4000ක් රැස්කරගත් විට පමණක් ලකුණු නිදහස් කරගැනීම හෝ පරිවර්තනය කිරීම කළ හැකි වන අතර, නිදහස් කරගැනීමේ එක් තනි ඉල්ලීමක් මගින්, ලකුණු 4000ක් නිදහස් කරගැනීමට සුදුසුකම් ලබනු ඇති අතර, යම් දෙන ලද කාලයක් ඇතුළත දී ඉහත සඳහන් කර ඇති පරිදි, ඒ ආකාරයෙන් ම, ලියාපදිංචි කාඩ්පත් හිමියන් විසින් ලකුණු 5000ක් රැස්කරගෙන ඇති විට Mileage Rewards නිදහස් කරගැනීමේ විකල්ප ඔවුන්ට හිමිවනු ඇත.

(e) කාඩ්පත් හිමියා විසින් ලකුණු නිදහස් කරන ලෙස ඉල්ලා සිටීමෙන් පසුව, නිදහස් කරන ලද Rewards ලකුණු කාඩ්පත් හිමියාගේ පිළිවෙලින් වූ Rewards ලකුණු හිමිකාරීත්ව වාර්තාවෙන් කපාහැර දැමීම/ඉවත් කිරීම කරනු ලැබේ.

(f) නිදහස් කරගැනීම සඳහා ඉල්ලීම් කිරීමෙන් සහ එම ඉල්ලීම් සකස් කිරීමෙන් පසුව එම ඉල්ලීම් අවලංගු කිරීම හෝ වෙනස් කිරීම සිදුකරනු නොලැබේ.

(g) උපයාගනු ලබන Rewards ලකුණු, මුදල් බවට හැරවිය නොහැකි අතර, බැර වශයෙන් නැවතත් කාඩ්පත වෙත පැවරීම ද කළ නොහැක.

(h) පැහැරහැරීම් නොකරන ලද කාඩ්පත් හිමියන් විසින් පමණක් Rewards ලකුණු නිදහස් කරගැනීම කළ හැකිය.

(i) ක්‍රෙඩිට් කාඩ්පත මත ගෙවීමට නියමිතව ඇති හිඟ ශේෂය පියවීම සඳහා Rewards ලකුණු වල වටිනාකම භාවිත කළ නොහැකිය.

9.3 Rewards ලකුණු හවුල්කාර ආයතන

(a) ලකුණු නිදහස් කිරීමේ දී අතිරේක වටිනාකම් හෝ අතිරේක වට්ටම් පිරිනැමීම සඳහා ඇතැම් Rewards ලකුණු හවුල්කාර ආයතන තෝරාගනු ලැබිය හැකිය. ඕනෑම හේතුවක් නිසා මෙම වට්ටම් හෝ අතිරේක වටිනාකම් සැපයීම සඳහා යම් Rewards ලකුණු හවුල්කාර ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ.

(b) බැංකුව, යම් Rewards ලකුණු හවුල්කාර ආයතනයක දී නිදහස් කරනු ලබන යම් නිෂ්පාදන හෝ සේවා සපයන්නකු නොවන අතර, ඒ සම්බන්ධ කිසිම වගකීමක් භාරගනු නොලැබේ.

(c) ස්වකීය අභිමතය පරිදි වෙනත් යම් Loyalty/Rewards/Mileage වැඩසටහනක් ඒකාබද්ධ කිරීමට හෝ පවතින වැඩසටහනක් නවතා දැමීමට හෝ බැංකුව අයිතිය රඳවා ගනියි.

9.4 Rewards ලකුණු පිළිබඳ විමසීම්

(a) Rewards ලකුණු සඳහා වූ ආරම්භක ශේෂය, උපයාගෙන ඇති Rewards ලකුණු ප්‍රමාණය, නිදහස් කරන ලද Rewards ලකුණු, යථාවත් කරන ලද Rewards ලකුණු, Rewards ලකුණුවල අවසාන ශේෂය සහ කල් ඉකුත්වීමට නියමිත Rewards ලකුණු පිළිබඳ විස්තර Rewards ලකුණු සාරාංශය යටතේ කාඩ්පත් හිමියාගේ ප්‍රකාශයෙහි දැක්වෙනු ඇත.

9.5 Rewards ලකුණු කල් ඉකුත්වීම

(a) යම් නිශ්චිත වර්ෂයක දී උපයාගනු ලබන Rewards ලකුණු ඒකක අවුරුදු දෙකකට පසුව කාඩ්පත අලුත්කිරීමේ මාසයේ දී කල් ඉකුත් වේ.

(b) කල් ඉකුත්වීමට නියමිත සහ කාඩ්පත අලුත්කිරීමේ දිනයට පෙර නිදහස් කරගනු නොලැබූ සියලු ලකුණු, Rewards ලකුණු කල් ඉකුත්වීමෙන් පසුව කාඩ්පත් හිමියාට නොලැබෙනු ඇත.

9.6 Rewards ලකුණු සඳහා අදාළ වන පොදු නීතිරීති

(a) Rewards ලකුණු උපයා ගැනීම සහ එකතුකර ගැනීම සම්බන්ධ වංචා සහ/හෝ ඒ සඳහා උත්සාහ කිරීම හෝ එසේ වංචා සහගත ලෙස නිදහස්කර ගැනීමේ නියමයන් හේතුවෙන් බැංකුව විසින් කාඩ්පත ආපසු ලබාගැනීම/අවලංගු කිරීමට අමතරව එසේ උපචිත කරගනු ලැබූ Rewards ලකුණු තහනම් කිරීම සඳහා එය හේතුවිය හැකිය.

(b) ඕනෑම හේතුවක් නිසා යම් නිශ්චිත ගනුදෙනුවක් පිළිබඳ හබකර සිටින හෝ ආපසු අයකරගනු ලබන හෝ ආපසු හරවා යවනු ලබන අවස්ථාවක දී එවැනි ගනුදෙනු මඟින් උපචිත වන Rewards ලකුණු බැංකුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. යම් නිශ්චිත ගනුදෙනුවක් සිදුවී Rewards ලකුණු නිදහස් කරගෙන ඇති අවස්ථාවක දී, ඉන් පසුව හබකර සිටීමක් සිදුවී/ගනුදෙනු ප්‍රතිශෝධනයක් සිදුකිරීමට අවශ්‍යව ඇති අවස්ථාවක දී, පිළිවෙලින් වූ කාඩ්පත් හිමියාගෙන් කාඩ්පත සඳහා අයකිරීම මඟින් හෝ බැංකුව සමග පවත්නා වෙනත් ගිණුමකින් අයකර ගැනීම මඟින් එම ගනුදෙනු සම්බන්ධයෙන් නිදහස් කරගන්නා ලද හබකර සිටින Rewards ලකුණුවලට සමාන රුපියල් අගයක් අයකර ගැනීමේ අයිතිය බැංකුව විසින් තබාගනු ලැබේ. හිමිකමක් ලබා දී ඇති අවස්ථාවක දී, කාඩ්පත් හිමියාගේ ප්‍රකාශයේ පෙන්නුම් කරනු ලබන ඉදිරි ගෙවීම් කළ යුතු දිනයේ දී එම මුදල ගෙවා නිම කිරීම සඳහා කාඩ්පත් හිමියා එකඟ වේ.

(c) කාඩ්පත් හිමියා විසින් ඔහුගේ කාඩ්පත් ගිණුම අවසන් කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවක දී, හෝ ඕනෑම අවස්ථාවක දී ඕනෑම හේතුවක් මත HSBC විසින් ඔහුගේ කාඩ්පත අවසන් කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවක දී, මූලික කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා යන දෙදෙනාම Rewards වැඩසටහනට සහභාගි වීමට සුදුසුකම් නොලබනු ඇත. කාඩ්පත් ගිණුමක් අවසන් කිරීමේ දී භාවිත නොකළ Rewards ලකුණු ස්වයංක්‍රීයව ම අවලංගු වන අතර, කාඩ්පත් හිමියා හට එකී Rewards ලකුණු නිදහස් කිරීමට නොහැකි වේ. භාවිත නොකළ Rewards ලකුණු කාඩ්පත් හිමියාගේ වෙනත් කිසිදු කාඩ්පත් ගිණුමක් වෙත පැවරීම සිදුකළ නොහැකි වේ.

(d) ඕනෑම අවස්ථාවක දී ඕනෑම හේතුවක් මත අතිරේක කාඩ්පත් හිමියෙකුගේ ගිණුමක් අවසන් කළ ද, HSBC විසින් අන්‍යාකාර තීරණයකට එළඹ නොමැති නම්, මූලික කාඩ්පත් හිමියා හට අඛණ්ඩව Rewards වැඩසටහනට සහභාගි විය හැකි වේ.

(e) Rewards වැඩසටහන සම්බන්ධයෙන් මෙම වගන්තියෙහි වන නීතිරීති සහ කොන්දේසි ඇතුළුව Rewards ලකුණු හවුල්කාර ආයතන පිළිබඳ යම් වෙනස්කිරීම් සඳහා සහ එකී වෙනස් කිරීම් පිළිබඳව කාඩ්පත් හිමියා වෙත ප්‍රකාශන සමග පණිවුඩ හෝ ප්‍රකාශනය සමග ඇමුණුම්/බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය/ SMS හෝ වෙනත් ඕනෑම සුදුසු සන්නිවේදන මාධ්‍ය මඟින් දැනුම්දීම සඳහා HSBC විසින් අයිතිය රඳවා ගනු ලැබේ.

(f) Rewards වැඩසටහන පිළිබඳ යම් මතභේදයක් ඇති වී තිබෙන අවස්ථාවක දී බැංකුවෙහි තීරණය අවසානාත්මක සහ තීරණාත්මක වේ.

(g) Rewards වැඩසටහන හා සම්බන්ධ කෙරෙන විශේෂ පිරිනැමීම් පිළිබඳව සන්නිවේදන කිරීමට භාවිත කෙරෙනු ඇති දැන්වීම් කලින් කල ලැබීමට කාඩ්පත් හිමියා එකඟ වේ.

(h) උපදෙස් ලබාදෙන බවට සලකනු ලබන තැනැත්තාගේ අධිකාරී බලය හෝ අනන්‍යතාව පිළිබඳව බැංකුව පාර්ශ්වයෙන් කිසිදු විමසීමකින් තොරව සහ උපදෙස් ලැබෙන අවස්ථාවේ පවතින අවස්ථානුගත කරුණු පිළිබඳ නොසලකමින්, කාඩ්පත් හිමියා විසින් හෝ ඔහු/ඇය වෙනුවෙන් ක්‍රියාකරන තැනැත්තා විසින් ('උපදෙස්' යනුවෙන් හඳුන්වනු ලබන) දුරකථනය, කෙටි පණිවුඩ සේවා ("SMS"), පුද්ගල අන්තර්ජාල බැංකුකරණ සේවා ("PIB") හෝ විද්‍යුත් තැපැල මඟින් ලබාදෙන Rewards ලකුණු නිදහස්කර ගැනීම සම්බන්ධයෙන් වූ යම් නිවේදන, උපදෙස්, ඉල්ලා සිටීම් හෝ වෙනත් සන්නිවේදන පිළිබඳ විශ්වාසය තැබීම සහ ඒ අනුව ක්‍රියාකිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත බලය දෙනු ලැබේ.

(i) එකම කාඩ්පත් හිමියා හට හෝ වෙනස් වූ කාඩ්පත් හිමියන් හට අයත් විවිධ ක්‍රෙඩිට් කාඩ්පත් අතර Rewards ලකුණු රැස්කිරීම සඳහා අවසර දෙනු නොලැබේ.

(j) අඛණ්ඩව මාස දෙක (02)ක් සඳහා කාඩ්පත් හිමියා විසින් අවම ගෙවීම සිදුනොකර සිටින අවස්ථාවක දී, එසේ ගෙවීම් හිඟව පවතින දිනය වනවිට උපයාගෙන ඇති Rewards ලකුණු අවලංගු කිරීමේ අයිතිය බැංකුව රඳවා ගනියි.

(k) උපයාගෙන ඇති, නිදහස් කරගෙන ඇති සහ එක්රැස් කරගෙන ඇති Rewards ලකුණු පිළිබඳ ඇතිවන යම් මතභේද, බැංකුව විසින් විමර්ශනය කරනු ලබන අතර, බැංකුව විසින් සෑහීමට පත්වන පරිදි අන්‍යාකාරයකින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ සම්බන්ධයෙන් වූ වගකීම කාඩ්පත් හිමියා විසින් දරනු ලැබිය යුතුය.

(l) විශේෂ ප්‍රවර්ධන යටතේ කාඩ්පත් හිමියා වෙත පිරිනමා ඇති Rewards ලකුණු, එම ප්‍රවර්ධන නීතිරීති සහ කොන්දේසිවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට, ප්‍රවර්ධනය අවසානයේ කාඩ්පත් හිමියා වෙත නිකුත් කරනු ඇත.

(m) මෙහි නීතිරීති සහ කොන්දේසි වල දක්වා ඇති කරුණු නොතකා, කාඩ්පත් ගිණුම් Rewards වැඩසටහනට සහභාගිවීමේ සුදුසුකම් ලැබීම සම්බන්ධයෙන් තීරණය කිරීමේ පරම අභිමතය සහ කිසිදු හේතුවක් නොදක්වා, ඕනෑම කාඩ්පත් ගිණුමක් සහ/හෝ කාඩ්පත් හිමියෙකු වැඩසටහනට සහභාගිවීමට නුසුදුසු බවට පමුණුවීමේ හිමිකම HSBC සතු වේ.

9.7 Mileage Rewards ලකුණු

කාඩ්පත් හිමියන් වෙත ගුවන් සැතපුම් පරිවර්තනය කිරීමේ පහසුකම පිරිනැමීම සඳහා බැංකුව විසින් කලින් කලට ගුවන් සමාගම්/සැතපුම් පරිවර්තනය කිරීමේ වැඩසටහන් සමඟ සැලසුම් කටයුතුවලට එළඹෙනු ඇති අතර, එකී ගුවන් සැතපුම් වැඩසටහන/වැඩසටහන් යටතේ Mileage Rewards ලකුණු සඳහා කාඩ්පත් හිමියන් හට ලියාපදිංචි වී Rewards ලකුණු ලෙස ගුවන් සැතපුම් නිදහස් කරගැනීම් පහත නීතිරීතිවලට යටත් ව සිදු කළ හැකි වේ;

(a) අදාළ ගුවන් සැතපුම් වැඩසටහන සඳහා Rewards ලකුණු පැවරීමෙන් පසුව, කාඩ්පත් හිමියන් සාමාජිකයන් වන්නා වූ අදාළ ගුවන් සැතපුම් වැඩසටහනේ නීතිරීති සහ කොන්දේසි මඟින් කාඩ්පත් හිමියන් බැඳී සිටියි.

(b) කාඩ්පත් හිමියා විසින් ඉල්ලීමක් කිරීමෙන් පසුව බැංකුව විසින් අදාළ ගුවන් සැතපුම් වැඩසටහන වෙත ගුවන් සැතපුම් ලකුණු ප්‍රමාණය පවරනු ලබන නමුත් කාඩ්පත් හිමියා ලියාපදිංචි වී තිබීම සහ ප්‍රමාණවත් Rewards ලකුණු ප්‍රමාණයක් ඉතිරිව තිබීම ඒ සඳහා අවශ්‍ය වේ. කාඩ්පත් හිමියාගේ ඉල්ලීම බැංකුව වෙත ලැබුණු දින සිට බැංකු වැඩකරන දින 14ක් ඇතුළත පැවරීම ක්‍රියාත්මක වේ.

(c) බැංකුව, ගුවන් සැතපුම් සේවා සපයන්නකු නොවන අතර, එම නිසා ගුවන් සැතපුම් වැඩසටහන් ක්‍රියාත්මක කරන හවුල්කාර ආයතනවල කාර්ය සාධනය හෝ සේවාව පිළිබඳව කිසිම වගකීමක් භාරගනු නොලැබේ.

(d) පොදු නිල වෙබ් අඩවිය වන www.hsbc.lk/rewards මගින් කාඩ්පත් හිමියා වෙත දැනුම් දී ඇති ගුවන් සැතපුම් පරිවර්තන අනුපාතිකයට අනුව, ගුවන් සැතපුම් පරිවර්තනය කෙරෙනු ඇත.

(e) කාඩ්පත් හිමියන් වෙත පූර්ව-දැනුම්දීමක් සහිතව, ගුවන් සැතපුම් පරිවර්තන අනුපාතිකය වෙනස් කිරීමේ හෝ අවශ්‍ය නම්, ගුවන් සැතපුම් නිදහස් කරගැනීමේ විකල්පය අවලංගු කිරීමේ අයිතිය බැංකුව රඳවා ගනියි.

(f) කාඩ්පත සම්බන්ධ කරමින්, ගුවන් සැතපුම් හවුල්කාර ආයතන විසින් පවත්වාගෙන යනු ලබන කිසිදු ප්‍රවර්ධන වැඩසටහනක් පිළිබඳ කිසිදු වගකීමක් බැංකුව විසින් දරනු නොලැබේ.

(g) ගුවන් සැතපුම් Rewards ලකුණු සඳහා කාඩ්පත් හිමියන් විසින් Rewards ලකුණු උපයා ගැනීම ඉහත 9.1 වගන්තිය යටතේ සඳහන් කර ඇති ආකාරයට සිදුකරනු ලබයි.

(h) ගුවන් සැතපුම් Rewards සඳහා ලියාපදිංචි වූ කාඩ්පත් හිමියන්ගේ Rewards ලකුණු, Rewards ලකුණු අවසන්වීම පිළිබඳ ඉහත වගන්තිය යටතේ සඳහන් කර ඇති ආකාරයට අවසන් වන්නේ ය.

(i) ගුවන් සැතපුම් නිදහස්කරගැනීම සඳහා Rewards ලකුණු 5,000ක් රැස්කර ගත යුතු වේ.

9.8 **CASHBACK වැඩසටහන**

(a) Cashback වැඩසටහන (මෙකී 9.8 වගන්තිය ඇතුළත මින් මතුවට 'ප්‍රවර්ධනය' ලෙස හැඳින්වේ) 2018 ජනවාරි 10 වැනි දින සිට (491014 අංකයෙන් ආරම්භ කරන කාඩ්පත් අංක හිමි) **නව** දේශීය HSBC Visa Platinum Cashback මූලික ක්‍රෙඩිට් කාඩ්පතක් ලබාගන්නා ගනුදෙනුකරුවන් වෙත සහ පවත්නා Rewards Platinum කාඩ්පත, Platinum Cashback කාඩ්පතකට පරිවර්තනය කිරීමේ විකල්පය තෝරාගනු ලබන වත්මන් Rewards Platinum කාඩ්පත් හිමියන් (මෙකී 9.8 වගන්තිය ඇතුළත මින් මතුවට 'වත්මන් කාඩ්පත් හිමියන්' ලෙස හැඳින්වේ) වෙත විවෘත වේ.

(b) වත්මන් HSBC Rewards Platinum ක්‍රෙඩිට් කාඩ්පත් හිමියකු විසින් එක්රැස් කර ඇති Rewards ලකුණු නිදහස් කරගැනීමෙන් අනතුරුව, අංක 0114472200 ඔස්සේ අපේ ඇමතුම් මධ්‍යස්ථානය වෙත හඬ ඉල්ලීමක් (voice request) ලබාදීම මගින් හෝ cashback/rebate (ශ්‍රීලංරු 1/-ක ට Rewards ලකුණු 3ක්) වශයෙන් එකී Rewards ලකුණු ක්‍රෙඩිට් කාඩ්පතට පවරන ලෙසට බැංකුව වෙත දැනුම්දීමෙන් ඔවුන්ගේ ක්‍රෙඩිට් කාඩ්පත, Platinum Cashback ක්‍රෙඩිට් කාඩ්පතකට පරිවර්තනය කරගත හැකිය.

(c) කාඩ්පත් හිමියා විසින් HSBC Visa Platinum Cashback ක්‍රෙඩිට් කාඩ්පත සක්‍රීය කළ දින සිට කැලැන්ඩර මාසයක් (උදා: 2021 ජනවාරි 01 සිට 31 දක්වා, 2021 පෙබරවාරි 01 සිට 29 දක්වා ආදී වශයෙන්) තුළ දී ඕනෑම වෙළෙඳ ආයතනයක දී (පහත "h" වගන්තියෙහි සඳහන් ගනුදෙනු හැර) වැය කළ මුදලින් 0.1%ක cashback/rebate සඳහා නව සහ වත්මන් කාඩ්පත් හිමියන් හිමිකම් ලබනු ඇත.

(d) තවද, නව සහ වත්මන් කාඩ්පත් හිමියන් විසින් ක්‍රෙඩිට් කාඩ්පත සක්‍රීය කළ දින සිට කැලැන්ඩර මාසයක් (උදා: 2025 ජනවාරි 01 සිට 31 දක්වා, 2025 පෙබරවාරි 01 සිට 28 දක්වා) තුළ, පහත "h" වගන්තියෙහි සඳහන් ගනුදෙනු හැර, **සුපිරි වෙළෙඳසැල්***, **ඉන්ධන පිරවුම්හල්*** සහ **ටෙලිසන්නිවේදන සේවා සපයන්නන්*** වන ඕනෑම වෙළෙඳ ආයතනයක දී හෝ ඕනෑම වෙළෙඳ මාර්ගගත ගෙවීම් ද්වාරයක (online payment portal) දී කාඩ්පත භාවිතයෙන් වැය කරනු ලබන සමස්ත වටිනාකම මත 10%ක cashback අතිරේක බෝනස් සඳහා කාඩ්පත් හිමියා හිමිකම් ලබනු ඇත. වැය කිරීමේ මාසික අවමය පිළිබඳ අවශ්‍යතාව සහ ලැබිය හැකි මාසික cashback/rebate උපරිමය පහත පරිදි වේ.

**බෝනස් cashback සඳහා වැය කිරීම් පහත පරිදි විය යුතු වේ**

| **සමස්ත වැයකිරීමේ මාසික අවමය (රු.)** (පහත "h" වගන්තියෙහි සඳහන් ගනුදෙනු හැර) | **බෝනස් cashback %** | **rebate උපරිමය (රු.)** |
|---|---|---|
| රු.25,000/- සිට ඉහළට | 10% | රු.1,000/- |
| | | **සුපිරි වෙළෙඳසැල්, ඉන්ධන සහ ටෙලිසන්නිවේදන සඳහා rebate සුදුසුකම්** |

*සැලකිය යුතුයි: 10% බෝනස් cashback ගණනය කරනුයේ සුපිරි වෙළෙඳසැල්, ඉන්ධනහල් සහ ටෙලිසන්නිවේදන සේවා සැපයුම්කරුවන් වෙතින් හෝ ඕනෑම වෙළෙඳ මාර්ගගත ගෙවීම් ද්වාරයක දී ක්‍රෙඩිට් කාඩ්පත භාවිතයෙන් කෙරෙන වැයකිරීම් මත පමණි. මෙම ප්‍රවර්ධනය සඳහා ලියාපදිංචි වන සියලුම වත්මන් HSBC Platinum ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් විසින් ක්‍රෙඩිට් කාඩ්පත පරිවර්තනය කළ දින (Credit Card Conversion Date) සිට අවම මාසික වැයකිරීමේ අවශ්‍යතාව සපුරාලිය යුතු වේ.*

**කීල්ස් සුපර් වෙළෙඳ ආයතන, කාර්ගිල්ස් ෆුඩ් සිටි, ආර්පිකෝ සුපර් සෙන්ටර්, ලංකා සතොස, ස්පා, ග්ලෝමාර්ක් සහ ලාෆ්ස් සන්අප් සුපිරි වෙළෙඳසැල් ඇතුළු සුපිරි වෙළෙඳසැල් වන නමුත් ඒට සීමා නොවේ (වෙළඳමහතුන්ගේ කාණ්ඩ කේත - 5411).*

*** ලංකා අයිඕසී, ලාෆ්ස් සහ සිපෙට්කෝ ඉන්ධන පිරවුම්හල් ඇතුළු ඉන්ධන පිරවුම්හල් වන නමුත් ඒට සීමා නොවේ ( වෙළඳමහතුන්ගේ කාණ්ඩ කේත - 5172, 5541, 5542, 5983).*

**** ඩයලොග්, මොබිටෙල්, එයාටෙල්, හච්, ලංකාබෙල්, ශ්‍රී ලංකා ටෙලිකොම් ඇතුළු ටෙලිසන්නිවේදන සේවා සැපයුම්කරුවන් වන නමුත්, ඒට සීමා නොවේ (වෙළඳමහතුන්ගේ කාණ්ඩ කේත – 4812, 4814, 4899).*

(e) පූර්ව-වශයෙන් තීරණය කරන ලද වෙළඳමහතුන්ගේ කාණ්ඩ කේත ("MCC") වෙත මුදල් ප්‍රතිදාන ලබා දෙනු ඇත්තේ VISA Worldwide Pte Limited (VISA) / Master Card Incorporated (MasterCards) සහ HSBC හි මගපෙන්වුම් මත පදනම් ව වේ. විශේෂිතව දක්වනු ලබන MCC යටතට නොවැටෙන කිසිදු ගනුදෙනුවක් මුදල් ප්‍රතිදාන ලැබීම සඳහා සුදුසුකම් නොලබයි.

(f) මූලික කාඩ්පත් හිමියාට ලබාදෙන ලද cashback වැඩසටහනටම, අතිරේක කාඩ්පත් හිමියා ද සුදුසුකම් ලබනු ඇත.

(g) Cashback/rebate ගණනය කිරීම පදනම් වන්නේ, එක් එක් කැලැන්ඩර් මාසයේ අවසාන දිනයේ දී දක්වනු ලබන, සුදුසුකම් ලත් කාඩ්පත් හිමියාගේ සුදුසුකම් ලත් සමස්ත මිලදී ගැනීම් මත ය. සිදුකරන ලද සුදුසුකම් ලත් සියලු ගනුදෙනු, එක් එක් කැලැන්ඩර මාසය අවසානයේ දී HSBC හි ක්‍රෙඩිට් කාඩ්පත් පද්ධතිවල දැක්විය යුතු වේ. වෙළෙඳ මහතුන් විසින් ප්‍රමාද වී ඉදිරිපත් කරනු ලබන මිලදී ගැනීම් සම්බන්ධයෙන් HSBC කිසිදු වගවීමක් භාර නොගනියි.

(h) පහතින් දක්වා ඇති ගනුදෙනු, Cashback වැඩසටහන/ප්‍රවර්ධන යටතේ **සුදුසුකම් නොලබනු ඇත**;

දේශීයව සහ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිදු කරන ලද, වෙළඳමහතුන්ගේ වාරික, මුදල් වාරික සැලසුම් කරන්නන්, ශේෂ පැවරුම්, මුදල් අත්තිකාරම්, බැංකු ගාස්තු සහ අයකිරීම්, කැසිනෝ, සූදු කෙළි සහ සූදු ගනුදෙනු ඇතුළු වාරික ගනුදෙනු, අතථ්‍ය ව්‍යවහාරික මුදල් ගනුදෙනු ආශ්‍රිත ගෙවීම් සහ Forex, විවිධ මාදිලියේ භාණ්ඩ අලෙවි කරන ආයතන ("Department stores") වශයෙන් කාණ්ඩගත කර ඇති වෙළඳ ආයතන, HSBC අන්තර්ජාල බැංකුකරණ සේවාවන් හරහා ගෙවීම් සිදු කරන ලද විදේශීය හෝ ඔන්ලයින් සහ උපයෝගීතා බිල්පත් ගෙවීම්.

(i) සුදුසුකම් ලත් මූලික සහ අතිරේක කාඩ්පත් හිමියන් විසින් උපයන ලද cashback/rebate, මූලික කාඩ්පත් හිමියාගේ ගිණුමට බැර කෙරෙනු ඇත.

(j) කැලැන්ඩර මාසයක දී මූලික සහ අතිරේක කාඩ්පත් හිමියන් විසින් උපයා ගත් සමස්ත cashback/rebate, ඊළඟට/අනතුරුව එළඹෙන කැලැන්ඩර මාසය අවසානයේ දී (උදාහරණයක් වශයෙන්, 2020 ජනවාරි 01-31 දක්වා සිදුකළ ඕනෑම ගනුදෙනුවක් සම්බන්ධයෙන් උපයා ගත් cashback/rebate බැර කෙරෙනුයේ 2020 පෙබරවාරි මාසයේ අවසාන සතියේ දී ය) මූලික කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමෙහි දක්වනු ඇත. Cashback/rebate තොරතුරු සනාථ කෙරෙන කෙටි පණිවුඩයක් (SMS) කාඩ්පත් හිමියා වෙත යවනු ඇති අතර, කාඩ්පත් හිමියාගේ ඊළඟ ප්‍රකාශන වල එකී cashback/rebate දැක්වෙනු ඇත.

(k) Cashback/rebate බැර කරනු ලබන අවස්ථාව වනවිට, HSBC හි පරම අභිමතය පරිදි තීරණය කෙරෙන අන්දමට සුදුසුකම් ලත් කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම මනා තත්ත්වයෙන් හා නිසි සහ තෘප්තිමත් ආකාරයෙන් පවත්වාගෙන තිබිය යුතු වේ. එකී ගිණුම වෙත cashback/rebate බැර කිරීමට පෙර, අදාළ ගිණුමේ ගෙවීම් පැහැර හැර ඇත්නම්, ස්වෙච්ඡාවෙන් හෝ නිතැතින්ම වසා ඇත්නම් හෝ අවසන්කර ඇත්නම් හෝ කිනම් හෝ හේතුවක් මත අත්හිටුවා ඇත්නම්, එවන් අවස්ථාවක දී cashback/rebate බැර නොකිරීමේ අයිතිය HSBC රඳවා ගනියි.

(l) ගිණුමක් වෙත බැර කරනු ලබන cashback/rebate මුදල, දශම ස්ථාන දෙකකින් කෙළවර වන අන්දමට ගණනය කෙරෙනු ඇත.

(m) කාඩ්පත් හිමියන්ගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට බැර කරනු ලබන යම් cashback/rebate මුදලක්, කාඩ්පත් හිමියන්ගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම වෙත කෙරෙන ගෙවීමක් ලෙස සලකනු නොලබන අතර, බැංකුව වෙත ගෙවිය යුතු වන අවම මුදලට එරෙහි පියවීමක් ලෙස එය භාවිත කළ නොහැකිය.

(n) මෙකී ප්‍රවර්ධනය, HSBC හි වෙනත් කිසිදු පාරිතෝෂිකයක් හෝ වෙනත් දීමනා සහ/හෝ ප්‍රවර්ධන සඳහා හුවමාරු කළ නොහැකිය.

(o) බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද වර්තමාන ගාස්තු ලේඛනයට අනුව, සියලු කාඩ්පත් හිමියන් සඳහා වාර්ෂික ගාස්තු සහ සම්බන්ධවීමේ ගාස්තු අය කෙරෙනු ඇත.

(p) කාඩ්පත් හිමියා සහභාගි වීමට තීරණය කරනු ලබන සහ/හෝ ප්‍රවර්ධනයට සුදුසුකම් ලබන අවස්ථාවේ සිට, HSBC ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා වන Rewards වැඩසටහනට ඔහු හෝ ඇය තවදුරටත් සුදුසුකම් නොලබයි. පසුගිය ගනුදෙනු සම්බන්ධයෙන් උපයාගත් Rewards ලකුණු නිදහස් කරගැනීම සඳහා කාඩ්පත් හිමියා වෙත සාධාරණ කාලයක් ලබාදෙනු ඇති අතර, සියලුම ඉදිරි ගනුදෙනු, ප්‍රවර්ධනය සඳහා සුදුසුකම් ලබනු ඇත.

(q) කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත නැති වූ හෝ සොරකම් කරන ලද අවස්ථාවක දී, ප්‍රතිස්ථාපනය කරන ලද කාඩ්පත භාවිතයෙන් මිලදී ගැනීම් සිදුකිරීමේ හැකියාව කාඩ්පත් හිමියාට ලැබෙන අතර, එසේ සිදුකරන ලද සියලු ගනුදෙනු ප්‍රවර්ධනය සඳහා සුදුසුකම් ලැබීම අඛණ්ඩව සිදුවනු ඇත.

(r) මතභේදාත්මක/ප්‍රතිවර්තිත/ආපසු ගෙවන ලද හෝ අවලංගු කරන ලද/ශූන්‍ය කරන ලද ගනුදෙනු, ප්‍රවර්ධනයෙන් බැහැර කෙරෙනු ඇත.

(s) කාඩ්පත් හිමියන් වෙත කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව, ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සුදුසුකම් ලබන ගනුදෙනු කාණ්ඩ සහ/හෝ cashback/rebate කාණ්ඩ වෙනස් කිරීමේ අයිතිය HSBC රඳවා ගනියි.

(t) කාඩ්පත් හිමියාගේ යෝග්‍යතාව, දින ආවරණය, මෙහි සඳහන් නීතිරීති සහ කොන්දේසි ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී, මෙම ප්‍රවර්ධනය හා බැඳුණු යම් හෝ සෑම කරුණක් පිළිබඳවම කිසියම් මතභේදයක් පැනනැගුනහොත්, එහිදී HSBC හි තීරණය අවසන් සහ අවසානාත්මක වනු ඇත.

(u) කාඩ්පත් හිමියන් වෙත කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව, ඕනෑම අවස්ථාවක දී සිය තනි අභිමතය පරිදි මෙම ප්‍රවර්ධනයට අදාළ වන නීතිරීති කිසිවක් වෙනස් කිරීමේ හිමිකම බැංකුව සතුව පවතින අතර, එකී වෙනස් කිරීම බලපැවැත්වෙන බවට ප්‍රකාශිත දිනයේ සිට එමගින් කාඩ්පත් හිමියන් පූර්ණ වශයෙන් බැඳී සිටියි. කෙසේ වෙතත්, එවැනි වෙනස් කිරීම්, ලිපියක් සහ/හෝ දේශීය පුවත්පත් දැන්වීමක් සහ/හෝ බැංකුවේ දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කිරීමක් සහ/හෝ ප්‍රකාශන සහ/හෝ බැංකුවේ නිල පොදු වෙබ්අඩවියෙහි ප්‍රකාශයට පත්කිරීම හරහා කාඩ්පත් හිමියන් වෙත සන්නිවේදනය කෙරෙනු ඇත.

(v) මෙහි අඩංගු කිසිවක් මගින් මේ හා සමාන ප්‍රවර්ධනයන් අනාගතයේ පැවැත්වීමට HSBC වෙතින් කැපවීමක් හෝ නියෝජනයක් නොකෙරේ.

(w) අන්‍යාකාරයකින් දක්වා නොමැති නම් මිස, මෙම ප්‍රවර්ධනය වෙනත් කිසිදු HSBC ක්‍රෙඩිට් කාඩ්පතක් සඳහා අදාළ නොවේ.

(x) වෙළෙඳ මහතුන් විසින් පිරිනමනු ලබන භාණ්ඩ සහ/හෝ සේවාව/සේවාවන් හි සැපයුම්කරු HSBC නොවන අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු වගවීමක් භාර නොගනියි.



PUBLIC

### 9.9 Cashback වැඩසටහන - HSBC Live+ ක්‍රෙඩිට් කාඩ්පත්

a) Cashback වැඩසටහන (මින් මතුවට " Live+ වැඩසටහන" ලෙස හැඳින්වේ) HSBC Live+ ක්‍රෙඩිට් කාඩ්පත භාවිතයට අදාළ වන අතර, 2024 අගෝස්තු 01 දින සිට දේශීය මූලික HSBC Live+ Cashback ක්‍රෙඩිට් කාඩ්පතක් ලබාගන්නා ගනුදෙනුකරුවන්ට පමණක් ලබාගත හැකි වනු ඇත.

b) ප්‍රකාශන කාලසීමාව (ගනුදෙනුකරුගේ ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රකාශනයෙහි ප්‍රකාශන කාලසීමාව නිශ්චිතව දැක්වෙනු ඇති අතර, මෙම කොටසෙහි මින් මතු "ප්‍රකාශන කාලසීමාව" ලෙස හැඳින්වේ) තුළ දක්වනු ලබන සුදුසුකම් ලත් සියලු ගනුදෙනු මත කාඩ්පත් හිමියා cashback උපයනු ඇති අතර, ඊළඟ ප්‍රකාශන චක්‍රයේ දී කාඩ්පතට එය බැර කෙරෙනු ඇත.

c) පහත 1 වගුවෙහි (පහත 9.9 f වගන්තියෙහි සඳහන් ගනුදෙනු සඳහා හැර) නිශ්චිතව දක්වා ඇති පරිදි, කිසිදු අවම වැය කිරීමකින් තොරව ඕනෑම වෙළෙඳ ආයතනයක දී වැය කරනු ලබන මුදල මත අසීමිත 0.1% cashback/rebate (මෙහි මින් මතු "Base Cashback" ලෙස හැඳින්වේ) සඳහා කාඩ්පත් හිමියා සුදුසුකම් ලබනු ඇත.

d) පහත 1 වගුවෙහි නිශ්චිතව දක්වා ඇති වැය කිරීමේ සීමාවන් සපුරාලීමට යටත්ව, පහත දක්වා ඇති වැය කිරීමේ කාණ්ඩ සම්බන්ධයෙන් සහ 9.9 e වගන්තියෙහි සඳහන් MCC සඳහා පමණක් කාඩ්පත් හිමියා 10% cashback (මෙහි මින් මතු "Accelerated Cashback" ලෙස හැඳින්වේ) සඳහා සුදුසුකම් ලබනු ඇත. පහත 9.9 f වගන්තියෙහි සඳහන් ගනුදෙනු සඳහා Accelerated Cashback ලබාගත නොහැකි අතර එම ගනුදෙනු ඉන් බැහැර කෙරෙයි.

Accelerated Cashback සඳහා සුදුසුකම් ලබන වැය කාණ්ඩයන්:

**a.** **ආහාර-පාන ගැනීම්** *

**b.** **සාප්පු සවාරි** **

**c.** **විනෝදාස්වාද ආශ්‍රිත ගනුදෙනු** ***

- ප්‍රකාශන කාලසීමාව උදෙසා වන Base Cashback සහ Accelerated Cashback සඳහා අවම වැය නිර්ණායකය සහ උපරිම cashback/rebate පහත 1 වගුවෙහි දක්වා ඇත.

**වගුව - 1 Cashback සහ Accelerated Cashback සඳහා වන වැය සීමාවන්**

| **Total Minimum Spend* for the Statement Period** ප්‍රකාශන කාලසීමාව සඳහා සමස්ත අවම වැය කිරීම* | **Cash back %** | **Cashback Category Cashback** කාණ්ඩය | **Transaction type** ගනුදෙනු වර්ගය | **Maximum rebate (Rs.) Rebate උපරිමය (රු.)** |
|---|---|---|---|---|
| No minimum spend අවම වැය කිරීමක් නැත | 0.1% | Base Cashback | Transactions excluding those in 9.9 (f) 9.9 (f) හි සඳහන් ගනුදෙනු හැර | Unlimited අසීමිතයි |
| LKR 25,000/- Above* රු. 25,000/- සිට ඉහළට* | 10% | Accelerated Cashback | Dinning * ආහාර-පාන ගැනීම් * Shopping ** සාප්පු සවාරි ** Entertainment related transactions*** විනෝදාස්වාද ආශ්‍රිත ගනුදෙනු *** only for the MCC defined in clause 9.9.e and excluding those in 9.9 (f) 9.9.e වගන්තියෙහි දක්වා ඇති MCC සඳහා පමණක් වන අතර, 9.9 (f) හි සඳහන් ගනුදෙනු ඉන් බැහැර කෙරේ | LKR 1,500/- ට |

*සැක මගහරවා ගැනීම පිණිස, ප්‍රකාශන කාලසීමාව සඳහා වන සමස්ත අවම වැය කිරීම රු. 25,000/- ට සාප්පු සවාරි, ආහාර-පාන ගැනීම්, විනෝදාස්වාද වැය කිරීම් සහ පහත 9.9 f වගන්තියෙහි වන ගනුදෙනු හැරෙන්නට අනෙකුත් සියලුම කාඩ්පත් ගනුදෙනු ඇතුළත් විය හැක.

e) වගුව 2 හි දී ඇති සුදුසුකම් ලත් වෙළෙඳ කාණ්ඩ කේත (Merchant Category Codes – MCC) සම්බන්ධයෙන් පමණක් අදාළ වනු ඇති අතර, ඒවා දී ලබා දී ඇත්තේ VISA හෝ මාස්ටර් කාඩ් යෝජනාක්‍රම මගින් නිකුත් කරන ලද මගපෙන්වුම් මත පදනම් ව වන අතර, ඒවා ශ්‍රී ලංකාවේ Merchant’s බැංකුව මගින් සකසනු ඇත.

**වගුව 2 - වෙළෙඳ කාණ්ඩ කේත (Merchant Category Codes – MCC) හිමි ව ඇති වෙළෙඳ මහතුන් පිළිබඳ උදාහරණ ද දක්වනු ඇත.**

වගුව - 2

| *Spend Category* වැය කාණ්ඩය | *Eligible MCC* සුදුසුකම් ලබන *MCC* | *Example of Merchants* වෙළෙඳ මහතුන් පිළිබඳ උදාහරණ |
|---|---|---|
| ** Dining* *ආහාර-පාන ගැනීම් | *5499<br>5811<br>5812<br>5814<br>7011<br>5462* | *Pizza hut<br>Dominos<br>Subway<br>Pickme food<br>Uber eats* |
| *** Shopping* ** සාප්පු සවාරි | *5094<br>5137<br>5139<br>5311<br>5331<br>5411<br>5611<br>5621<br>5631<br>5641<br>5651<br>5661<br>5691<br>5697<br>5698<br>5699<br>5712<br>5912<br>5941<br>5944<br>5945<br>5947<br>5948<br>5950<br>5977<br>5999<br>7296<br>7631* | *Odel<br>H & M<br>Cool Planet<br>Nolimit* |
| **** Entertainment* *** විනෝදාස්වාද | *7832<br>4899* | *PVR cinema<br>Scope Cinema<br>Netflix<br>Sportify* |



PUBLIC

f) පහත ගනුදෙනු, Live+ වැඩසටහන යටතේ **cashback (Base Cashback හෝ Accelerated Cashback) කිසිවක් ඉපැයීමට සුදුසුකම් නොලබනු ඇත**.

- වෙළෙඳ වාරික ඇතුළු වාරික ගනුදෙනු
- මුදල් වාරික සැලසුම්
- ශේෂය පැවරීම්
- මුදල් අත්තිකාරම්
- බැංකු ගාස්තු සහ අයකිරීම්
- කැසිනෝ, ක්‍රීඩා හෝ සූදු ගනුදෙනු ( දේශීයව හා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිදුකළ)
- අන්තර්ජාල ව්‍යවහාර මුදල් (virtual currency) ගනුදෙනු සහ ෆොරෙක්ස් (Forex) ගනුදෙනු ආශ්‍රිත ගෙවීම්.
- HSBC අන්තර්ජාල බැංකුකරණ සේවාවන් හරහා සිදු කළ උපයෝගීතා බිල්පත් ගෙවීම්

f) සුදුසුකම් ලබන ගනුදෙනුව, යෝග්‍යතාව හිමි කරගන්නේ එක් වර්ගයක cashback සඳහා පමණි එනම්, Base Cashback සඳහා හෝ Accelerated Cashback සඳහා ය.

g) සුදුසුකම් ලත් යම් ගනුදෙනුවක් ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රකාශනයෙහි ප්‍රතිවර්තනය කර තිබේ නම්, අනුරූපී cashback මුදල අහිමි වනු ඇත. අහිමි වූ cashback මුදල (පිරිනමන ලද cashback) එක්රැස් වූ cashback ඉක්මවයි නම්, එකී හිඟය, අනාගත cashback ඉපැයීම් වලින් අඩු කර ගනු ලබන අතර, කාඩ්පත් හිමියාගේ ඊළඟ පකාශනයෙහි ශුද්ධ rebate මුදල පෙන්නුම් කෙරෙනු ඇත.

h) ඉහත වගන්ති වල සඳහන් සුදුසුකම් නිර්ණායක සපුරාලීමට යටත් ව, ප්‍රකාශන කාලසීමාව තුළ මූලික සහ අතිරේක කාඩ්පත් හිමියන් විසින් වැය කරන ලද සමස්තය, අවස්ථාව අනුව, Base Cashback හෝ Accelerated Cashback සඳහා සැලකිල්ලට ගනු ඇත.

i) අවස්ථාව අනුව, Base Cashback හෝ Accelerated Cashback සඳහා උපචිත cash rebate, ඊළඟ ප්‍රකාශන කාලසීමාව තුළ මූලික කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිණුම වෙත බැර කෙරෙනු ඇත.

j) Cashback/rebate බැර කරනු ලබන අවස්ථාව වනවිට, HSBC හි පරම අභිමතය පරිදි තීරණය කෙරෙන අන්දමට සුදුසුකම් ලත් කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිණුම මනා තත්ත්වයෙන් හා නිසි සහ තෘප්තිමත් ආකාරයෙන් පවත්වාගෙන තිබිය යුතු වේ. එකී ගිණුම වෙත cashback/rebate බැර කිරීමට පෙර, අදාළ කාඩ්පත් ගිණුමේ ගෙවීම් පැහැර හැර ඇත්නම්, ස්වෙච්ඡාවෙන් හෝ නිතැතින්ම වසා ඇත්නම් හෝ අවසන්කර ඇත්නම් හෝ කිනම් හෝ හේතුවක් මත අත්හිටුවා ඇත්නම්, එවන් අවස්ථාවක දී cashback/rebate බැර නොකිරීමේ අයිතිය HSBC රඳවා ගනියි.

k) කාඩ්පත් ගිණුමකට බැර කරනු ලබන cashback/rebate මුදල ආසන්නතම රුපියල් වටිනාකමට ගණනය කෙරෙනු ඇත (උදාහරණ වශයෙන් rebate වටිනාකම ශත 50ට අඩු ප්‍රමාණයක් නම්, එය ආසන්නතම අඩු වටිනාකමට (rounded down), සකසනු ඇති අතර, rebate වටිනාකම ශත 50ක් හෝ ඊට වැඩි නම්, එය ආසන්නතම වැඩි වටිනාකමට (rounded up) සකසනු ඇත).

l) කාඩ්පත් හිමියන්ගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට බැර කරනු ලබන යම් cashback/rebate මුදලක්, කාඩ්පත් හිමියන්ගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම වෙත කෙරෙන ගෙවීමක් ලෙස සලකනු නොලබන අතර, බැංකුව වෙත ගෙවිය යුතු වන අවම මුදලට එරෙහි පියවීමක් ලෙස එය භාවිත කළ නොහැකිය. ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට ගාස්තු හෝ අය කිරීම් බිල්ගත කිරීම මගහරවා ගැනීම පිණිස, අවම වශයෙන් කාඩ්පත් හිමියා විසින් ප්‍රකාශනයෙහි ගෙවීමට නියමිත අවම මුදල හෝ පියවීම අවශ්‍ය කෙරෙයි.

m) කාඩ්පත් හිමියාගේ කාඩ්පත නැති වූ හෝ සොරකම් කරන ලද අවස්ථාවක දී, ප්‍රතිස්ථාපනය කරන ලද කාඩ්පත භාවිතයෙන් මිලදී ගැනීම් සිදු කිරීමේ හැකියාව කාඩ්පත් හිමියාට ලැබෙන අතර, එසේ සිදුකරන ලද සියලු ගනුදෙනු Live+ වැඩසටහන සඳහා සුදුසුකම් ලැබීම අඛණ්ඩව සිදුවනු ඇත

n) Cashback බැර කිරීමට පෙරාතුව HSBC Live+ ක්‍රෙඩිට් කාඩ්පතෙහි ශ්‍රේණිය ඉහළ නැංවීම, පහළ දැමීම හෝ වෙනස් සැලසුම් වර්ගයකට පරිවර්තනය කිරීම සිදු කළහොත පසුගිය ප්‍රකාශනයෙහි සිදු කරන ලද ගනුදෙනු සඳහා වන cashback උපයා ගැනීමට නව ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම හිමිකම් නොලබනු ඇත.

o) මතභේදාත්මක/ප්‍රතිවර්තිත/ආපසු ගෙවන ලද හෝ අවලංගු කරන ලද/ශූන්‍ය කරන ලද ගනුදෙනු, Live+ වැඩසටහන වෙතින් බැහැර කෙරෙනු ඇත.

p) කාඩ්පත් හිමියාගේ යෝග්‍යතාව, දින ආවරණය, මෙහි සඳහන් නීතිරීති සහ කොන්දේසි ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී, මෙම Live+ වැඩසටහන හා බැඳුණු යම් හෝ සෑම කරුණක් පිළිබඳවම කිසියම් මතභේදයක් පැන නැගුනහොත්, එහිදී HSBC හි තීරණය අවසන් සහ අවසානාත්මක වනු ඇත.

q) කාඩ්පත් හිමියන් වෙත පූර්ව දැනුම්දීමකින් යුතුව, Live+ සඳහා සුදුසුකම් ලබන ගනුදෙනු වර්ග සහ/හෝ cashback/rebate කාණ්ඩ සහ මෙහි අඩංගු නීතිරීති කිසිවක් ඕනෑම අවස්ථාවක දී වෙනස් කිරීමේ හිමිකම බැංකුව සතුව පවතින අතර, එකී වෙනස් කිරීම බලපැවැත්වෙන බවට ප්‍රකාශිත දිනයේ සිට එමගින් කාඩ්පත් හිමියන් පූර්ණ වශයෙන් බැඳී සිටියි. කෙසේ වෙතත්, එවැනි වෙනස් කිරීම්, කෙටි පණිවුඩ පද්ධති, ලිපියක් සහ/හෝ දේශීය පුවත්පත් දැන්වීමක් සහ/හෝ බැංකුවේ දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කිරීමක් සහ/හෝ ප්‍රකාශන සහ/හෝ බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය www.hsbc.lk හි ප්‍රකාශයට පත්කිරීම හරහා කාඩ්පත් හිමියන් වෙත සන්නිවේදනය කෙරෙනු ඇත.

r) වෙළෙඳ මහතුන් විසින් පිරිනමනු ලබන භාණ්ඩ සහ/හෝ සේවාව/සේවාවන් හි සැපයුම්කරු HSBC නොවන අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු වගවීමක් භාර නොගනියි.

## 10. දුරකථන, අන්තර්ජාල, කෙටි පණිවුඩ සේවාව (SMS) සහ විද්‍යුත් තැපැල් උපදෙස් සඳහා බලය ලබාදීම සහ හානිපූරණය

10.1 කාඩ්පත් හිමියා හෝ ඔහු/ඇය වෙනුවෙන් දුරකථනයෙන්, කෙටි පණිවුඩ සේවාව (“SMS”), පුද්ගලික අන්තර්ජාල බැංකුකරණ සේවාව (“PIB”), හෝ විද්‍යුත් තැපෑල භාවිතයෙන් (‘උපදෙස්’) උපදෙස් ලබාදෙන හෝ උපදෙස් ලබාදෙන බවට කියනු ලබන තැනැත්තාට බලය ලබා දුන්නේ ද නැද්ද යන්න පිළිබඳව හෝ එම තැනැත්තාගේ අනන්‍යතාවය පිළිබඳව බැංකුවේ පාර්ශ්වයෙන් විමසීමක් කිරීමකින් තොරව සහ එම උපදෙස් ලැබෙන අවස්ථාවේ දී පවත්නා අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමකින් තොරව එසේ දුරකථනයෙන්, කෙටිපණිවුඩ සේවාව (SMS), පුද්ගලික අන්ර්ජාල බැංකු සේවාව (PIB) හෝ විද්‍යුත් තැපෑල භාවිතයෙන් කලින් කල දෙනු ලබන හෝ දෙනු ලබන බවට සලකනු ලබන යම් නිවේදන, උපදෙස්, ඉල්ලා සිටීම් හෝ වෙනත් සන්නිවේදන ප්‍රකාරව විශ්වාසය තැබීමට සහ ඒ අනුව ක්‍රියාකිරීමට කාඩ්පත් හිමියා විසින් බැංකුවට අවසර දෙනු ලැබේ. බැංකුව කාඩ්පත් හිමියා සමඟ සන්නිවේදන කටයුතු සඳහා දුරකථන, SMS, PIB හෝ විද්‍යුත් තැපෑල භාවිත කරනු ලැබිය හැකිය. උපදෙස් අවසානාත්මක වශයෙන් ලැබෙන අවස්ථාවේ දී/දිනයේ දී කාඩ්පත් හිමියා විසින් බැංකුවේ රීති පිළිගනු ලැබිය යුතුය.

10.2 කාඩ්පත් හිමියා විසින් උපදෙස් සඳහා සම්පූර්ණයෙන් අවසර ලබා දී ඇති ලෙස සහ කාඩ්පත් හිමියා විසින් එම උපදෙස්වලින් සම්පූර්ණයෙන් බැඳී සිටින බවට සැලකීමට බැංකුවට හිමිකමක් ඇති අතර, ගනුදෙනුවේ හෝ ගිවිසුමේ ස්වාභාවය පිළිබඳව හෝ සම්බන්ධිත මුදල් ප්‍රමාණය පිළිබඳව නොසලකමින් සහ උපදෙස්වල නීතිරීතිවල යම් දෝෂයක්, අර්ථව්‍යාකූල බවක්, වැරදි අවබෝධයක් නොලසකමින්, උපදෙස් ලබාදී ඇත්තේ මුදල් ගෙවීමට හෝ යම් ගිණුමකට මුදල් හර කිරීමකට හෝ බැර කිරීමකට හෝ යම් මුදල් හෝ ලේඛන බැහැර කිරීමක් සම්බන්ධව හෝ වෙනත් ඕනෑම ආකාරයක ගනුදෙනුවක් හෝ වැඩපිළිවෙලක් මගින් බැංකුව සමග හෝ වෙනත් යම් තැනැත්තකු සමඟ කාඩ්පත් හිමියා බැඳීමකට පොරොන්දුවීමක් අදහස් කිරීම සම්බන්ධයෙන් වුවද, බැංකුව විසින් උචිත බවට සලකනු ලබන ආකාරයට උපදෙස් පිළිබඳ විශ්වාසය තබමින් සහ ඒ මත රඳා පවතිමින් යම් පියවර ගැනිම සඳහා බැංකුවට හිමිකමක් ඇත්තේ ය.

10.3 මෙම බලය පැවරීම පිළිබඳ නීතිරීති ප්‍රකාරව බැංකුව විසින් ක්‍රියාකිරීම හේතුවෙන්, උපදෙස්වලින් හෝ උපදෙස් සම්බන්ධයෙන් ඕනෑම ස්වාභාවයකින් හෝ ඕනෑම ආකාරයකින් බැංකුව විසින් දරන ලද හෝ වැය කරන ලද සියලු පාඩු, හිමිකම්, ක්‍රියාකාරකම්, නඩු කටයුතු, ඉල්ලාසිටීම්, අලාභ හානි, පිරිවැය සහ වියදම් බැංකුවට හානිපූරණය කරනු ලබන බවටත් ඒවාට එරෙහිව බැංකුව හානිපූරණයකර තබන බවටත් කාඩ්පත් හිමියා මෙයින් අවලංගු කළ නොහැකි ලෙස පොරොන්දු වී සිටිනු ලැබේ.

10.4 මෙම ගිවිසුම අවසන්කිරීම පිළිබඳ නිවේදනයක් ලැබුණහොත් සහ ලැබෙන තෙක් සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට සාධාරණ කාලයක් ලැබෙන තෙක් බලය ලබාදීම සහ හානිපූරණය බලාත්මකව පැවතිය යුතු අතර, ඉහත කී ආකාරයට එම ගිවිසුම අවසන්කිරීම හේතුවෙන් කාඩ්පත් හිමියා විසින් දෙන ලද බලය යටතේ දරන ලද යම් වගකීමකින් කාඩ්පත් හිමියා නිදහස් කිරීමක් සහ මෙම කාඩ්පත් හිමියාගේ ගිවිසුමේ නීතිරීති ප්‍රකාර ව ඉටුකරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධ හානිපූරණයෙන් කාඩ්පත් හිමියා නිදහස්වීමක් නොවිය යුතුය.

## 11. නිදහස් කිරීම සහ බැහැර කිරීම

11.1 යම් වෙළෙඳ ආයතනයක් විසින් කාඩ්පත ගරුකිරීම හෝ භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් හෝ කාඩ්පතේ සම්පූර්ණ සහ බලය දුන් ණය සීමාව සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් සහ වෙනත් යම් බැංකුවක ATM යන්ත්‍රයකින් මුදල් ආපසු ගැනීම් මගින් මුදල් අත්තිකාරම් ලබාගැනීමේ දී සම්පූර්ණ සහ බලය දුන් මුදල් අත්තිකාරම් සීමාව ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාරගනු නොලැබේ.

11.2 කාඩ්පත හෝ කාඩ්පත් අංකය භාවිත කරමින් ලබාගත් හෝ මිලදී ගනු ලැබූ යම් භාණ්ඩ සහ/හෝ සේවාවල යම් දෝෂයක් හෝ අඩුපාඩුවක් පිළිබඳව බැංකුව කිසිම වගකීමකට බැඳී නොසිටී. භාණ්ඩ සහ/හෝ සේවා අලෙවිය සඳහා හෝ පරිභෝජනය සඳහා ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ දැන්වීම්, පොත්, සඟරා, වාර සඟරා, තැපැල් ඇණවුම් ආකෘතිපත්‍ර, අත්පොත් හෝ වෙනත් යම් ලේඛනවල සඳහන් හෝ අන්තර්ගත ප්‍රකාශ, වචන, පින්තූර, හෝ වෙනත් නියෝජන සඳහා බැංකුව වගකියනු නොලැබේ. වෙළෙඳ ආයතනයට එරෙහිව වූ පැමිණිලි වෙළෙඳ ආයතනය සමඟ කාඩ්පත් හිමියා විසින් විසඳා ගනු ලැබිය යුතු අතර, වෙළෙඳ ආයතනයට එරෙහිව කාඩ්පත් හිමියා විසින් කරනු ලබන කිසිම හිමිකම්පෑමක් සඳහා වූ වගකීමෙන්, කාඩ්පත් හිමියන් සඳහා වන මෙම ගිවිසුම යටතේ කාඩ්පත් හිමියා විසින් බැංකුව නිදහස් කර තැබිය යුතුය.

11.3 පහත සඳහන් හේතු නිසා හෝ ඒවායින් උපචිත වන කවර ආකාරයේ අපහසුතාවක්, පාඩුවක්, අලාභයක් හෝ බාධාවක් සඳහා බැංකුව කිසිම ආකාරයෙන් වගකියනු නොලැබේ:-

(a) බැංකුවේ පාලනයෙන් බැහැර වූ හෝ වෙනත් යම් ආකාරයක ATM යන්ත්‍රයේ හෝ සන්නිවේදන පද්ධතියේ හෝ දත්ත සැකසුම් පද්ධතියේ හෝ සම්ප්‍රේෂණ සම්බන්ධතාවයේ හෝ වෙනත් ඕනෑම දෙයක හෝ හේතුවන යම් බාධාවක් හෝ බිඳවැටීමක් හෝ දෝෂයක්; හෝ

(b) කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිණුමේ බැරට ගෙවීම් සිදුකිරීම සඳහා බැංකුව හෝ වෙනත් සේවාස්ථාන ප්‍රයෝජනයට ගැනීම.

11.4 බැංකුව විසින් එක් එක් මාසයේ යම් දිනයක් ප්‍රකාශන දිනය සහ ගෙවීම් නියමිත දිනය ලෙස තෝරාගනු ලැබිය හැකිය. බැංකුව විසින් කාඩ්පත් හිමියාට ප්‍රකාශනයක් යැවීමට අපොහොසත් වුවද, ගෙවීමට නියමිත මූල්‍ය ගාස්තු ද ඇතුළුව කාඩ්පත් හිමියාගේ වගකීම දිගටම ක්‍රියාත්මක විය යුතුය.

11.5 කාඩ්පතෙහි අන්තර්ගත බහාලන ලද හෝ කේත කරන ලද යම් මුද්‍රිත හෝ වෙනත් ප්‍රතිඋත්පාදිත සංකේතයක් දරන යම් අලෙවි වවුචරයක්, ගනුදෙනුවක්, වාර්තාවක්, ණය වවුචරයක්, මුදල් වැයකිරීම් අණකරයක් සහ/හෝ වෙනත් යම් ගාස්තුවක් සඳහා ගෙවීම් කිරීමට බැංකුවට හිමිකමක් ඇත්තේ ය. කෙසේ වෙතත්, මෙම ක්‍රියාදාමයේ දී එවැනි ගෙවීම් වාර්තාවල අත්සන් හෝ අන්තර්ගතයන් හෝ සත්‍යාපනය කිරීමට බැංකුව බැඳී නොමැත.

11.6 සියලු ගනුදෙනු පිළිබඳ කාඩ්පත් ගිණුමේ සඳහන් බැංකු වාර්තා, විකුණුම් රිසිට්පත් සහ ප්‍රකාශන, සියලු කාර්යයන් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා පිළිබඳ තීරණාත්මක සහ බැඳීම් සහගත කරුණක් බවට කාඩ්පත් හිමියා පිළිගෙන සිටියි.

11.7 විශේෂ ප්‍රචාරණ / ප්‍රවර්ධන සම්බන්ධයෙන් වෙළෙඳ දැන්වීම්කරුවන් විසින් සපයනු ලබන සේවා, සැලසුම් හෝ ප්‍රතිලාභවල යම් පැහැර හැරීමක් හෝ අනිසි ප්‍රතිඵලයක් හේතුවෙන් උපචිතවන කිසිම ආකාරයක හිමිකම්පෑමක් සඳහා බැංකුව කිසිදු අයුරකින් වගකීමට බැඳී නොමැති අතර, වෙළෙඳ මහතුන් විසින් පිරිනමනු ලබන භාණ්ඩ හා සේවාවල සැපයුම්කරු බැංකුව නොවන බැවින් ඒ සම්බන්ධ කිසිදු වගකීමක් පිළිනොගන්නා බවට කාඩ්පත් හිමියා එකඟ වේ.

11.8 කාඩ්පත් ගිණුමේ ණය පහසුකම් තිබිය හැකි වුවද එය නොසලකා බැංකුව විසින් උචිත බවට සලකනු ලබයි නම් යම් ගනුදෙනුවක් ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ අයිතිය බැංකුව සතු වේ.

11.9 ගනුදෙනු නැවත නැවත සඳහන්වීම සම්බන්ධයෙන් වනවිට, ගනුදෙනු කාඩ්පත් ගිණුම හරවීම වැළැක්වීම සඳහා කාඩ්පත් හිමියා විසින් වෙළෙන්දාගේ අලුත් කිරීමේ ප්‍රතිපත්ති අවලංගු කිරීම සහ/හෝ වෙළෙඳ අලුත්කිරීමේ ප්‍රතිපත්ති අනුව ක්‍රියා කිරීම කළ යුතුය. වෙළෙඳ මහතාගේ අලුත්කිරීමේ ප්‍රතිපත්ති අවලංගු කිරීමට සහ/හෝ එම වෙළෙඳ මහතාගේ අලුත්කිරීමේ ප්‍රතිපත්තිවලට එකඟව ක්‍රියා කිරීමට කාඩ්පත් හිමියා විසින් අපොහොසත්වීම සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ.

ගනුදෙනු ප්‍රත්‍යාවර්තනය/නිත්‍ය නියෝග නොකඩවා සිදුකරගෙන යාම සහතික කිරීම සඳහා ගිණුම් හිමියා(හිමියන්) විසින් වෙළෙඳ මහතුන්/ආයතන වෙත සපයන ලද ක්‍රෙඩිට් කාඩ්පත් හිමියාට අදාළ ක්‍රෙඩිට් කාඩ්පත් අංකය, අවලංගු වන දිනය, පුද්ගලික තොරතුරු ආදිය ඇතුළු සියලු විස්තර සම්බන්ධයෙන් කිසියම් වෙනසක් ඇති වුවහොත් ඒ බව කාඩ්පත් හිමියා විසින් අදාළ වෙළෙඳ මහතුන්/ආයතන වෙත ලබාදිය යුතු වේ. ඉහත සඳහන් පරිදි වෙළෙඳ මහතුන්/ආයතන යාවත්කාලීන කිරීමට කාඩ්පත් හිමියා අපොහොසත් වුවහොත් ඒ සම්බන්ධ කිසිදු අනිසි ප්‍රතිඵලයක් හේතුවෙන් උපචිත වන කිසිම ආකාරයක හිමිකම්පෑමක් සඳහා බැංකුව කිසිදු අයුරකින් වගකීමට බැඳී නොමැත.

## 12. නෛතික පියවර

ඕනෑම හේතුවක් නිසා කාඩ්පත් හිමියන් සඳහා වන මෙම ගිවිසුමේ නීතිරීති සහ කොන්දේසිවලට එකඟව ක්‍රියාකිරීමට කාඩ්පත් හිමියා අපොහොසත් වුවහොත්, එවිට බැංකුව විසින් මෙම කාඩ්පත් ගිවිසුම අවසන්කර, ඒ යටතේ ගෙවීමට ඇති සියලු මුදල් අයකර ගැනීම සඳහා නඩු පවරනු ලැබිය හැකිය. සම්පූර්ණ හානිපූරණ පදනමකින් නීති ගාස්තු ද ඇතුළුව බැංකුව විසින් දරන ලද සියලු පිරිවැය, ගාස්තු සහ වියදම් සඳහා කාඩ්පත් හිමියා වගකියනු ලැබිය යුතුය.

## 13. විදේශ විනිමය රෙගුලාසි

13.1 විදේශ විනිමය පාලන පනතේ විධිවිධාන සහ නියාමකයන් සහ/හෝ ශ්‍රී ලංකා මහ බැංකුව ('විනිමය පාලන පනත') විසින් ඒ යටතේ සකසන ලද යටතේ මෙහෙයුම් උපදෙස්, රෙගුලාසි සහ නියෝගවලට අනුව ඔහු/ඇය විසින් සියලු අවස්ථාවල දී කාඩ්පත භාවිත කරනු ලබන බවට කාඩ්පත් හිමියා සහතික විය යුතු වේ.

13.2 ගමනාගමනය, නවාතැන්, වෛද්‍ය, ජීවන වියදම්, ලියාපදිංචි ගාස්තු ගෙවීම, විදේශ ආයතනකට හෝ අධ්‍යයන ආයතනයකට ගෙවිය යුතු පුද්ගලික ස්වාභාවයේ ගාස්තු සහ වාර්ෂික දායක මුදල්, විදේශයක දී පුද්ගලික භාවිතය සඳහා භාණ්ඩ මිල දී ගැනීම් සඳහා ගෙවීම්, පුද්ගලික ස්වාභාවයේ ගමනාගමන සහ සෞඛ්‍ය, රක්ෂණය සඳහා පමණක් රක්ෂණ වාරික සහ/හෝ සංචාරක වියදම්, හෝටල් ගාස්තු, ආනුශංගික වියදම්, වෛද්‍ය වියදම් සහ පුද්ගලික භාවිතය සඳහා භාණ්ඩ මිල දී ගැනීම සඳහා විදේශ ව්‍යවහාර මුදල් මඟින් බිල්පත්කරන ලද විද්‍යුත් තැපැල්, අන්තර්ජාල, දුරකථන හරහා සකස්කරන ලද ගනුදෙනු හා සම්බන්ධිත පුද්ගලික කටයුතු සඳහා පමණක් ගෙවීම් කිරීමට විදේශයන් හි දී කාඩ්පත හිමියා විසින් කාඩ්පත භාවිත කරනු ලැබිය යුතුය. වාණිජ ප්‍රමාණයන්ගෙන් ප්‍රාග්ධන ගනුදෙනු, විදේශ විනිමය ගනුදෙනු (Forex වෙළඳ ගනුදෙනු), ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදුකරන අනර්ථ ව්‍යවහාර මුදල් ගනුදෙනු ආශ්‍රිත ගෙවීම්, ඔට්ටු තැබීම්, සූදු ක්‍රීඩා සහ සූදු ක්‍රියාකාරකම් සහ ආනයනය කළ භාණ්ඩ මිලදී ගැනීම සඳහා වූ ගෙවීම් කිරීමට කාඩ්පත් භාවිත නොකල යුතුය. බඩුබාහිරාදිය තොගයක් සඳහා පිරිවැය රක්ෂණ ගාස්තු පදනම මත (C.I.F.) කලින් කල නියාමක විසින් ප්‍රකාශ කරනු ලබන උපරිමයක් දක්වා පුද්ගලික භාවිතය සඳහා භාණ්ඩ ආනයනය සඳහා කරනු ලබන ගෙවීම් සීමා කරනු ලැබේ. 'පුද්ගලික භාවිතය' යන්නෙන් කාඩ්පත් හිමියා විසින්, ඔහුගේ/ඇයගේ කලත්‍රයා, ළමුන් සහ දෙමාපියන් සඳහා කාඩ්පත භාවිතය අදහස් වන අතර, යම් වාණිජ අරමුණු සඳහා කාඩ්පත භාවිතය ඊට ඇතුළත් නොවේ.

13.3 ශ්‍රී ලංකා රුපියල් විදේශ ව්‍යවහාර මුදලක් බවට පරිවර්තනය කරනු ලබන්නා වූ ඉහත කී ආකාරයට ශ්‍රී ලංකාවේ සිට විදේශයක යම් ගනුදෙනුවක් සිදුකිරිම සඳහා කාඩ්පත් හිමියාගේ කාඩ්පත කිසියම් වෙනත් පාර්ශ්වයක් විසින් භාවිත කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් අවසර නොදිය යුතුය.

13.4 කාඩ්පත් හිමියා සංක්‍රමණය වන අවස්ථාවක දී, විදේශ රැකියාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යන අවස්ථාවක දී හෝ දැනට බලාත්මකව පවත්නා සහ කලින් කල සංශෝධනය කරනු ලබන විදේශ විනිමය පනතේ අර්ථනිරූපණයට අනුව 'අනේවාසික' තැනැත්තකු ලෙස සලකනු ලබන අවස්ථාවක දී කාඩ්පත් හිමියා විසින් ස්වකීය කාඩ්පත (කාඩ්පත්) බැංකුව වෙත භාරදිය යුතුය.

13.5 කලින් කල නිශ්චිතව දක්වනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය අධ්‍යක්ෂවරයාගේ හෝ වෙනත් යම් නියාමන අධිකාරීන්ගේ වාර්තා කිරීමේ නියමයන්ට එකඟව බැංකුව විසින් ක්‍රියාකරනු ලැබිය යුතුය.

13.6 අවසන් කිරීම සම්බන්ධයෙන් මෙම ගිවිසුමෙහි කුමන විධිවිධානයක් තිබුණද එය නොතකා, මෙම ගිවිසුම වහාම අවසන් කිරීමට සහ/හෝ අවලංගු කිරීමට සහ/හෝ කාඩ්පත (කාඩ්පත්) අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට එම අවස්ථාවේ පවත්නා විදේශ විනිමය විධිවිධානයන් /අවශ්‍යතා උල්ලංඝනය කර ඇති බවට විශ්වාස කිරීම සඳහා ඕනෑම ආකාරයක හේතුවක් පවතින අවස්ථාවක දී කාඩ්පත් හිමියාට දැනුම්දීමකින් තොරව ස්වකීය අභිමතය පරිදි කාඩ්පත (කාඩ්පත්) අවලංගු කිරීම බැංකුව විසින් කරනු ලැබිය හැකිය.

## 14. නීතිරීති වෙනස්වීම

14.1 මෙහි අන්තර්ගත නීතිරීති හා කොන්දේසි වෙනස් කිරීම/සංශෝධනය හෝ එකතු කිරීම බලාත්මක වීමට පෙරාතුව කාඩ්පත් හිමියාට ලිඛිතව (කඩදාසි සහ/හෝ SMS/EDM වැනි ඉලෙක්ට්‍රොනික සන්නිවේදන මාර්ග හරහා, හෝ බැංකුවෙහි පොදු වෙබ් අඩවියෙහි (www.hsbc.lk) ප්‍රකාශයට පත් කිරීම ද ඇතුළත්ව, බැංකුවට සුදුසු යැයි හැඟෙන වෙනත් ඕනෑම මාර්ගයකින් කලින් කල මෙහි අන්තර්ගත නීතිරීති වෙනස් කිරීම සඳහා හෝ අලුත් නීතිරීති සහ කොන්දේසි (මේ යටතේ පනවන ලද ගාස්තු සහ අයකිරීම් ප්‍රතිශෝධනය කිරීම හෝ අලුත් ගාස්තු සහ අයකිරීම් හඳුන්වාදීම යනාදියට සීමා නොවන්නා වූ දේ ද ඇතුළුව) හඳුන්වාදීම සඳහා බැංකුව විසින් අයිතිය තබාගනු ලැබේ. ඉහත කී එක් ආකාරයකින් හෝ සියලු ආකාරවලින් එම වෙනස් කිරීම බලාත්මක වන්නා වූ එකී දිනයෙන් පසුව කාඩ්පත වසා දමනු ලැබීම හෝ කාඩ්පත භාවිත කිරීම මගින් එම වෙනස්කිරීම වෙන්කර තැබීමකින් තොරව කාඩ්පත් හිමියා විසින් පිළිගෙන ඇති ලෙස සලකනු ලැබිය යුතුය. කාඩ්පත් හිමියා විසින් එම වෙනස්කිරීම/සංශෝධනය පිළිගනු නොලබයි නම්, එම වෙනස්කිරීම/සංශෝධනය බලාත්මකවන දිනයට පෙරාතුව යම් අතිරේක කාඩ්පත (කාඩ්පත් ද) සමඟ කාඩ්පත් හිමියා විසින් ස්වකීය කාඩ්පත අවලංගු කිරීම සඳහා බැංකුව වෙත භාරදිය යුතුය.

14.2 (මෙම ගිවිසුම අවසන් කළ ද එය නොතකා) කාඩ්පත් හිමියා විසින් ඔහුගේ/ඇයගේ කාඩ්පත සහ අතිරේක කාඩ්පත (කාඩ්පත්) සම්බන්ධ ගනුදෙනුවලට එරෙහිව බැංකුව හානිපූරණය කර තැබිය යුතුය.

## 15. තොරතුරු හෙළිදරව් කිරීම

15.1 බැංකුව විසින් බලය පවරා ඇති යම් තුන්වන පාර්ශ්වයකට, රජයේ ආයතනයකට සහ/හෝ බැංකුව විසින් උචිත බවට සලකනු ලබන නියාමකයන්ට කාඩ්පත් හිමියා හෝ අතිරේක කාඩ්පත් හිමියා (කාඩ්පත් හිමියන්) සම්බන්ධයෙන් හෝ ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ කාඩ්පත් ගිණුම (ගිණුම්) හා සම්බන්ධයෙන් වූ තොරතුරු හෙළිදරව් කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුවට බලය පවරා දෙනු ලැබේ. කාඩ්පත් හිමියා බැංකුව සමඟ කාඩ්පත (කාඩ්පත්) දරනු නොලබන කාලසීමාවක් සඳහා වුවද මෙම එකඟතාව බලාත්මක වන්නේ ය.

15.2 කාඩ්පත් හිමියා විසින් කාඩ්පත භාවිත කිරීම සහ කාඩ්පත් ගිණුම පිළිබඳ වාර්තා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සහ/හෝ දේශීය හෝ විදේශීය වෙනත් යම් ණය තොරතුරු කාර්යාංශයක් වෙත වාර්තා කිරීමට ස්වකීය අභිමතය පරිදි බැංකුවට හිමිකමක් ඇති බවට කාඩ්පත් හිමියා මෙයින් කැමැත්ත ලබා දී පිළිගෙන සිටියි.

## 16. හිලව් කිරීමේ අයිතිය සහ ඇපයක් වශයෙන් දරනු ලබන අරමුදල්

16.1 හිලව් කිරීමේ යම් සාමාන්‍ය අයිතිවාසිකම්වලට හෝ නීතිය මඟින් පවරා ඇති වෙනත් අයිතිවාසිකම් හෝ වෙනත් යම් ගිවිසුමකට අමතරව, දැනුම්දීමකින් තොරව කාඩ්පත් හිමියා සහ/හෝ අතිරේක කාඩ්පත් හිමියා (කාඩ්පත් හිමියන්) විසින් බැංකුව සමඟ පවත්වාගෙන යනු ලබන වෙනත් යම් ගිණුමක් (ගිණුම්) සමඟ කාඩ්පත් හිමියාගේ/කාඩ්පත් හිමියන්ගේ කාඩ්පත් ගිණුමේ සහ/හෝ අතිරේක කාඩ්පත් ගිණුමේ පවත්නා හිඟ අතිරික්ත මුදල එකතු කිරීම හෝ ඒකාබද්ධ කිරීම සහ එවැනි යම් ගිණුමක (ගිණුම්වල) බැරට පවතින මුදල් හිලව් කිරීමට හෝ පැවරීමට හෝ කාඩ්පත් හිමියන් සඳහා වන මෙම ගිවිසුම යටතේ කාඩ්පත් හිමියා විසින් බැංකුව කෙරෙහි ඇති වගකීම සපුරාලීම සඳහා යොදා ගැනීම බැංකුව විසින් කරනු ලැබිය හැකිය.

16.2 කාඩ්පත සැපයීමේ දී ඇපකරයක් වශයෙන් බැංකුවෙහි ගිණුමක යම් මුදලක් තැන්පත්කර තබන ලෙස කාඩ්පත් හිමියාට බැංකුව විසින් නියම කරනු ලැබිය හැකිය. මෙම ණය ශේෂයන්ට එරෙහිව කාඩ්පතේ පවතින හිඟ මුදල් හිලව්කර ගැනීමට බැංකුව අයිතිය තබාගනු ලැබේ. කාඩ්පත් හිමියා විසින් මෙම අරමුදල් වෙත ඕනෑම අවස්ථාවක දී පිවිසීමට අපේක්ෂා කරන්නේ නම්. ඔහු/ඇය විසින් ඒ පිළිබඳව බැංකුව වෙත කලින් දැනුම්දිය යුතු අතර, කාඩ්පත් හිමියාගේ ණය පවත්වාගෙන යෑමේ ක්‍රියාකලාපය මත පදනම්ව, බැංකුව විසින් ඒ පිළිබඳව තීරණයක් ගනු ලබනු ඇත. එකී අරමුණ සඳහා එවැනි ආකාරයකින් දරන ලද මුදල් නිදහස්කර ගැනීමට අනුමත කරනු ලැබීමෙන් පසුව ඒ සඳහා වැඩකරන දින හතළිස් පහ (45)ක් ගත විය හැකිය.

## 17. වාරික සහ ශේෂ පැවරීමේ සැලසුම්

HSBC හි වාරික සැලසුම් වැඩසටහන්, කාඩ්පත් ශේෂ පැවරීම් (Card Balance Transfer - CBT), කාඩ්පත් වාරික සැලසුම (Card Installment Plan - CIP) ආදිය, එකී වැඩසටහන් සඳහා කාඩ්පත් හිමියා සම්බන්ධ වන අවස්ථාවේ දී නිකුත් කරනු ලබන එකී වැඩසටහන් සඳහා ම වන නීතිරීති සහ කොන්දේසි මාලාව මඟින් පාලනය වේ. අදාළ වාරික සැලසුම ලබාගන්නා අවස්ථාවේ දී එකී නීතිරීති සහ කොන්දේසි හොඳින් කියවා, තේරුම්ගෙන, පිළිගත යුතු වේ.

17.1 මුදල් වාරික සැලසුම (Cash Installment Planner - CIP)

(a) මුදල් වාරික සැලසුම (Cash Installment Plan - CIP පහසුකම) කාඩ්පත් හිමියාට, ඔහුගේ/ඇයගේ ක්‍රෙඩිට් කාඩ්පත මත මුදල් අත්තිකාරම් පහසුකමක් ලබාගැනීමේ අවස්ථාව ලබා දේ.

(b) CIP පහසුකම වෙතින් ලබාදෙන මූලික ණය මුදලෙහි කොටසක් සහ බැංකුව විසින් තීරණය කරනු ලබන හැසිරවීමේ ගාස්තුවෙන් කොටසක් ද සමාන මාසික වාරික වශයෙන් කාඩ්පත් හිමියා වෙත හර කෙරෙනු ඇත. හැසිරවීමේ ගාස්තුව බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හි දැක්වෙන ගාස්තු ලේඛනයේ සඳහන් පරිදි වනු ඇත.

(c) කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පතට හර කරමින්, CIP පහසුකමෙහි මුදල, ශ්‍රී ලංකා රුපියල් වශයෙන් HSBC අයකැමි නියෝගයක් ('අයකැමි නියෝගය') ලෙසට සපයනු ඇත. කාඩ්පත් හිමියාගේ නමට අයකැමි නියෝගය නිකුත් කෙරෙනු ඇත.

(d) බැංකුව සමඟ ලියාපදිංචි කර ඇති ක්‍රෙඩිට් කාඩ්පත් හිමියාගේ තැපැල් ලිපිනයට අයකැමි නියෝගය බෙදා හරිනු ලැබේ. කාඩ්පත් හිමියා විසින් අයකැමි නියෝගය ලබාගැනීමේ දී කාඩ්පත් හිමියාට සිදුවිය හැකි කිසියම් ප්‍රමාදයක් සම්බන්ධයෙන් වන ඍජු හෝ ආනුෂංගික පාඩු හෝ අලාභ හානි පිළිබඳව බැංකුව වගකියනු නොලැබේ.

(e) කාඩ්පත් හිමියා විසින් CIP පහසුකමක් ලබාගෙන ඇති විටෙක, අවම ගෙවීම තුළ අඩංගු වනු ඇත්තේ CIP පහසුකම යටතේ වන මාසික වාරිකය සහ කාඩ්පත මත ගෙවීමට ඇති ශේෂයෙන් 4% යන සංකලනයකි. අවම ගෙවීම, නොගෙවා සිටීම ඔබේ කාඩ්පත් ගිණුමට ගාස්තු අයකිරීමට හේතු වනු ඇත.



PUBLIC

(f) CIP පහසුකම වෙතින් ලබාදුන් මූලික මුදල සහ අදාළ හැසිරවීමේ ගාස්තුව දක්වා කාඩ්පත් ගිණුමෙහි ණය සීමාව අඩු කෙරෙනු ඇති අතර, මාසික වාරික බිල්ගත කරන විට සහ ඊළඟ මාසවල දී ගෙවීම සිදුකරන විට, ඒ අනුව ඉහළ නැංවීම සිදු කෙරෙනු ඇත.

(g) CIP පහසුකම මත වන වාරික කිසිවක් කාඩ්පත් හිමියා විසින් ගෙවීම පැහැර හැරියහොත්, CIP පහසුකම සඳහා ගෙවීමට ඇති මුදල නියමිත කාලයට පෙර වසා අවසන්කර, ගෙවීමට ඇති සම්පූර්ණ මුදල ක්‍රෙඩිට් කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිණුමට හර කිරීමේ අයිතිය බැංකුව සතු වේ.

(h) අතිරික්ත වන ආකාරයට කාඩ්පත සඳහා සිදු කරනු ලබන ගෙවීම්, බිල්ගත නොකරන ලද වාරිකවලට එරෙහි ස්වයංක්‍රීය සැකසීමක් නොවන අතර, එය CIP පහසුකම සඳහා සිදු කළ පූර්ව ගෙවීමක් වශයෙන් සලකනු නොලැබේ.

(i) නියමිත කාලයට පෙර CIP පහසුකම සම්පූර්ණයෙන් පියවීමට කාඩ්පත් හිමියා අදහස් කරන අවස්ථාවක දී, කාඩ්පත මත ඇති CIP පහසුකම අවසන් කිරීම සම්බන්ධයෙන් ඔහුගේ/ඇයගේ අදහස බැංකුව වෙත ලිඛිතව දන්වා සිටිය යුතු වේ. නියමිත කාලයට පෙර සිදු කරනු ලබන එවැනි වසා දැමීමක දී, ගෙවීමට නියමිතව ඉතිරිව තිබෙන CIP පහසුකමෙහි මූලික මුදල මත, නියමිත කාලයට පෙර පියවීමේ ගාස්තුවක් අය කෙරෙනු ඇත. නියමිත කාලයට පෙර සිදුකරන එවැනි පියවීම් සඳහා වන ගාස්තු බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හි දැක්වෙන ගාස්තු ලේඛනයේ සඳහන් පරිදි වනු ඇත.

17.2 කාඩ්පත් ශේෂය හැරවීමේ සැලසුම (Card Balance Conversion Plan - CBC)

(a) ආයතනික ක්‍රෙඩිට් කාඩ්පත් හැර, බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් හට මෙම සැලසුම ලබාගත හැකි වේ.

(b) ගනුදෙනුව මිලදී ගත් දින සිට දින අනූව (90)ක් ඇතුළත දී පමණක් කිසියම් ගනුදෙනුවක් කාඩ්පත් ශේෂය හැරවීමේ සැලසුම (CBC) බවට හැරවිය හැකිය.

(c) අවම ගනුදෙනු වටිනාකම ශ්‍රීලංරු. 25,000/-ක් විය යුතු අතර, උපරිම ගනුදෙනු වටිනාකම ශ්‍රීලංරු. 400,000/-ක් වේ.

(d) ක්‍රෙඩිට් කාඩ්පත මත වන අවම ගෙවීම තුළ අඩංගු වනු ඇත්තේ මාසික වාරිකය සහ කාඩ්පත මත ගෙවීමට ඇති ශේෂයෙන් 4% යන සංකලනයකි. අවම ගෙවීම, නොගෙවා සිටීම අදාළ කාඩ්පත් ගිණුමට සාමාන්‍ය ගාස්තු අයකිරීමට හේතු වනු ඇත.

(e) කාඩ්පත් ශේෂය හැරවීමේ සැලසුමට අදාළ මුදල සහ සමස්ත හැසිරවීමේ ගාස්තුවට සමාන අනුරූපී මුදල කාඩ්පත් සීමාවෙන් අවහිර කෙරෙනු ඇත.

(f) ගනුදෙනුව, බැංකුව විසින් තීරණය කරනු ලබන සුළු හැසිරවීමේ ගාස්තුවක් යටතේ මාස 3, 6, 12 හෝ 24 ක මාසික වාරික සැලසුමක් බවට හැරවිය හැකිය. එකී හැසිරවීමේ ගාස්තු මුදල බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හි දැක්වෙන ගාස්තු ලේඛනයේ සඳහන් පරිදි වනු ඇත.

(g) සමස්ත ගනුදෙනුව සඳහා මුද්දර ගාස්තු අය කෙරෙනු ඇත.

(h) HSBC Rewards පිරිනමනු ලබන්නේ සමස්ත ගනුදෙනු වටිනාකම සඳහා ය.

(i) නියමිත කාලයට පෙර ශේෂය හැරවීමේ සැලසුමෙහි ඇති සම්පූර්ණ ශේෂය පියවීමට කාඩ්පත් හිමියා අදහස් කරන අවස්ථාවක දී, කාඩ්පත් ගිණුම මත ඇති ශේෂය හැරවීමේ සැලසුම අවසන් කිරීම සම්බන්ධයෙන් ඔහුගේ/ඇයගේ අදහස බැංකුව වෙත ලිඛිතව දන්වා සිටිය යුතු වේ. නියමිත කාලයට පෙර සිදු කරනු ලබන එවැනි වසා දැමීමක දී, ගෙවීමට නියමිතව ඉතිරිව තිබෙන ශේෂය හැරවීමේ සැලසුමෙහි මූලික මුදල මත, නියමිත කාලයට පෙර පියවීමේ ගාස්තුවක් අය කෙරෙනු ඇත. එකී නියමිත කාලයට පෙර පියවීමේ ගාස්තුව බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හි දැක්වෙන ගාස්තු ලේඛනයේ සඳහන් පරිදි වනු ඇත.

17.3 කාඩ්පත් ශේෂ පැවරීමේ පහසුකම (Card Balance Transfer Facility)

(a) කාඩ්පත් ශේෂ හුවමාරු පහසුකම **(Card Balance Transfer Facility – CBT)** කාඩ්පත් හිමියන් හට ලබාගත හැකි වේ.

(b) CBT පහසුකම සඳහා අදාළ වන විශේෂ මාසික පොලී අනුපාතය/අනුපාත, කාඩ්පත මත සිදුකරන ලද අනෙකුත් ශේෂ/ගනුදෙනු සඳහා අදාළ නොවනු ඇත.

(c) CBT පහසුකම වෙතින් ලබාදුන් මුදල දක්වා කාඩ්පත් ගිණුමෙහි ණය සීමාව අඩු /අවහිර කෙරෙනු ඇති අතර, මාසික වාරික බිල්ගත කරන විට සහ ඊළඟ මාසවල දී ගෙවීම සිදුකරන විට, ඒ අනුව ඉහළ නැංවීම සිදු කෙරෙනු ඇත.

(d) CBT පහසුකම මත වන වාරික කිසිවක් කාඩ්පත් හිමියා විසින් ගෙවීම පැහැර හැරියහොත්, අදාළ වන පරිදි වෙනත් ගාස්තු ද සමග CBT පහසුකම සඳහා ගෙවීමට ඇති සමස්ත මුදල නියමිත කාලයට පෙර වසා අවසන්කර, ගෙවීමට ඇති සමස්ත මුදල ක්‍රෙඩිට් කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිණුමට හර කිරීමේ අයිතිය බැංකුව සතු වේ.

(e) අතිරික්ත වන ආකාරයට කාඩ්පත සඳහා සිදු කරනු ලබන ගෙවීම්, CBT පහසුකම සඳහා බිල්ගත නොකරන ලද වාරිකවලට එරෙහි ස්වයංක්‍රීය සැකසීමක් නොවන අතර, එය CBT පහසුකම සඳහා සිදු කළ පූර්ව ගෙවීමක් වශයෙන් සලකනු නොලැබේ.

(f) CBT පහසුකම සඳහා අදාළ සියලුම වාරික කාඩ්පත් ගිණුමෙහි දැක්වීමට පෙර, කාඩ්පත් හිමියා විසින් ඔහුගේ ක්‍රෙඩිට් කාඩ්පත අවසන් කරන්නේ නම්, හිඟ ව පවතින CBT මුදල, එක් ඒකාබද්ධ මුදලක් ලෙසට කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

17.4 කාඩ්පත් වාරික සැලසුම (Card Instalment Plan – CIP)

(a) කාඩ්පත් වාරික සැලසුම (Cash Instalment Plan) (මෙහි මින් මතු "වාරික සැලසුම" යනුවෙන් හැඳින්වෙන), බැංකුව විසින් ආයතනික ක්‍රෙඩිට් කාඩ්පත් හැර, බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් වෙත ලබාදෙනු ලබයි.

(b) බැංකුවේ පූර්ණ අභිමතය පරිදි කාඩ්පත් හිමියා වෙත සති දෙක (02)ක පූර්ව දැනුම්දීමකින් යුතුව ඕනෑම අවස්ථාවක දී වාරික සැලසුම අස්කරගැනීමේ අයිතිය බැංකු රඳවා ගනියි.

(c) වාරික සැලසුම සඳහා සුදුසුකම් ලැබීම සම්බන්ධයෙන්, HSBC විසින් සිය පරම අභිමතය පරිදි අවම/උපරිම මිලදී ගැනීමේ මුදලක් දක්වා සිටිනු ඇති බවට කාඩ්පත් හිමියා එකඟ වේ.

(d) අයිතමයක විකුණුම් මිල තීරණය කරනු ලබන්නේ වෙළෙඳ මහතාගේ පූර්ණ අභිමතය පරිදි වන අතර, අයිතමය සිය අවශ්‍යතාවන් සපුරාලන බවට කාඩ්පත් හිමියා තෘප්තිමත් විය යුතු අතර, අයිතමයේ/අයිතමවල විකුණුම් මිල සහ/හෝ තත්ත්ය සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව පැන නැගෙන කිසිදු මතභේදයක් හෝ වගවීමක් සම්බන්ධයෙන් බැංකුව වගවීමට ලක් නොකළ යුතු වේ.

(e) වාරික සැලසුම කාඩ්පත් හිමියා වෙත ලබාදීම, කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමෙහි ලබාගත හැකි ශේෂයට සහ වාරික සැලසුම කාඩ්පත් හිමියා විසින් භාවිත කිරීම බැංකුව විසින් පිළිගැනීමට විෂය වේ.

(f) එක් එක් වාරික මුදල කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට මාසික පදනම මත හර කෙරෙනු ඇති අතර, ගනුදෙනුවක් වශයෙන් ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමෙහි ඇතුළත් කෙරෙනු ඇති බැවින්, එක් එක් වාරිකය එකාකාරයකින් සැලකීමට ගෙන ගනුදෙනු කිරීමේ ගාස්තුවක් ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමෙන් අය කෙරෙනු ඇති අතර, ඒ ආකාරයෙන් ම කාඩ්පත් හිමියා විසින් එය ගෙවනු ඇත.

(g) වාරිකය (වාරික) මත පොලී අයකිරීම වැළැක්වීම පිණිස ගෙවීම් නියමිත දිනයේ හෝ ඊට පෙර, කාඩ්පත් හිමියා විසින් වාරික මුදල ද ඇතුළුව ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රකාශනයේ දැක්වෙන සම්පූර්ණ හිඟ මුදල ගෙවිය යුතු වේ. ඔහු/ඇය විසින් ඔහුගේ/ඇයගේ කාඩ්පත වෙත සිදුකරන ලද ගෙවීම්, කාඩ්පත් හිමියන් සඳහා වන නීතිරීති සහ කොන්දේසිවල (කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම) සඳහන් ගෙවීමේ අනුපිළිවෙළට අනුව අදාළ කෙරෙන බව කාඩ්පත් හිමියා පිළිගනියි.

(h) බැංකුව වෙත ලිඛිතව දැනුම්දීම මඟින්, ඕනෑම අවස්ථාවක කාඩ්පත් හිමියා විසින් ඒ වනවිට වාරික සැලසුම යටතේ හිඟව පවත්නා සියලුම වාරික බැංකුව වෙත ගෙවිය හැකි වේ.

(i) වාරික සැලසුම ක්‍රියාත්මක වෙමින් පවතින කිසියම් අවස්ථාවක දී පැහැර හැරීම හෝ යුතුකම් පැහැර හැරීම හෝ හිඟ මුදල් නොගෙවීම නිසා කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත අවලංගු කර/අවසන්කර/අවහිරකර/අලුත් නොකර/සීමාව ඉක්මවා හෝ ඇත්නම්, පූර්ව දැනුම්දීමකින් තොරව, වහාම සමස්ත හිඟ වාරිකයන් හිඟව හා කාඩ්පත් හිමියා විසින් ගෙවීමට නියමිත වන අතර, සම්මත පොලී අනුපාතික/ගාස්තු/අයකිරීම්වලට විෂය වේ.

(j) වාරික සැලසුම සම්බන්ධයෙන් වන මෙම නීතිරීති සහ කොන්දේසි කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමෙහි අඩංගු කොන්දේසිවලට අමතරව වන අතර, ඊට අඩුවීමක් වශයෙන් නොවේ. මෙම පිරිනැමීම කාඩ්පත් හිමියන් සඳහා වන විශේෂ පහසුකමක් වන අතර, මෙහි අඩංගු කිසිවක් කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමෙහි නීතිරීතිවලට අගතියක් හෝ බලපෑමක් හෝ නොකරයි.

(k) වාරික සැලසුම ලබාගැනීම සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා හට විඳින්නට, උසුලන්නට, හෝ දරන්නට සිදුවන සියලු පාඩු, හිමිකම්, ක්‍රියාකාරකම්, නඩු කටයුතු, ඉල්ලාසිටීම්, අලාභ හානි, පිරිවැය සහ වියදම් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියන් HSBC වගකීමට හෝ වගවීමට ලක් නොකළ යුතු වේ.

(l) පූර්ව දැනුම්දීමකින් තොරව, කලින් කලට මෙම නීතිරීති සහ කොන්දේසි සංශෝධනය කිරීමේ අයිතිය බැංකු විසින් රඳවා ගන්නා අතර, බැංකුවට සුදුසු යැයි හැඟෙන ආකාරයකින් (බැංකු ශාඛාවන්, නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හි ප්‍රදර්ශනය කිරීම ද ඇතුළත්ව) එකී සංශෝධන පිළිබඳව කාඩ්පත් හිමියා වෙත දැනුම් දෙනු ඇත. එකී සංශෝධන කිසිවක් බලාත්මක වන දිනය වනවිට වාරික සැලසුම යටතේ හිඟව පවත්නා සියලු වාරිකවල මුදල පියවා නොමැති නම්, කාඩ්පත් හිමියා එකී සංශෝධනවලින් බැඳී පවතින්නේය.

(m) මතභේද ද ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී, මෙම පිරිනැමීම හා සම්බන්ධ සියලු කරුණු වලදී, බැංකුවේ තීරණය අවසානාත්මක වන අතර, මෙම පිරිනැමීමට සම්බන්ධ සියලුම කාඩ්පත් හිමියන් එමඟින් බැඳී සිටිනු ලබයි.

(n) සියලු සන්නිවේදන යොමු කළ යුතු වන්නේ, කළමනාකරු කාඩ්පත් මෙහෙයුම්, HSBC කාඩ්පත් මධ්‍යස්ථානය, අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01 වෙත ය.

## 18. රක්ෂණ පැකේජයන්

18.1 කාඩ්පත් හිමියා විසින් ආපසු පැමිණීමේ ගුවන් ටිකට්පතේ සමස්ත වටිනාකම ම කාඩ්පත් ගිණුමට පවරනු ලබයි නම්, බැංකුව විසින් ලබාගත් රක්ෂණ ඔප්පුවේ නීතිරීති සහ කොන්දේසි ප්‍රකාර ව අදාළ අවස්ථාවල දී චාරිකා රක්ෂණය සඳහා කාඩ්පත් හිමියා ආවරණය කරනු ලැබිය යුතුය. මෙම රක්ෂණ ඔප්පුව යටතේ වූ හිමිකම් ගෙවීම සඳහා රක්ෂණ සමාගම/සංස්ථාව පරම වශයෙන් වගකිවයුතු බවත් හිමිකම් වන්දි මුදල් සකස්කිරීම සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ වෙනත් කිසිම ක්‍රමයකින් බැංකුව වගකීමට බැඳී නොමැති බවත් කාඩ්පත් හිමියා විශේෂයෙන්ම පිළිගෙන සිටියි. බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දී කාඩ්පත් හිමියාට පූර්ව දැනුම්දීමක් සිදුකිරීමකින් තොරව මෙම රක්ෂණ ඔප්පුව සහ එහි ප්‍රතිලාභ ඉවත්කරගනු ලැබිය හැකිය.

18.2 ලබාගැනීමේ පහසුකම් බැංකුව විසින් සලස්වා ඇති සියලු රක්ෂණ ප්‍රතිලාභ අදාළ රක්ෂණ සමාගම හෝ සංස්ථාව විසින් අදාළ කරගනු ලබන නීතිරීති සහ කොන්දේසිවලට යටත් විය යුතුය.

18.3 ගෙවීම් නොකිරීම, යම් පොරොන්දුවක් කඩකිරීම හෝ රක්ෂණ සමාගමේ/ සංස්ථාවේ සේවාවන් හා සම්බන්ධයෙන් වූ යම් පැහැර හැරීමක් හේතුවෙන් හෝ එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ඕනෑම ආකාරයේ හිමිකම්පෑමක් සඳහා බැංකුව කාඩ්පත් හිමියා වෙත වගකියනු නොලැබේ.

18.4 යම් හේතුවක් නිසා බැංකුව විසින් කාඩ්පත් ගිණුම අවලංගුකර හෝ අවසන්කර හෝ අවහිරකර ඇති වසාදමා ඇති අවස්ථාවක දී කාඩ්පත පිළිබඳව වූ රක්ෂණ ආවරණයන් අවසන් වන්නේය.



PUBLIC

## 19. කාඩ්පත් හිමියන්ගේ තොරතුරු එකතුකිරීම, සැකසුම හා බෙදා-හදාගැනීම

**එකතුකිරීම**

19.1 HSBC හො HSBC සමූහයෙහි වෙනත් සාමාජිකයන් කාඩ්පත් හිමියාගේ තොරතුරු කාඩ්පත් හිමියා, කාඩ්පත් හිමියාගේ ගනුදෙනු, කාඩ්පත් හිමියා විසින් HSBC හි සැලසුම් හා සේවාවන් භාවිතය සහ HSBC සමූහය සමග කාඩ්පත් හිමියාගේ සම්බන්ධය පිළිබඳ අදාළ තොරතුරු ද ඇතුළත්ව) එකතුකිරීම, භාවිත කිරීම හා හුවමාරු කරගැනීම සිදුකළ හැක. පාරිභෝගික තොරතුරු කාඩ්පත් හිමියා වෙතින් ඉල්ලා සිටිය හැකි අතර, නැතහොත් වෙනත් මූලාශ්‍රයකින් (පොදුවේ ලබාගත හැකි තොරතුරු ද ඇතුළත්ව) HSBC හෝ HSBC සමූහයේ වෙනත් සාමාජිකයෙකු වෙත ලබාගත හැකිව ඇති වෙනත් තොරතුරු සමග උත්පාදිත හෝ සම්බන්ධිතව HSBC විසින් හෝ HSBC සමූහයේ සාමාජිකයෙකු විසින් හෝ ඒ වෙනුවෙන් එකතුකර ගත හැකිය.

**සැකසුම**

19.2 HSBC සහ/හෝ HSBC සමූහයේ සාමාජිකයෙකු විසින් පහත දැක්වෙන අරමුණු සඳහා කාඩ්පත් හිමියන්ගේ තොරතුරු සැකසීම, මාරුකිරීම, හා හෙළිදරව් කිරීම සිදුකරනු ඇත. (a) කාඩ්පත් හිමියා විසින් ඉල්ලා සිටින ලද හෝ අවසර දෙන ලද යම් ගනුදෙනුවක් සඳහා සේවාවන් සැපයීම (b) අනුකූලව ක්‍රියාකිරීමේ බැඳීම් ඉටුකිරීම (c) මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් සිදුකිරීම (d) කාඩ්පත් හිමියා වෙතින් අයවිය යුතු යම් මුදලක් එකතුකර ගැනීම (e) ණය පරීක්ෂා සිදුකිරීම හා ණය තොරතුරු ලබාගැනීම හෝ සැපයීම (f) HSBC හෝ HSBC සමූහයෙහි සාමාජිකයෙකුගේ අයිතීන් බලාත්මක කිරීම හෝ ආරක්ෂා කිරීම (g) HSBC හෝ HSBC සමූහයෙහි අභ්‍යන්තර මෙහෙයුම් අවශ්‍යතා සඳහා (ණය හා අවදානම් කළමනාකරණය, පද්ධති හෝ නිපැයුම් සංවර්ධනය හා සැලසුම් කිරීම, රක්ෂණය, විගණනය හා පරිපාලන අරමුණු ද ඇතුළත්ව, ඊට සීමා නොවී) (h) කාඩ්පත් හිමියා සමග HSBC හි සමස්ත සම්බන්ධතාව පවත්වාගෙන යාම (මූල්‍ය සේවා හෝ ඊට අදාළ සැලසුම් කාඩ්පත් හිමියා වෙත අලෙවිය හෝ ප්‍රවර්ධනය කිරීම සහ වෙළඳපොළ සමීක්ෂණ ද ඇතුළත්ව) ('අරමුණු').

**බෙදා-හදා ගැනීම**

19.3 HSBC විසින් (අරමුණ සඳහා අවශ්‍ය වන පරිදි හා සුදුසු පරිදි) පහත ලැබුම්කරුවන් වෙත පාරිභෝගික තොරතුරු මාරුකිරීම හෝ හෙළිදරව් කිරීම කළ හැකි බවට සේවාවන් භාවිත කිරීම මඟින් කාඩ්පත් හිමියා එකඟ වෙයි. (අරමුණු සඳහා කාඩ්පත් හිමියන්ගේ තොරතුරු සැකසීම, හුමාරුකිරීම හා හෙළිදරව් කිරීම ඔවුන් විසින් ද සිදු කළ හැකිය):

(a) HSBC සමූහයේ ඕනෑම සාමාජිකයෙකු;

(b) HSBC සමූහයේ යම් උප-කොන්ත්‍රාත්කරුවෙකු, නියෝජිතයෙකු, සේවා සපයන්නෙකු, හෝ සම්බන්ධිත ආයතනයක් (ඔවුන්ගේ සේවකයින්, අධ්‍යක්ෂවරුන් හා නිලධාරීන් ඇතුළත්ව);

(c) කාඩ්පත් හිමියා, ගෙවීම් ලැබුම්කරුවන්, අර්ථලාභීන්, ගිණුම් නාමිකයින්, අතරමැදි හා නියෝජිත බැංකු, නිශ්කාශන ආයතන, නිෂ්කාශන හෝ පියවීමේ පද්ධති, වෙළඳපොළ ප්‍රතිපාර්ශ්වයන්, රඳවාගැනීමේ නියෝජිතයින්, හුවමාරු හෝ වෙළඳ මූලාශ්‍ර කොටස් හුවමාරු, කාඩ්පත් හිමියාට සුරැකුම්පත් (කාඩ්පත් හිමියා වෙනුවෙන් HSBC විසින් එම සුරැකුම්පත් දරන අවස්ථාවක දී) පිළිබඳ අයිතියක් ඇති සමාගම් වෙනුවෙන් ක්‍රියාකරන යම් කිසිවෙකු;

(d) සේවාවන් හි දී හෝ සේවාවන් සම්බන්ධයෙන් අයිතියක් ලබාගන්නා හෝ අවදානමක් භාරගන්නා යම් පාර්ශ්වයක්;

(e) ණය තොරතුරු ලබාගැනීම හා සපයාදීම සඳහා වන වෙනත් මූල්‍ය ආයතන, ණයවර යොමු නියෝජිත ආයතන, හෝ ණය තොරතුරු කාර්යාංශ, විගණකවරුන්/බදු උපදේශකවරුන්;

(f) කාඩ්පත් හිමියා වෙත වත්කම් කළමනාකරණ සේවාවන් සපයන යම් තෙවන පාර්ශ්වයක අරමුදල් කළමනාකරුවෙකු;

(g) HSBC විසින් හඳුන්වාදීම් හෝ තොරතුරු සපයන යම් හඳුන්වාදීමේ අතරමැදියෙකු;

(h) පිහිටි ස්ථානය කොතැන වුවද, යම් HSBC ව්‍යාපාර හුවමාරුකිරීම්, බැහැර කිරීම්, ඒකාබද්ධවීම් හෝ අත්පත් කරගැනීම් හා සම්බන්ධයෙන්, සේවාවන් සපයනු ලබන බලප්‍රදේශයන් හා සමානව යම් මට්ටමක ආරක්ෂාවක් සපයන දත්ත ආරක්ෂණ නීති නොමැති බලප්‍රදේශයන් හි පිහිටා තිබුණ ද, ඒවා ද ඇතුළත්ව.

**කාඩ්පත් හිමියාගේ බැඳීම**

19.4 HSBC වෙත හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකු වෙත සපයා ඇති කාඩ්පත් හිමියාගේ තොරතුරුවල යම් වෙනසක් සිදුව ඇත්නම් කලින් කලට, කවර අවස්ථාවක දී වුවද දින තිහ (30)ක් තුළ වහාම HSBC වෙත ලිඛිත ව දැනුම් දීමට ද HSBC හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකු වෙතින් ලැබෙන යම් ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමට ද කාඩ්පත් හිමියා එකඟ වෙයි.

19.5 සෑම සම්බන්ධිත තැනැත්තෙකු / ඔවුන් විසින් HSBC හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකු වෙත තොරතුරු (පෞද්ගලික තොරතුරු හෝ බදු තොරතුරු ඇතුළත් ව) සපයා ඇති යම් තැනැත්තෙකු වෙත මෙම නීතිරීතිවල දක්වා ඇති ආකාරයට ඔවුන්ගේ තොරතුරු සැකසුම, හෙළිදරව් කිරීම හා මාරු කිරීම සම්බන්ධව දන්වා ඇති බව හා එකඟ වී ඇති බව කාඩ්පත් හිමියා තහවුරු කරයි. සිය පෞද්ගලික දත්තවලට ප්‍රවේශවීමට සහ ඒවා නිවැරදි කිරීමට එම සම්බන්ධිත තැනැත්තන් / වෙනත් යම් තැනැත්තන්ට අයිතිය ඇති බවට කාඩ්පත් හිමියා ඔවුන් වෙත උපදෙස් දිය යුතුය.

19.6 යම් අවස්ථාවක:

- HSBC විසින් සාධාරණව ඉල්ලා සිටින කාඩ්පත් හිමියාගේ තොරතුරු සපයා දීමට කාඩ්පත් හිමියා අපොහොසත් වුවහොත්, හෝ අරමුණු සඳහා තොරතුරු සැකසුම, මාරුකිරීම හෝ හෙළිදරව් කිරීමට HSBC විසින් අවශ්‍ය කෙරෙන යම් කැමැත්ත පළකිරීමක් කාඩ්පත් හිමියා විසින් රඳවා ගතහොත් හෝ ඉවත් කරගතහොත්, හෝ
- මූල්‍ය අපරාධයක් සිදුකිරීමේ හැකියාව පිළිබඳව HSBC හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකුට සැක පහළ වන අවස්ථාවක දී, හෝ කාඩ්පත් හිමියා වෙතින් HSBC සමූහයේ සාමාජිකයෙකු වෙත මූල්‍ය අපරාධයක් සිදුකිරීමේ අවදානමක් ඇතිවන අවස්ථාවක දී,

HSBC පහත පරිදි කටයුතු කළ හැකිය:

(a) කාඩ්පත් හිමියා වෙත සේවාවන් සියල්ලම හෝ ඉන් කොටසක් හෝ දිගින් දිගටම සැලසීම හෝ නව සේවාවන් හෝ සැලසීමට නොහැකි විය හැකි අතර, කාඩ්පත් හිමියා සමග වන සිය ව්‍යාපාරික සබඳතාව වහාම අවසන් කිරීමේ අයිතිය රඳවා ගැනීම.

(b) අනුකූලතා බැඳීම් සපුරා ලීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග HSBC හෝ HSBC සමූහයේ සාමාජිකයකු විසින් ගනු ලැබීම; සහ/හෝ

(c) කාඩ්පත් හිමියාගේ ගිණුම (ගිණුම්) අවහිර කිරීම, මාරු කිරීම හෝ වසා දැමීම වහා සිදු කිරීම.

## 20. දත්ත ආරක්ෂාව

20.1 දේශීය බලප්‍රදේශයේ හෝ විදේශයක දත්ත ආරක්ෂක ව්‍යවස්ථාවකට අනුකූලව ක්‍රියාකරන අවස්ථාවක දී සියලුම HSBC සමූහ සාමාජිකයින්, ඔවුන්ගේ කාර්ය මණ්ඩලය හා තෙවන පාර්ශවයන් යටත් වන දැඩි රහස්‍ය හා ආරක්ෂක ආචාරධර්ම පද්ධතියක් මඟින් කාඩ්පත් හිමියන්ගේ තොරතුරු ආරක්ෂා කෙරෙනු ඇත.

## 21. මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්

21.1 මූල්‍ය අපරාධ නිරීක්ෂණය, විමර්ශනය හා වැළැක්වීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් ඇති නීති රෙගුලාසි සම්බාධක රෙජීමයන්, ජාත්‍යන්තර මඟපෙන්වුම්, HSBC සමූහයේ අභ්‍යන්තර ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි සහ/හෝ යම් බලධාරියෙකු වෙතින් ලැබෙන ඉල්ලීම්වලට අනුකූලව ක්‍රියා කිරීමට HSBC සහ HSBC සමූහයේ යම් සාමාජිකයන් (සිය තනි හා පූර්ණ අභිමතය යටතේ) සුදුසු යැයි සිතන යම් පියවර ගත යුතු වන අතර, එසේ පියවර ගනු ඇත. ('මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකරකම්').

එම පියවරවලට, (a) යම් උපදෙසක්, සන්නිවේදනයක්, මුදල් ඉපදවීමේ ඉල්ලීමක්, සේවාවන් සඳහා අයදුම් කිරීමක් හෝ කාඩ්පත් හිමියා විසින් හෝ ඔහු වෙනුවෙන් යවන ලද හෝ ලබන යම් ගෙවීමක් නිරීක්ෂණය, හසුකරගැනීම හා විමර්ශනය කිරීම (b) අරමුදල්වල මූලාශ්‍රය හෝ අරමුණු කරන ලද ලැබුම්කරුවන් පිළිබඳව විමර්ශනය කිරීම (c) කාඩ්පත් හිමියාගේ තොරතුරු HSBC සමූහය සතුව ඇති අනෙකුත් අදාළ තොරතුරු හා සම්බන්ධ කිරීම සහ/හෝ (d) ඇතැම් පුද්ගලයෙකු හෝ ආයතනයක් සම්බන්ධයෙන් ඔවුන් සම්බාධක රෙජීමයකට යටත් වන්නේ ද යන්න වැඩිදුර විමසීම් කිරීම හා කාඩ්පත් හිමියාගේ අනන්‍යතාව හා තත්ත්වය තහවුරු කරගැනීම ඇතුළත් විය හැකි නමුත්, ඊට සීමා නොවේ.

21.2 ව්‍යාතිරේක ලෙස, HSBC විසින් මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් භාරගැනීම මඟින් යම් ගෙවීමක් සිදුකිරීම හෝ නිෂ්කාශනය, කාඩ්පත් හිමියාගේ උපදෙස් සැකසුම හෝ සේවාවන් සඳහා අයදුම් කිරීම හෝ සේවාවන් සියල්ල හෝ එයින් කොටසක් සැපයීම ප්‍රමාද වීම, අවහිර කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදුවිය හැක. නීතියෙන් අවසර ඇති ප්‍රමාණයට, මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කිසියම් ආකාරයකින් කාඩ්පත් හිමියාට හෝ තෙවන පාර්ශ්වයකට පැන නගින, විඳින්නට හෝ දරන්නට සිදුවන යම් අලාභයක් සඳහා HSBC හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකු කාඩ්පත් හිමියා වෙත හෝ යම් තෙවන පාර්ශ්වයක් වෙත වගකීමට ලක් නොවනු ඇත.

21.3 බැංකුවෙහි අදාළ නීති, නියාමන වලට අනුව සහ කලින් කලට පවත්නා බැංකුවේ ප්‍රතිපත්ති වලට අනුව නිකුත් කරන ලද ක්‍රෙඩිට් කාඩ්පත් භාවිතයෙන් කාඩ්පත් හිමියා විසින් වර්චුවල් ව්‍යවහාර මුදල් (virtual currencies), ක්‍රිප්ටෝ ව්‍යවහාර මුදල් (crypto currencies), බිට්කොයින්ස් (bitcoins) ඇතුළුව නමුත් ඊට සීමා නොවී මිලදී ගැනීම, විකිණීම සහ/හෝ භාවිතය සහ/හෝ ෆොරෙක්ස් වෙළෙඳාම (forex trading), ප්‍රාග්ධන ගනුදෙනු සහ විදේශ මුදල් පැවරීම් සිදුකිරීම නොකළ යුතු වේ.

## 22. බදු අනුකූලතාව

අදාළ බැඳීම් පැන නගින සහ HSBC විසින් හෝ HSBC සමූහයේ සාමාජිකයින් විසින් සපයන ගිණුම (ගිණුම්) හෝ සේවාවන් විවෘත කිරීමට අදාළව සියලුම බලප්‍රදේශයන් තුළ දී කාඩ්පත් හිමියාගේ බදු බැඳීම් (බදු ගෙවීම හෝ අදාළ සියලු බදු ගෙවීම සම්බන්ධයෙන් ඇති ලේඛන හෝ වෙනත් දෑ සම්පූර්ණ කිරීම සහ භාරදීම ද ඇතුළත් ව) වටහාගැනීම හා ඊට අනුකූලව ක්‍රියාකිරීම සඳහා කාඩ්පත් හිමියා/කාඩ්පත් හිමියන් සම්පූර්ණයෙන් වගකිව යුතු වන බව කාඩ්පත් හිමියා/කාඩ්පත් හිමියන් විසින් පිළිගනියි. සෑම සම්බන්ධිත තැනැත්තෙකුම (සිය පෞද්ගලික තත්ත්වයෙන් නොව) සම්බන්ධිත තැනැත්තෙකුගේ තත්ත්වයෙන් ක්‍රියාකරමින් තමන් සම්බන්ධයෙන් එම පිළිගැනීම ම සිදුකරයි. සම්බන්ධිත තැනැත්තාගේ හෝ කාඩ්පත් හිමියාගේ වාසභූමිය, නේවාසික ස්ථානය, පුරවැසි භාවය හෝ සංස්ථාපිත කිරීම නොසලකා, සමහර රටවල දේශසීමාවෙන් බාහිර බලපෑම් සහිත බදු ව්‍යවස්ථාවන් පැවතිය හැක. HSBC හෝ HSBC සමූහයේ කිසිදු සාමාජිකයෙකු විසින් බදු උපදේශනය සපයනු නොලැබේ. ස්වාධීන නීතිමය හා බදු උපදෙස් සපයා ගන්නා ලෙස කාඩ්පත් හිමියා වෙත උපදෙස් දෙමු. ගිණුම (ගිණුම්) විවෘත කිරීම හා භාවිත කිරීම සහ HSBC විසින් හෝ HSBC සමූහයේ සාමාජිකයින් විසින් සපයනු ඇති සේවාවන් සම්බන්ධයෙන් විශේෂයෙන් අදාළ වන බැඳීම් ද ඇතුළත්ව කිසිදු බලප්‍රදේශයක පැන නගිනු ඇති කාඩ්පත් හිමියාගේ බදු බැඳීම් සම්බන්ධයෙන් HSBC හෝ HSBC සමූහයේ කිසිදු සාමාජිකයෙකු වෙත වගකීමක් නොමැත.

## 23. විවිධ

23.1 මෙම නීතිරීතිවල සහ වෙනත් යම් සේවාවක, සැලසුමක, ව්‍යාපාරික සම්බන්ධතාවයක, ගිණුමක, හෝ කාඩ්පත් හිමියා හා HSBC අතර ඇති ගිවිසුමක ඇති කිසිවක් අතර කිසියම් ගැටීමක් හෝ අනනුකූලතාවයක් ඇතිවන අවස්ථාවක දී, මෙම නීතිරීති බලාත්මකව පවතිනු ඇත. කාඩ්පත් හිමියන්ගේ තොරතුරු සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වෙතින් ලැබී ඇති දැනටමත් පවතින යම් කැමැත්ත පළකිරීමක්, බලය දීමක්, HSBC විසින් ඉල්ලා සිටි අයිතීන් අතහැරීමක් හා අවසර දීමක් අදාළ දේශ නීතිය මගින් අවසර ලැබෙන ප්‍රමාණයට පූර්ණ බලය සහ බලපැවැත්වීම සහිතව අඛණ්ඩව අදාළ වනු ඇත.

23.2 කිසියම් ආකාරයකින් යම් බලප්‍රදේශයක නීතිය යටතේ මෙම නීතිරීතිවල ඇති ප්‍රතිපාදන සියල්ලම හෝ ඉන් කොටසක් හෝ නීතිවිරෝධී, අවලංගු හෝ බලාත්මක කළ නොහැකි වුවහොත් එමගින් වෙනත් යම් බලප්‍රදේශයක එම ප්‍රතිපාදනවල හෝ එම බලප්‍රදේශයේ මෙම නීතිරීතිවලින් ඉතිරියෙහි නීත්‍යානුකූල භාවයට, වලංගුතාවයට හෝ බලාත්මක කළහැකි බවට බලපෑමක් හෝ හානියක් සිදු නොවනු ඇත.

## 24. අවසන් කිරීමෙන් පසුව පැවැත්ම

මෙම නීතිරීති ඒවා අවසන් කිරීමෙන් පසුව ද, HSBC හෝ HSBC සමූහයෙහි සාමාජිකයෙකු විසින් කාඩ්පත් හිමියා වෙත යම් සේවාවන් සැපයීම අවසන් කිරීමකින් හෝ යම් කාඩ්පත් හිමි ගිණුමක් වසා දැමීමෙන් පසුව ද අඛණ්ඩව අදාළ වනු ඇත.

## 25. නීතිය සහ අධිකරණ බලය

මෙම ගිවිසුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිය මඟින් සහ නීතිය ප්‍රකාරව පාලනය වන සහ පාලනය වන බව අවබෝධකරගත යුතු අතර කාඩ්පත් හිමියා/කාඩ්පත් හිමියන් එකී ශ්‍රී ලංකා ජනරජයේ අධිකරණවල අනන්‍ය අධිකරණ බලයට ස්ථිර ලෙස ම මෙයින් යටත් වන්නේ ය. නීතිය අනුව, රජයේ රෙගුලාසි මඟින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන උපදෙස්වලට අනුව අවශ්‍ය වේ නම්, මෙම ගිවිසුමේ නීතිරීති සහ කොන්දේසි නිරායාසයෙන් ම සංශෝධනය වීමට යටත් වන්නේ ය. කාඩ්පත සහ කාඩ්පත් ගිණුම වලංගු සහ නීත්‍යානුකූල කාර්ය සඳහා පමණක් භාවිත කරනු ලැබිය හැකිය. කාඩ්පත හෝ කාඩ්පත් ගිණුම කාඩ්පත් හිමියා විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් වෙනත් යම් කාර්යයක් සඳහා භාවිත කරයි නම් හෝ/භාවිත කිරීමට අවසර ලබාදෙයි නම්, එවැනි භාවිතය සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වගකිවයුතු අතර, එවැනි භාවිතයක් හේතුවෙන් බැංකුව හෝ MasterCard හෝ Visa International විසින් කරන ලද සියලු මුදල් හෝ වියදම් බැංකුව සහ MasterCard International හෝ Visa International වෙත ප්‍රතිපූරණය කරන ලෙස කාඩ්පත් හිමියාට නියම කරනු ලැබිය හැකිය.

## 26. පොදු කරුණු

26.1 (a) කාඩ්පත් හිමියා විසින් ඔහුගේ/ඇයගේ අයදුම්පත මඟින් ලබාදී ඇති තොරතුරු ද ඇතුළුව නමුත්, ඊට සීමා නොවී, සේවානියුක්තිය වෙනස්වීම සහ/හෝ ඔහුගේ/ඇයගේ පදිංචි ලිපිනය සහ දුරකථන අංක ('සම්බන්ධ කරගැනීමේ විස්තර') වෙනස්වීම පිළිබඳව ද වහාම බැංකුව වෙත ලිඛිතව දැනුම්දිය යුතුය. කාඩ්පත් ඉල්ලුම්පත්‍රයේ ඇති සම්බන්ධ කරගැනීමේ විස්තර සම්බන්ධ කරගැනීමේ නවතම විස්තර ලෙස බැංකුව විසින් සලකනු ලැබේ. මෙම වගන්තියෙහි දක්වා ඇති පරිදි, කාඩ්පත් ඉල්ලුම්පත්‍රයේ ඇති සම්බන්ධ කරගැනීමේ නව තොරතුරු ප්‍රතියෝජනය කිරීම හා එසේ පවත්වාගෙන යාම, තොරතුරු වෙනස්වීම පිළිබඳව බැංකු වෙත දැනුම්දීමේ දී සිදු කෙරෙනු ඇත.

(b) කාඩ්පත් හිමියා වෙත කරනු ලබන යම් නිවේදනයක් හෝ කාඩ්පත් හිමියා සමඟ කරනු ලබන යම් ලිපි හුවමාරුවක් බැංකුව වෙත කාඩ්පත් හිමියා විසින් සපයා ඇති අලුත්ම ලිපිනයට භාරදිය යුතු අතර ඒවා දින හත (07)ක කාලයක් ඇතුළත කාඩ්පත් හිමියා වෙත ලැබී ඇති ලෙස සලකනු ලැබේ.

26.2 කාඩ්පත් හිමියාගේ එකඟතාවකින් තොරව, බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දී ඕනෑම පුද්ගලයකු වෙත සිය අයිතීන් හෝ වගකීම් පැවරීම හෝ මාරු කිරීම කළ හැකි අතර, බැංකුව විසින් අවසානයට දන්නා ලද කාඩ්පත් හිමියාගේ ලිපිනය වෙත හෝ බැංකුවට සුදුසු යැයි හැඟෙන ඕනෑම ඉලෙක්ට්‍රොනික සන්නිවේදන නාලිකාවක්/මාධ්‍යයක් හරහා හෝ පැවරුම්ලාභියාගේ සම්බන්ධ වීමේ විස්තර, කාඩ්පත් ගිණුම මත හිඟව පවතින මුදල්, සහ පැවරුම්ලාභියාගේ ගෙවීම් විස්තරය, බැංකුව විසින් අනුයුක්ත කිරීම හෝ පැවරීම සම්බන්ධයෙන් දින හත (7)ක් ඇතුළත කාඩ්පත් හිමියා වෙත දැනුම් දීම කාඩ්පත් ගිණුමේ ඇති හිඟ මුදල් අයකරගැනීම සඳහා තුන්වන පාර්ශ්වයක එකතුකිරීමේ නියෝජිතයන් පත්කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ. ගෙවීම බලාත්මක කරවා ගැනීම සඳහා නෛතික පියවර ගැනීමට හෝ අවශ්‍ය වුවහොත් නෛතික ගාස්තු ද ඇතුළත්ව මූල්‍ය ගාස්තු සමඟ හිඟ මුදල් එකතු කිරීම සඳහා දරන ලද සියලු පිරිවැය ගෙවීම කාඩ්පත් හිමියා විසින් ගෙවනු ඇත. මෙම කාඩ්පත් ගිණුමෙහි කිසිදු අයිතියක්, ප්‍රතිලාභයක් හෝ බැඳීමක් කිසිදු ලෙසකින් අනුයුක්ත කිරීම හෝ පැවරීම හෝ කාඩ්පත් හිමියා විසින් සිදු නොකළ යුතුය.

26.3 බැංකුව විසින් නියම කරනු ලබන ඕනෑම අවස්ථාවක දී, කාඩ්පත් හිමියා විසින් තමාගේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු බැංකුවට ලබාදිය යුතුය. එසේ සපයන ලද තොරතුරු විමසා බලා තහවුරු කරගැනීම සඳහා කාඩ්පත් හිමියා බැංකුවට තවදුරටත් බලය ලබා දෙන්නේය. එසේ ඉල්ලා සිටීමේ දී බැංකුව වෙත තොරතුරු සපයා නොමැති නම්, බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි කාඩ්පත අලුත්කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ වහාම කාඩ්පත අවලංගු කිරීම කරනු ලැබිය හැකිය.

26.4 බැංකුවේ තැපැල් කිරීම් ආපසු ලැබෙන අවස්ථාවක දී මෙන්ම කාඩ්පත් හිමියා සමග සම්බන්ධවිය නොහැකි වන අවස්ථාවක දී, ඉල්ලුම්පත්‍රයේ සඳහන්කර ඇති වෙනත් ලිපිනයකට කාඩ්පත් හිමියාගේ ප්‍රකාශන සහ/හෝ ලිපි හුවමාරු නැවත යොමුකිරීමේ අයිතිය බැංකුව සතු වේ.

26.5 කාඩ්පත් හිමියාට සම්බන්ධ ගිණුම් තොරතුරු ද ඇතුළුව සියලු තොරතුරු බැංකුවේ යම් බලයලත් තැනැත්තකු, එහි ප්‍රධාන කාර්යාලයේ, ශාඛා කාර්යාලවල යම් බලයලත් තැනැත්තකු සහ බැංකු සමූහයේ වෙනත් යම් සාමාජිකයන්/ආශ්‍රිත සාමාජිකයන් හෝ වෙනත් දත්ත සැකසුම් සේවා සපයන්නකු හෝ ගිණුම් ප්‍රකාශ මුද්‍රණය සහ තැපැල් කිරීම සඳහා බැංකුව විසින් සේවයේ යොදවා ඇති යම් තැනැත්තකු හෝ වෙනත් සමාන සේවා සපයන්නකු විසින් ඔවුන්ගේ අදහස අනුව පරිපාලනය සහ අභ්‍යන්තර නියාමන අවශ්‍යතා ඇතුළුව අවශ්‍ය විය හැකි ඕනෑම කාර්යයක් සඳහා යම් මධ්‍යස්ථානයක දී සම්ප්‍රේෂණය කිරීම සහ/හෝ ගබඩා කිරීම හෝ දැරීම සහ ඒවාට ප්‍රවේශවීම කරනු ලැබිය හැකි බවට කාඩ්පත් හිමියා එකඟ වී පිළිගනු ලබයි.



PUBLIC

**26.6** කාඩ්පත වෙතින් ස්ථාවර උපදෙස්/නියෝග

(a) ස්ථාවර උපදෙස් බැර පොරොන්දු සපුරාලීම සඳහා ඔහුගේ/ඇයගේ කාඩ්පතෙහි ප්‍රමාණවත් අරමුදල් පවත්වාගෙන යෑම සඳහා ද කාඩ්පත් හිමියා එකඟ වන අතර එසේ කිරීමට අපොහොසත් වුවහොත් එවිට කාඩ්පත් හිමියා විසින් භාර දී ඇති ස්ථාවර උපදෙස්/නියෝග පෝරමයේ එකඟ වී ඇති මුදල කාඩ්පතෙන් හරකරනු ලැබිය යුතුය.

**26.7** හබ කර සිටින ගනුදෙනු පිළිබඳ කාඩ්පත් හිමියන්ගේ වගකීම

(කාඩ්පත් හිමියා විසින් හෝ අන්‍යාකාරයකින් සපයනු ලබන) බැංකුවට ලැබෙන සාක්ෂි මත පදනම්ව, කාඩ්පත් හිමියා විසින් ස්වකීය ගිණුම හෝ කාඩ්පත භාවිත කිරීමේ දී (කාඩ්පත, ගිණුම හෝ PIN අංකය ආරක්ෂා කිරීම සහ කාඩ්පත නැතිවීම හෝ අනවසර ගනුදෙනු පිළිබඳ වාර්තා කිරීම ද ඇතුළුව) නොසැලකිලිමත්ව හෝ වංචාසහගත ලෙස ක්‍රියාකර ඇති බව බැංකුවේ මතය වන අවස්ථාවක, කාඩ්පත පිළිබඳව කාඩ්පත් හිමියාගේ වගකීම, කාඩ්පත සම්බන්ධයෙන් සිදුවන යම් අනවසර ගනුදෙනු සඳහා ඉහළ නංවනු ලැබේ.

කාඩ්පත මඟින් සිදුකරන ලද ඇතැම් ගනුදෙනු සහ/හෝ විශේෂිත වෙළෙඳ මහතුන් වෙත දී සිදුකරන ලද ගනුදෙනු සඳහා නිශ්චිත විමර්ශන අවශ්‍ය බවට බැංකුව තීරණය කරනු ලබයි නම් සහ කාඩ්පත් හිමියාගේ ගිණුම් ඉතිහාසය අසතුටුදායක වේ නම් හෝ ගනුදෙනුවල ස්වාභාවය අනුව කාඩ්පත් හිමියා වෙත මුදල් ප්‍රතිපූරණය කිරීම නොකළ යුතු බවට සනාථ කරයි නම් යම් හබකර සිටිනු ලබන ගනුදෙනු සඳහා බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත මුදල් ප්‍රතිපූරණය නොකර සිටින බව කාඩ්පත් හිමියා විසින් පිළිගෙන එකඟ වේ.

**26.8** සහභාගිවන්නාට (කාඩ්පත හරහා) මුදල් හෝ මූල්‍ය වටිනාකමක් දායක කරන ලෙස හෝ ගෙවන ලෙස නියම කරනු ලබන්නා වූ ද සහභාගීවන්නන් උපයනු ලබන ප්‍රතිලාභ විශාල වශයෙන් පහත කරුණු මත රඳා පවත්නා විට එවැනි සැලසුමක් කාඩ්පත් හිමියා විසින් ඍජු ව හෝ වක්‍රව පිරිනැමීම, ප්‍රවර්ධනය කිරීම, ප්‍රචාරණය, මෙහෙයවීම, මුදල් සැපයීම, කළමනාකරණය හෝ යොමු කිරීම නොකළ යුතු වේ:

(a) සැලසුම සඳහා සහභාගිවන්නන්ගේ ප්‍රමාණය වැඩිවීම මත රඳාපවතින්නා වූ ද; හෝ

(b) සැලසුම සඳහා සහභාගිවන්නන්ගේ දායකත්වය වැඩිවීම මත රඳාපවතින්නා වූ ද;

(c) 'මුදල්' යන්නෙන් ශ්‍රී ලංකා හෝ විදේශීය රජයක් විසින් නිකුත් කරන ලද, ඇතිකරන ලද, බලය දෙන ලද හෝ පිළිගන්නා ලද මුදල් ඒකකයක් හෝ හුවමාරු මාධ්‍යයක් අදහස් වේ.

(d) 'මුදල් වටිනාකම' යන්නෙන් යම් ගබඩා කළ හැකි වටිනාකම් ප්‍රභවයක්, ගෙවීම් සාධන පත්‍රයක් හෝ ගිණුමකට බැරකිරීමක් මෙන්ම රන්කාසි සහ රන් සංචිත ද ඇතුළුව මුදල් බවට ආපසු හැරවිය හැකි හෝ හැරවිය නොහැකි යම් හුවමාරු මාධ්‍යයක් අදහස් වේ.

26.9 කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිණුමට වැරදි ලෙස බැංකුව විසින් මුදල් බැරකර ඇති අවස්ථාවක දී, එම සඳහන් කිරීම ප්‍රතිශෝධනය කිරීම සඳහා සහ/හෝ එම මුදල කාඩ්පත් හිමියාගෙන් ඉල්ලා සිටීමට බැංකුවට හිමිකමක් ඇත්තේ ය.

26.10 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු පිළිබඳ පනතේ සහ ඒ හා සම්බන්ධ ආශ්‍රිත මාර්ගෝපදේශ සහ විධාන සහ 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනත ප්‍රකාරව අත්හැර දමන ලද දේපල සම්බන්ධ මාර්ගෝපදේශ සහ විධාන ද ඇතුළුව ඉහත කී 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත්කරන ලද විධාන ද සමග 1988 අංක 30 දරන ශ්‍රී ලංකා බැංකු පනතේ විධිවිධාන මඟින් කාඩ්පත් හිමියා බැඳී සිටියි. ඕනෑම අවස්ථාවක කාඩ්පත් ගිණුමෙහි පවත්නා ශේෂයට අමතරව, එවැනි මුදලින් කාඩ්පත් ගිණුම කාඩ්පත් හිමියා විසින් පූර්ව-පිරවීම නොකළ යුතු වේ.

ඉහත කී ආකාරයට සහ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක ක්‍රියාකාරකම් හා සම්බන්ධ සියලු නීති, විධාන සහ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් වූ එකී විධිවිධානවලට එකඟව බැංකුව නිතරම ක්‍රියාකරනු ලබන බවට කාඩ්පත් හිමියා අවබෝධ කරගෙන එකඟ වේ.

26.11 කාඩ්පත් ගිණුමට පූර්ව-පිරවීම සිදුකිරීම තහනම් බවට කාඩ්පත් හිමියා අවබෝධකරගෙන බැංකුව සමඟ එකඟ වන අතර, කාඩ්පත් ගිණුමෙහි බැර ශේෂයක් පවත්නා අවස්ථාවක දී, බැංකුව විසින්, කාඩ්පත් හිමියාගේ හර ශේෂයක් ඇති වෙනත් ක්‍රෙඩිට් කාඩ්පතකට එකී බැර ශේෂය පැවරීම කිරීම, එකී බැර ශේෂය බැංකුව සමඟ වන කාඩ්පත් හිමියාගේ ශ්‍රී ලංකා රුපියල් ඉතුරුම් හෝ ශ්‍රී ලංකා රුපියල් ජංගම හෝ ගිණුමකට බැර කිරීම හෝ කාඩ්පත් හිමියාගේ නමට අයකැමි නියෝගයක් නිකුත් කිරීම හෝ සිදුකරනු ඇත.

26.12 ශ්‍රී ලංකාව තුළ කිසියම් ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවූ ආයතනයක සියයට දහය (10%) හෝ ඊට වැඩි කොටස් ප්‍රමාණයක් දරන සහ/හෝ අත්පත් කරගත් විට දී කාඩ්පත් හිමියා විසින් ඒ සම්බන්ධයෙන් ලිඛිතව බැංකුව දැනුවත් කළ යුතුය.

**කාඩ්පත් හිමියාගේ තෘප්තිමත් භාවය පිළිබඳ ප්‍රතිචාරය**

**ඔබට සවන්දීම**

HSBC හි අප, කාඩ්පත් හිමියන්ට අවශ්‍ය සැලසුම් හා සේවාවන් සම්බන්ධයෙන් ලෝක තත්ත්වයේ සේවාවක් කාර්යක්ෂමව අපගේ කාඩ්පත් හිමියා/හිමියන් වෙත ලබාදීමට කැප වී සිටිමු.

බැංකුව සපයනු ලබන යම් සේවාවක් සම්බන්ධයෙන් යම් හේතුවක් මත ඔබ පූර්ණ තෘප්තිමත් භාවයට පත් නොවන්නේ නම්, බැංකුවේ ශාඛාවන් හි කාර්ය මණ්ඩලය සමඟ හෝ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය සමඟ සම්බන්ධවීමට කාඩ්පත් හිමියාට හැකියාව ඇත. එවිට, බැංකුව විසින් කාඩ්පත් හිමියා තෘප්තිමත් වන ආකාරයට කාර්යක්ෂමව එකී ගැටලුව විසඳීමට අවශ්‍ය සියලු උත්සාහයන් ගනු ඇත.

කාඩ්පත් හිමියා වෙත සේවාවන් සැපයෙන ආකාරය සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා පූර්ණ වශයෙන් සතුටට පත් නොවේ නම්, හෝ බැංකුවේ සැලසුම් මඟින් කාඩ්පත් හිමියාගේ අපේක්ෂාවන් ඉටු නොවේ නම් පහත දක්වා ඇති ආකාරයන් හරහා සිය ප්‍රතිචාර බැංකුව වෙත එවීමට කාඩ්පත් හිමියාට හැකියාව ඇත.

- මාර්ගගතය හරහා බැංකුවේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk වෙත ප්‍රතිචාරය ඉදිරිපත් කිරීම මඟින්
- කාඩ්පත් හිමියාගේ ගැටලුව පහත තැපැල් ලිපිනය වෙත යැවීමෙන්
  කළමනාකරු පාරිභෝගික අත්දැකීම් හා සබඳතා
  වත්කම් සහ පුද්ගලික බැංකුකරණය
  HSBC මධ්‍යස්ථානය
  අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
  කොළඹ 01
- පහත විද්‍යුත් තැපැල් ලිපිනය මගින් බැංකුව වෙත යැවීමෙන්
  Premier – premiercustomersolutions@hsbc.com.lk
  පොදු - customersolutions@hsbc.com.lk or creditcards@hsbc.com.lk

- බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත යාමෙන් හා ප්‍රධාන කළමනාකරු සමඟ කථා කිරීමෙන් හෝ ශාඛාවන් හි ඇති "ඔබේ අදහස්වලට සවන්දීම" නැමැති පෝරම සම්පූර්ණ කර ඔබේ ප්‍රතිචාර සටහන් කිරීමෙන්.

- සබඳතා කළමනාකරු (සිටී නම්) හෝ බැංකු ශාඛාවේ කාර්ය මණ්ඩලයේ අයෙකු සමඟ සෘජු ව කථා කිරීමෙන්.

**සේවා මට්ටමේ කැපවීම**

කාරණය වහාම විසඳිය නොහැකි නම්, ප්‍රතිචාර පෝරමය කාඩ්පත් හිමියා වෙතින් ලැබී වැඩකරන දින තුනක් ඇතුළත බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත විසඳුමක් ලබාදෙනු ඇත. ස්වාභාවයෙන් වඩා සංකීර්ණ ගැටලු සම්බන්ධයෙන් වනවිට ඒවා විසඳීම සඳහා වැඩි කාලයක් ගතවන බැවින්, ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් තක්සේරු කරනු ලබන කාලසීමාවක් කාඩ්පත් හිමියා වෙත ලබාදෙනු ඇත.

මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා වෙත ලිවීමෙන් ද කාඩ්පත් හිමියා හට සහන ඉල්ලා සිටිය හැකිය.

2002 අප්‍රේල් මස ආරම්භ කරන ලද මූල්‍ය ආශයේ ප්‍රතිසංස්කරණ පැකේජයේ එක් කොටසක් වශයෙන් ස්ථාපිත කරන ලද මූල්‍ය සේවා ඔම්බුඩ්ස්මාන් කාර්යාලය යනු ස්වාධීන, අපක්ෂපාතී සහ නොමිලේ සේවාවකි.

ඔම්බුඩ්ස්මන් වරයාගේ ඇමතුම් තොරතුරු පහත දැක්වේ.
ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය
143A, වජිර පාර
කොළඹ 5.

දුරකථන- +94 112 595 624
ෆැක්ස්- +94 112 595 625
විද්‍යුත් තැපැල- fosril@sltnet.lk
වෙබ්අඩවිය- www.financialombudsman.lk

මෙම නීතිරීති හා කොන්දේසිවල සිංහල සහ දමිළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට ඉංග්‍රිසි භාෂා පාඨය බලපැවැත්විය යුතු බවට මා/අප විසින් මෙයින් සහතික වී එකඟව සිටිමි/සිටිමු.